දෙසතිය

පුවත් සඟරාව

2025 සැප්තැම්බර්

අපේ බෙහෙත්

ගිනස් පොතේ අකුසාවා

ජපන් ජාතික 102 හැවිරිදි (1923 වසරේදී උපත ලැබූ) කොකිචි අකුසාවා විසින් නොබෝද (අගෝස්තු 5 දින) නව ගිනස් ලෝක වාර්තාවක් පිහිටුවනු ලැබුවා. ඒ, යොෂිඩා මංපෙත ඔස්සේ දින තුනකින් මීටර් 3,776ක් උස ජපානයේ ෆුජි කන්ද තරණය කළ ලොව වයස්ගතම පිරිමි පුද්ගලයා ලෙස.

ඔහු විශ්‍රාමික ගොවියෙක්. ගුන්මා ප්‍රාන්තයේ කඳු නගින්නන්ගේ සමාජයේ සභාපතිවරයා ද වන අකුසාවා විනෝදාංශයක් ලෙස කඳු නගින්නෙක්. එසේ ම වැඩිහිටි සත්කාරක මධ්‍යස්ථානයක ස්වේච්ඡා සේවකයකු ද වන ඔහු චිත්‍ර ගුරුවරයකු ද වනවා.

අකුසාවා මේ ගමන සම්පූර්ණ කළේ වැටීම් සහ හෘදයාබාධ තත්ත්ව අතරතුර වීම විශේෂත්වයක්. ඔහුගේ 75 හැවිරිදි දියණිය යුකිකෝගේත් හෙද මිණිබිරියගේත් අනෙකුත් සංචාරක සගයන්ගේත් සහාය ඔහු ධෛර්යමත් කළා.

නැවත ෆුජි කන්ද තරණය කිරීමට තමන් අදහස් කරන්නේ නැති බව අකුසාවා පවසා තිබෙනවා.

කටු

දෙසතිය

පුවත් සඟරාව

වෙළුම 47, කලාපය 09,
2025 සැප්තැම්බර්

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

සංස්කාරක මණ්ඩලය
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2514150

උපදේශක සංස්කාරක
එච්. එස්. කේ. ජේ. බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
ඩබ්. එම්. ශාන්තප්‍රිය

සංස්කාරක
මාලා මල්කාන්ති පරණගමගේ

රූ රටා සංස්කාරක
සංජීව පෙත්තාවඩු

විශේෂාංග ලේඛක
රංගිකා අබේසේකර

ඡායාරූප
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය

මුද්‍රණය
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ප්‍රකාශනය හා බෙදාහැරීම
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

හිතවත් පාඨකයිනි,

47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

සංස්කාරක

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

මෙවර කවරයේ කතාව සම්බන්ධීකරණය කළේ
දීප්ති විජේතුංග
මාධ්‍ය ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

කවරයේ කතාව



19 අපේ බෙහෙත්

15 නොබෙල් සාම තෑග්ග ඩොනල්ඩ් ට්‍රම්ප්ට ද?

03 කලාපීය හවුල්කාරිත්වය

33 ක්ලැරන්ස්

06 ගඟේ ගිය කිරි කඳුළ

40 ක්‍රීඩාව, ජාතික ප්‍රමුඛතා හා ප්‍රතිපත්තිය

සහිත බව ඇවැසි කාලයයි

කාව්‍ය ශාස්ත්‍ර විනෝදේන - කාලෝ ගච්චති ධීමතඃ
ව්‍යසනේනච මූර්ඛානම් - නිද්‍රයා කාලහේනවා...

"පණ්ඩිත වියතුන් සාහිත්‍ය, කාව්‍ය ශාස්ත්‍රය සහ කලාව සමග විනෝදයෙන් කාලය ගතකරනවා මෙන් ම මෝඩයන්, නූගතුන් කලහ කිරීමෙන් සහ නිදා ගැනීමෙන් කල් ගෙවන්නේ ය" යනුවෙන් සඳහන් වන්නේ ප්‍රත්‍ය ශතකයේ. කලාව, සාහිත්‍යය ජීවිතයට කරන බලපෑම ගැන කියවා ගැනීමට මේ පඬි වදන ප්‍රමාණවත්. එනම් මානව හැසිරීම්වල තීරණාත්මක සාධකයක් බවට කලාව, සාහිත්‍යය ඇසුරු කිරීම පත් ව තිබෙනවා.

මේ අනුව සාහිත්‍යය ඇසුරෙහි කල් ගෙවන්නා සාහිත්‍ය කෘතිවලින් ලබන ආභාසය ඔස්සේ යහපත් සමාජයක් ගොඩනගන්නට මැදිහත්වනවාට සැකයක් නැහැ. එසේ ම සමාජයේ සිදුවන අපචාර, දූෂණ, වංචා වැනි පරිහාණිය ක්‍රියා මතුවීමට සාහිත්‍ය පරිශීලනයෙන් ඈත් වීම ප්‍රබල හේතුවක්. මේ නිසා කලාව, සාහිත්‍යය කෙරෙහි සමාජයේ වැඩි නැඹුරුවක් ඇති කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවක්.

ඇතැමුන් පවසන්නේ සාහිත්‍ය මාසයක් නම් කිරීමෙන් සාහිත්‍යයට යම් ප්‍රබෝධයක් ඇති වන බව. පොත් වසන්තය ලෙස සැලකෙන 'සාහිත්‍ය මාසය' සැප්තැම්බර් මාසයට යෙදී තිබෙන පසුබිමක යම් තරමකට හෝ පත පොත මිල දී ගැනීමට හා කියවීමට ළමා, තරුණ, වැඩිහිටි වයස් භේදයකින් තොර ව පිරිස් යොමු ව තිබීම සැබවින් ම යහපත් තත්ත්වයක්. කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය ඊට සානුබල සපයන්නේ ඍජු ව ම. එසේ ම සාහිත්‍ය සම්මන්ත්‍රණ, සංවාද, සාකච්ඡා පවත්වමින් වෙනදාට වඩා සමාජයේ උනන්දුවක් ද ඊට දක්වන බව පෙනෙනවා. අනෙක් අතට හතු පිපෙන්නාක් මෙන් පොත් ප්‍රකාශයට පත්වන සමයක් 'සාහිත්‍ය මාසය'.

එහෙත් එයින් සමාජයේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති වන්නේ යැයි තහවුරුවක් ලබාගත නොහැකි වන්නේ පොත් මිලදී ගත්තත් බහුතර පිරිසක් ඩිජිටල් තිරය මත කාලය කා දැමීමට හුරු වී ඇති සෙයක් දක්නට ලැබෙන නිසා. වර්තමානයේ ඩිජිටල් තිරයෙන් වුව ද සාහිත්‍ය පරිශීලනය කළ හැකි පහසුකම් තිබෙනවා යැයි යමෙකුට තර්ක කළ හැකියි. එහෙත් භෞතික ව පොතපත කියවීමෙන් ලැබෙන ආස්වාදය, ප්‍රතිඵල ඉන් ලැබෙතැයි අනුමාන කරන්නට බැහැ.

අනවරත අරගලයක යෙදෙමින් හැල්මේ දුවන මිනිසුන් වෙසෙන සමාජයක ඔවුන්ට සාහිත්‍ය පරිශීලනය කරන්නැයි කොතෙකුත් ආයාචනා කළ ද එය නිෂ්ඵල ක්‍රියාවක් බවටයි පත් ව තිබෙන්නේ. පවතින සමාජ, ආර්ථික, දේශපාලන සන්දර්භය තුළ කාර්යබහුල ජීවන රටාව විසින් ඔවුන් යාන්ත්‍රික මිනිසුන් බවට පත් කරනු ලැබ ඇතිවාක් මෙන් ම තාක්ෂණික දියුණුවත් සමඟ ඩිජිටල්කරණය වූ ලෝකයේ සාහිත්‍ය පොතපත ඇසුරු කරන්නට තරම් කාලයක් ඔවුන්ට නැහැ. පවතින තරගකාරී අධ්‍යාපන රටාවේ විශේෂයෙන් දරුවන් තුළ සාහිත්‍යකාමී අදහස් වපුරන්නේ කෙසේද යන්න ඇතැමුන් නගන ප්‍රශ්නයක්. මේ නිසා ම දරුවන් පොතපතින් ඈත් වී විභාග කඩයිම් ජයගන්නට දරන වෙහෙස අපමණයි. එබැවින් සාහිත්‍ය පරිශීලනයෙන් පුද්ගලයා තුළ සංවේදනාත්මක අදහස් ගොඩනැගෙන්නට සුදුසු පරිසරයක් නොමැති බවට විවාදයක් නැහැ.

කෙසේ වෙතත් මානව දයාවෙන් පිරුණු සොඳුරු මිනිසුන් බිහි නොවනතාක් සමාජය ගමන් කරනු ඇත්තේ පරිහාණිය යුගයකට. මේ නිසා එවැනි පිරිපුන් මිනිසුන් බිහි කරන සාහිත්‍යයේ, කලාවේ පහස ලබන්නට කුඩා වියේ පටන් දරුවන්ට වටපිටාව සැකසීම අදාළ පාර්ශ්වවල යුතුකමක් හා වගකීමක්. මේ ඊට කාලයයි.

මාලා මල්කාන්ති රණමෙගේ

\- සංස්කාරක -

දෙසතිය
පුවත් සඟරාව

දෙසතිය සඟරා දායකත්වය

වාර්ෂික දායකත්වය රු. 1680.00
අර්ධ වාර්ෂික දායකත්වය රු. 840.00

මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදාළ බැංකු බැරපත හා සඟරා දායකත්ව කූපන්පත 071-9303111 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

මුදල් ඇණවුම් එවීමේදී

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න.   විමසීම් - 0112512759

දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ....
Address ....
....
....
....
ID Number .... Tel / Mobile ....
Signature .... Date ....

කලාපීය හවුල්කාරිත්වය

චන්දන මාරසිංහ

"අපගේ ඉතිහාසය සාක්ෂි දරන පරිදි අපගේ පුරාවෘත්ත එකිනෙකට බැඳී පවතින අතර අප ශතවර්ෂ ගණනාවක් පැරණි මිත්‍රත්වයක් බෙදා ගන්නෙමු. දශක හයකට පෙර දෙරට අතර විධිමත් රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීමත් සමඟ එම සමීප බැඳීම් තවදුරටත් වර්ධනය විය. 1965 ජූලි 26 දින නිදහස ලැබීමෙන් පසු මාලදිවයින රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිට වූ පළමු රටවල් අතර ශ්‍රී ලංකාව ද විය. අප නිදහස ලබා වසර 60ක් සපිරීමත් සමඟ ම අන්‍යෝන්‍ය ගෞරවය සහ පොදු අභිලාෂයන් මත පදනම් වූ ස්ථිරසාර සහ කාලීන මිත්‍රත්වයට වසර 60ක් සපිරීම ද මෙසේ සමරමු."

මෙලෙසින් මාලදිවයින් ජනාධිපති ආචාර්ය මොහොමද් මුයිසු විසින් ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක ආමන්ත්‍රණය කෙරුණේ ඔහු 2025 ජූලි 28 සිට ජූලි 30 දක්වා මාලදිවයිනේ සිදු කළ රාජ්‍ය සංචාරය අතරතුරදී.

ද්විපාර්ශ්වික සම්බන්ධතා ශක්තිමත් කරමින් මේ සංචාරය ඇරඹුණේ වෙලානා ජාත්‍යන්තර ගුවන්තොටුපොළේදී (Velana International Airport) මාලදිවයින් ජාතික ආරක්ෂක බලකා උත්තමාචාර මධ්‍යයේ මාලදිවයින් ජනාධිපති ආචාර්ය මොහමද් මුයිසු විසින් ශ්‍රී ලංකා ජනාධිපතිවරයා පිළිගනු ලැබීමෙන්. ඉන්පසු එම සංචාරයේ නිල උත්සවය පැවැත්වූයේ මාලදිවයිනේ අගනුවර වන මාලේහි ජනරජ චතුරස්‍රයේදී එරට ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන්.

මේ සංචාරයේ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වුණේ මාලදිවයින් ජනාධිපති කාර්යාලයේදී. මේ සාකච්ඡාවලදී අවධානය යොමු ව ඇත්තේ වෙළෙඳාම, ආරක්ෂාව, අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව, ක්‍රීඩා, පරිසර, ධීවර කර්මාන්තය හා කෘෂිකර්මය ඇතුළු විවිධ ක්ෂේත්‍ර පිළිබඳ ව. ආර්ථික අභියෝගවලට ලක් වූ ශ්‍රී ලංකාව මේ වන විට ලබා

ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක අදහස් දක්වමින්

මාලදිවයින් ජනාධිපති ආචාර්ය මොහමද් මුයිසු අදහස් දක්වමින්

> 1965 ජූලි 26 දින නිදහස ලැබීමෙන් පසු මාලදිවයින රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිට වූ පළමු රටවල් අතර ශ්‍රී ලංකාව ද විය. අප නිදහස ලබා වසර 60ක් සපිරීමත් සමඟ ම අන්‍යෝන්‍ය ගෞරවය සහ පොදු අභිලාෂයන් මත පදනම් වූ ස්ථිරසාර සහ කාලීන මිත්‍රත්වයට වසර 60ක් සපිරීම ද මෙසේ සමරමු.

ඇති ප්‍රගතිය පිළිබඳ ව මාලදිවයින් ජනාධිපතිවරයා ශ්‍රී ලංකා ජනාධිපතිවරයාට ප්‍රශංසාව පළ කළා.

එම සාකච්ඡාවලින් අනතුරු ව ගිවිසුම් හුවමාරු කර ගැනීමට ද දෙපාර්ශ්වය එක් වුණා. එහිදී අන්‍යොන්‍ය නීති ආධාර ගිවිසුමක් මාලදිවයිනේ විදේශ සේවා ආයතනය හා බණ්ඩාරනායක රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය අතර ඇති වුණා. දෙරටේ රාජ්‍යතාන්ත්‍රිකයන් පුහුණු කිරීම සහ ලේඛන හුවමාරුව ද එම ගිවිසුමට ඇතුළත්. දෙරටේ ජනාධිපතිවරුන් මාධ්‍ය වෙත සිය ප්‍රකාශ ලබා දුන්නේ ඉන් අනතුරුව. දෙරට අතර සම්බන්ධතා වර්ධනය කර ගන්නා ආකාරය පිළිබඳ ව එහිදී විශේෂයෙන් සඳහන් වුණා. ශ්‍රී ලංකාව හා මාලදිවයින අතර විධිමත් රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා ඇති කර ගැනීමේ 60 වැනි සංවත්සරය වෙනුවෙනුයි මේ සංචාරය සංවිධාන කර තිබුණේ. අනාගතයේදී දෙරටට වැදගත් වන ක්ෂේත්‍රවල සහයෝගිතාව ශක්තිමත් කළ හැකි ආකාරය පිළිබඳ ව ද්විපාර්ශ්වික සාකච්ඡාවලදී අදහස් හුවමාරු වූ බව ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සිය ප්‍රකාශයේදී සඳහන් කළා. දෙරටේ ම ජනතාවගේ පොදු යහපත සඳහා සම්බන්ධතා ශක්තිමත් කරගත යුතු බවයි ශ්‍රී ලංකා ජනාධිපතිවරයා එහිදී සඳහන් කළේ.

කුරුම්බා මෝල්ඩියුස් නිවාඩු නිකේතනයේදී මාලදිවයින් ජනාධිපතිවරයා පිරිනැමූ විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහයට ද ශ්‍රී ලංකා ජනාධිපතිවරයා එක් වූ අතර එහිදී අනුර කුමාර දිසානායක සඳහන් කළේ ශ්‍රී ලංකාව හා මාලදිවයින පොදු දැක්මක් හා පොදු අරමුණකින් එක්සත් වූ හවුල්කරුවන් ලෙස ප්‍රගමනය කරා ගමන් කරනු ඇති බව.

> ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ මේ සංචාරයේදී තවත් වැදගත් තීරණයකට එළඹ තිබෙනවා. ඒ, සංචාරය සඳහා මාලදිවයිනට පිටත් ව යන ශ්‍රී ලාංකික පුරවැසියන්ට නොමිලේ දින 90ක් සඳහා on Arrival සංචාරක වීසා බලපත්‍ර නිකුත් කිරීමට මාලදිවයින් රජය තීරණය කිරීම. එය 2025 ජුලි 29 දින සිට ක්‍රියාත්මක වන අතර එම වීසා ලබා ගැනීම සඳහා වලංගු විදේශ ගමන් බලපත්‍රයක් තිබීම සහ මාලදිවයිනේ රැඳී සිටින කාලයේ සිය වියදම් සඳහා ප්‍රමාණවත් මුදල් තමන් සතු බවට සනාථ කළ යුතුයි.

එසේ ම ඔහු සඳහන් කළේ "1965 වසරේදී මාලදිවයින නිදහස ලබා ගැනීම, දකුණු ආසියානු ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරනවා. මාලදිවයින් නිදහස් ප්‍රකාශනයට අත්සන් තැබීම ලංකාවේදී සිදු කිරීමට අවස්ථාව සලසා දීමෙන් එම ඓතිහාසික ක්‍රියාවලියේ වැදගත් කාර්යභාරයක් ඉටු කිරීම පිළිබඳ ශ්‍රී ලංකාව අභිමානයට පත් වෙනවා. එමෙන් ම කීර්තිමත් ශ්‍රී ලාංකික ගාන්ධර්ව දිවංගත පණ්ඩිත් ඩබ්ලිව්.ඩී. අමරදේව සූරීන් විසින් නිදහස් මාලදිවයිනේ ජාතික ගීයේ තනු නිර්මාණය කරනු ලැබීම අපගේ ආඩම්බරයට හේතු වෙනවා. අපේ හවුල්කාරිත්වය කලාපීය අසල්වැසි රාජ්‍ය අතර සහයෝගිතාවේ පිළිබිඹුවක් බව මා තරයේ විශ්වාස කරනවා. සමුද්‍රීය ආරක්ෂාව ශක්තිමත් කිරීම හෝ නීල ආර්ථික මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම හෝ වේවා බහුපාර්ශ්වීය සංසදවල සහයෝගයෙන් කටයුතු කිරීම හෝ වේවා ඒ කවර ආකාරයෙන් වුව ද සාමකාමී, සමෘද්ධිමත් සහ තිරසර ඉන්දියානු සාගර කලාපයක් නිර්මාණය කිරීම සඳහා මාලදිවයින සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටිනවා." යනුවෙන්.

ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ මේ සංචාරයේදී තවත් වැදගත් තීරණයකට එළඹ තිබෙනවා. ඒ, සංචාරය සඳහා මාලදිවයිනට පිටත් ව යන ශ්‍රී ලාංකික

ගිවිසුම්ගත වූ මොහොත

ව්‍යාපාරික හමුව

පුරවැසියන්ට නොමිලේ දින 90ක් සඳහා **on Arrival** සංචාරක වීසා බලපත්‍ර නිකුත් කිරීමට මාලදිවයින් රජය තීරණය කිරීම. එය 2025 ජූලි 29 දින සිට ක්‍රියාත්මක වන අතර එම වීසා ලබා ගැනීම සඳහා වලංගු විදේශ ගමන් බලපත්‍රයක් තිබීම සහ මාලදිවයිනේ රැඳී සිටින කාලයේ සිය වියදම් සඳහා ප්‍රමාණවත් මුදල් තමන් සතු බවට සනාථ කළ යුතුයි. දෙරට අතර අන්‍යෝන්‍ය සහයෝගිතාව පදනම් කරගෙනයි මේ තීරණයට මාලදිවයින් රජය එළඹුණේ. ශ්‍රී ලංකාවට මාලදිවයින දක්වන ඉහළ ප්‍රමුඛතාව ද ඉන් පැහැදිලි වනවා. ශ්‍රී ලංකාව හා මාලදිවයින අතර 60 වැනි සංවත්සරය සැමරීම වෙනුවෙන් ජනාධිපති අනුර කුමාර දිසනායක පැළයක් ද රෝපණය කළා. ඒ, මාලේ අගනුවර පිහිටි සුල්තාන් උද්‍යානයේදී.

මාලදිවයිනේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය සහ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ශ්‍රී ලංකා මාලදිවයින් ව්‍යාපාරික කවුන්සලය එක් ව එය සංවිධාන කළ මාලදිවයින් ව්‍යාපාරික සංසදය ඇමතීමට ද (ජූලි 30) ශ්‍රී ලංකා ජනාධිපතිවරයා එක් වුණා. මෙහි අරමුණ වුණේ ශ්‍රී ලංකාව යනු ආයෝජන, වෙළෙඳ සහ සංචාරක කර්මාන්තවල ආයෝජනය සඳහා ඉහළ විභවතාවක් සහිත රටක් බව පෙන්වා දීම. ශ්‍රී ලාංකිකයන්ට මාලදිවයිනේ රැකියා ලබාදීම ගැන ස්තුතිය පළ කළ ශ්‍රී ලංකා ජනාධිපතිවරයා එරට ව්‍යාපාරිකයන්ට ඇරයුම් කළේ ශ්‍රී ලංකාවේ ආයෝජනය සඳහා.

එම ව්‍යාපාරික ප්‍රජාව අමතමින් ඔහු පැවසුවේ ශ්‍රී ලංකාව ආර්ථික ස්ථාවරත්වය ළඟා කරගෙන ඇති අතර වර්තමානයේ ආයෝජන සඳහා හිතකර තත්ත්වයක් එහි පවතින බව. 2025 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 5%ක් අපේක්ෂා කරන බැවින් රටේ මේ වන විට දේශපාලන ස්ථාවරත්වයක් පවතින බවත් වංචා, දූෂණ හා අක්‍රමිකතාවලින් තොර සමාජයක් ගොඩ නැගෙමින් ඇති බවත් ජනාධිපතිවරයා පෙන්වා දුන්නා. එහිදී අවධාරණය කෙරුණේ සංචාරක කර්මාන්තය, ආහාර සැකසුම්, ධීවර කර්මාන්තය, දේපළ වෙළෙඳාම හා තොරතුරු තාක්ෂණය වැනි ක්ෂේත්‍රවල පවතින ආයෝජන අවස්ථා පිළිබඳ ව. 2025 වසරේදී සංචාරකයන් මිලියන 03ක් ගෙන්වා ගැනීමයි ශ්‍රී ලංකාවේ සැලසුම. ඒ අනුව නව හෝටල් ව්‍යාපෘති වැනි අවස්ථා සඳහා ආයෝජනය කිරීමට මාලදිවයින් ව්‍යාපාරිකයන්ට අවස්ථාව පවතිනවා.

මාලදිවයිනේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව හමුවීමට ද ශ්‍රී ලංකා ජනාධිපතිවරයා අමතක කළේ නැහැ. මාලදිවයිනේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයයි එම හමුව සංවිධාන කළේ. නව දේශපාලන සංස්කෘතියක් ඇති කිරීම මෙන් ම ආර්ථිකය නගා සිටුවීමට රජය ප්‍රමුඛතාව ලබා දී ඇති බව ජනාධිපතිවරයා එහිදී සඳහන් කළා. දූෂිත දේශපාලන ක්‍රමය වෙනුවට නව දේශපාලන සංස්කෘතියක් රටේ බිහිවී ඇති බවත් සැම දෙනාට ම එක හා සමාන ව ක්‍රියාත්මක වන නීතියක් රටේ සක්‍රීය කර ඇති බවත් ජනාධිපතිවරයා පෙන්වා දුන්නා. ශ්‍රී ලංකාවේ වත්මන් තත්ත්වය හා මාලදිවයිනේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් මුහුණ දී ඇති ගැටලු පිළිබඳ ව ද එම සාකච්ඡාවේදී අවධානය යොමු වූ අතර ඔවුන්ගේ ප්‍රශ්නවලට ද ජනාධිපතිවරයා පිළිතුරු ලබා දුන්නා.

විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහයට එක් රාජ්‍යතාන්ත්‍රිකයන්

මාලදිවයිනේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව හමුවීමට ද ශ්‍රී ලංකා ජනාධිපතිවරයා අමතක කළේ නැහැ. මාලදිවයිනේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයයි එම හමුව සංවිධාන කළේ. නව දේශපාලන සංස්කෘතියක් ඇති කිරීම මෙන් ම ආර්ථිකය නගා සිටුවීමට රජය ප්‍රමුඛතාව ලබා දී ඇති බව ජනාධිපතිවරයා එහිදී සඳහන් කළා.

මේ සංචාරයේදී එරට ජනාධිපතිවරයා ඇතුළු රජයේ නියෝජිතයන් සමඟ ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ද්විපාර්ශ්වික, කලාපීය මෙන් ම ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන කාරණා සම්බන්ධයෙන් සිදු කළ සාකච්ඡා අනාගත සහයෝගිතාව සඳහා අවශ්‍ය පදනම සකස් කරනු ඇති. ව්‍යාපාරික හමුව වැදගත් වන්නේ මෙරට ආයෝජන සඳහා එය ඉවහල් වන බැවින්. දෙරට අතර දේශපාලනික බැඳීම වැදගත් වනු ඇත්තේ විශ්වාසය මෙන් ම ජනතාව අතර සම්බන්ධතා ඇති කිරීමට. අසල්වැසියන් සමග සමීප මිත්‍රත්වය වර්ධනය කර ගැනීමෙන් ජාත්‍යන්තරයේ ශක්තිමත් ව නැගී සිටීමේ හැකියාව පවතිනවා. එබැවින් මෙවැනි සාර්ථක විදේශ සම්බන්ධතා පවත්වා ගැනීම රටකට ඉතා වැදගත්.

ගඟේ ගිය කිරි කඳුළ

රංගිකා අබේසේකර

ශ්‍රී ලංකාවේ බොහෝ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ ජනතා බදු මුදලින්. රටේ සංවර්ධනයත් ජනතාවට ප්‍රතිලාභත් එයින් අපේක්ෂා කරනවා. එසේ නොවුණු විට එය සැලකිය හැක්කේ ජාතික ධනය විනාශ වී යෑමක් මෙන් ම ජාතික ආර්ථිකයට ලැබිය යුතු වාසිදායක තත්ත්වයක් මගහැරී යාමක් ලෙස. එවැනි අසාර්ථක ව්‍යාපෘති කාර්යයක් නොබෝද නිරීක්ෂණයට අවස්ථාව ලැබුණා. ඒ, මිල්කෝ (පුද්) සමාගම යටතේ 2015 වසරේදී ආරම්භ කිරීමට නියමිත ව තිබූ සහ 2019 වසරේ වැඩ නිම කිරීමට නියමිත ව තිබූ කිරි ලීටර ලක්ෂ 2ක දෛනික ධාරිතාවක් සහිත ජාතික වශයෙන් වැදගත්කමකින් යුතු බඩල්ගම කිරි නිෂ්පාදන කර්මාන්ත ශාලාව.

2022 වසර වන විට මේ කර්මාන්ත ශාලාවේ 95%ක ඉදිකිරීම් සහ යන්ත්‍රසූත්‍ර සවිකිරීම අවසන් කර තිබුණත් එම වසරේ අප්‍රේල් මස 12 දිනෙන් පසු කර්මාන්ත ශාලාවේ සියලු කාර්ය නවතා තිබෙනවා. ඒ හේතුවෙන් මෙතෙක් කර්මාන්ත ශාලාවෙන් කිරි බිඳුවක්වත් නිෂ්පාදනයට අවකාශය ලැබී නැහැ.

මෙවැනි පසුබිමක එම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට රජයේ අවධානය යොමු වී තිබෙනවා. ඒ අනුව පූර්ණ රාජ්‍ය සමාගමක් වන මිල්කෝ (පුද්) සමාගමේ නව අධ්‍යක්ෂ මණ්ඩලයේත් එකඟතාවෙන් පස් අවුරුදු සැලසුමකින් යුතු ව බඩල්ගම කිරි කර්මාන්ත ශාලාව නැවතත් ක්‍රියාත්මක මට්ටමට ගෙන ඒමටයි රජයේ සැලසුම.

ශ්‍රී ලංකාවේ දෛනික කිරි පරිභෝජන අවශ්‍යතාවෙන් 1/3ක් (කිරි ලීටර ලක්ෂ 10ක්) පමණයි මෙරට නිෂ්පාදනය වන්නේ. ඒ අනුව මෙරට කිරි අවශ්‍යතාව ප්‍රධාන වශයෙන් සපුරා ගන්නේ ආනයනික කිරිපිටිවලින්. ඒ සඳහා වසරකට වැය වන මුදල දළ වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 88ක්. දේශීය ව නිෂ්පාදනය කළ හැකි දියර කිරි (Pasteurized Milk, Ultra High heat Treatment Milk) ධාරිතාව සීමිත බවයි මිල්කෝ (පුද්) සමාගමේ සභාපති හේමජීව ගෝඨාභය සඳහන් කරන්නේ. එහෙත් මේ කර්මාන්තශාලාව ආරම්භ කිරීමෙන් දියර කිරි නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමටත් ඒ අනුව කිරිපිටි ඉල්ලුම අවම කිරීමටත් අවකාශය හිමි වනු ඇති බව සභාපතිවරයා අවධාරණය කරනවා.

මෙරට පරිභෝජනයට දෛනික ව නිෂ්පාදනය වන කිරි ලීටර ලක්ෂ 10 සමාගම් 28ක් අතරේ බෙදී යනවා. ඒ පිළිබඳ ව අදහස් දක්වන මිල්කෝ (පුද්) සමාගමේ සභාපති හේමජීව ගෝඨාභය; "දැනට පවතින කිරි ප්‍රමාණයට අතිරේක ව කිරි ලීටර ලක්ෂ 2ක් අප ආයතනය දෛනික ව එකතු කර ගන්නවා. එය විශාල අභියෝගයක්. නව රජය, 2026 වසර අවසන් වීමට පෙර මෙරට කිරි නිෂ්පාදනය වර්ධනය කිරීමට පස් අවුරුදු සැලැස්මක් සකස් කළා. ඊට අනුව දෛනික ව කිරි ලීටර ලක්ෂ 30ක් දක්වා වැඩි කිරීමයි ඉලක්කය. ඒ සඳහා 'Dairy Hub' ව්‍යාපෘතිය ආරම්භ කළා. ඒ සැලසුම සාර්ථක කර ගැනීමයි අපගේ අභිප්‍රාය".

බඩල්ගම කර්මාන්ත ශාලාවේ පහසුකම් පවතින්නේ දෛනික ව පැස්ටරීකරණය කළ කිරි (Pasteurized Milk) ලීටර 60,000ක් සහ අධිතාප ප්‍රතිකාරිත කිරි (Ultra High heat Treatment Milk) විවිධ ප්‍රමාණවලින් යුක්ත ව ටෙට්‍රා ඇසුරුම් (Tetra Pack) ලෙස වෙළෙඳ පොළට නිකුත් කිරීමේ ශක්‍යතාවකින්. ඒ අනුව ලීටර 1, මිලිලීටර 250 සහ මිලිලීටර් 180 ඇසුරුම් ප්‍රමාණ 3කින් සමන්විත ව ලීටර 70,000ක UHT දියර කිරි නිෂ්පාදනය කිරීමේ හැකියාවක් එහි තිබෙනවා. ඊට අමතර ව මුදවපු කිරි, පැයකට ලීටර් 30,000කින් යෝගට් 20,000ක් නිෂ්පාදනය, ලීටර 25,000කින් විවිධාකාර ප්‍රමාණවලින් යුත් අයිස්ක්‍රීම්, ලීටර 10,000කින් පානය කළ හැකි යෝගට් සහ චීස් කිලෝග්‍රෑම් 2,000කට වඩා වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත කර්මාන්ත ශාලාවක් ලෙසයි මෙය සැලසුම් කර තිබෙන්නේ.

හේමජීව ගෝඨාභය
සභාපති
මිල්කෝ (පුද්) සමාගම

බඩල්ගම කර්මාන්ත ශාලාවේ වර්තමාන තත්ත්වය පැහැදිලි කරන මිල්කෝ (පුද්) සමාගමේ සභාපති හේමජීව ගෝඨාභය; "මේ කර්මාන්ත ශාලාවේ වැඩ 2022

අප්‍රේල් 12න් පසු අකර්මණ්‍ය වී තිබෙනවා. එතැන් සිට මේ දක්වා කැලෑවෙන් වැසී ගිය භූමියක් ලෙසයි මේ පරිශ්‍රය දැක ගත හැකි වන්නේ. කර්මාන්ත ශාලාවේ ධාරිතාව කිරි ලීටර ලක්ෂ 2ක්. එහෙත් එය කිරි ලීටර ලක්ෂ 4ක් දක්වා වැඩිකර ගැනීමේ හැකියාව සහිතවයි සැලසුම් කර ඇත්තේ. මේ වන විට කර්මාන්ත ශාලා භූමියේ ස්ථාපිත කර ඇති ඇතැම් යන්ත්‍රසූත්‍ර සහ ඒවාට අයත් විදුලි රැහැන් මීයන්, වේයන් වැනි සතුන් විනාශ කර තිබෙනවා. මෙලෙස කිරි බිඳුවක්වත් නිෂ්පාදනය නොකරයි යන්ත්‍රසූත්‍ර සඳහා ලබාදී තිබූ වගකීම් කාලය අවසන් ව ඇත්තේ. යන්ත්‍රවල විශාල හානි සිදු ව ඇත්නම් නැවත රටේ ජනතාවගේ බදු මුදලින් ප්‍රතිසංස්කරණය කිරීමටයි අපට සිදුවන්නේ. දළ වශයෙන් 175-200 අතර සංඛ්‍යාවකට මේ කර්මාන්ත ශාලාව ආශ්‍රිත ව රැකියා උත්පාදනය කිරීමේ හැකියාව තිබෙනවා”.

වසර 3කට පෙර ස්ථාපිත කළ යන්ත්‍ර සූත්‍රවල තත්ත්වය සහ නැවත ක්‍රියාත්මක මට්ටමට ගෙන ඒමට අමතර වියදමක් දැරීමටයි සිදුවනු ඇත්තේ. යන්ත්‍රවලට කුමන හෝ බලපෑමක් සිදු ව තිබුණොත් ඒවා ප්‍රතිස්ථාපනයට ද නැවත මුදල් යෙදවීමට සිදු වනවා. මේ පිළිබඳ ව විමර්ශන සිදු කරමින් පවතින බවත් ඩෙන්මාර්ක් Desmi Contracting A/S කොන්ත්‍රාත් සමාගම සහ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය සමඟ ඒකාබද්ධ ව විගණනයක් සිදුකර වියදම තක්සේරු කිරීමට අපේක්ෂා කරන බවත් මිල්කෝ (පුද්) සමාගමේ සභාපතිවරයා සඳහන් කරනවා. බඩල්ගම කිරි නිෂ්පාදන කර්මාන්ත ශාලාවේ මූලික ඇස්තමේන්තුගත වියදම වන්නේ යුරෝ මිලියන 63.9ක්. මේ මුදල, මිල්කෝ (පුද්) සමාගම වෙනුවෙන් HSBC බැංකුවෙන් ශ්‍රී ලංකා රජය ණය මුදලක් ලෙසයි ලබාගෙන ඇත්තේ. කිරි බිඳුවක්වත් නිෂ්පාදනය නොවූ මේ කර්මාන්ත ශාලාව සඳහා ශ්‍රී ලංකා රජය මේ දක්වා ගෙවා ඇති මුදල දළ වශයෙන් බිලියන 18ක්.

සභාපති හේමජීව ගෝඨාභය සඳහන් කරන ආකාරයට රජයක් ලෙස කොන්ත්‍රාත් සමාගමට යුරෝ මිලියන 57.04ක් ගෙවා අවසන්. ඊට අමතර ව තවත් යුරෝ මිලියන 6.89ක මුදලක් ගෙවීමට තිබෙනවා. මෙලෙස ණය වී ප්‍රතිලාභ කිසිත් නොමැති ව ආපසු ණයක් ගෙවීම තරම් විනාශයක් තවත් නැහැ. ඒ සෑම සතයක් ම ජනතාවගේ බදු මුදල්. ඒ නිසා නව රජය බලයට පත්වීමත් සමඟ විනාශ වන ජනතා දේපළ මෙරට ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කරගන්නේ කෙසේද යන කාරණයේදී මේ සඳහා රජය විශේෂ සැලකිල්ලක් යොමු කිරීම පැසසිය යුතු කාරණාවක්.

බඩල්ගම කර්මාන්ත ශාලාවේ කිරි නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා අභියෝග

විනාශයට පත්වෙමින් තිබෙන යන්ත්‍රෝපකරණ

කිහිපයක් ම පවතිනවා. ඒ අතර මේ ව්‍යාපෘතියේ ප්‍රධාන මූල්‍ය සහායකයා වන HSBC බැංකුව වර්තමානය වන විට ව්‍යාපෘතියේ තවදුරටත් රැඳිය නොහැකි බව දන්වා තිබෙනවා. ඒ නිසා අවශ්‍ය වී තිබෙන්නේ විකල්ප මූල්‍ය සම්පාදනයක්. ඊට විකල්ප වශයෙන් 2026 අය වැයෙන් මේ සඳහා මූල්‍ය සම්පාදනයට ජනාධිපතිවරයා කැමැත්ත පළ කළ බවත් සභාපති හේමජීව ගෝඨාභය සඳහන් කරන කාරණාවක්.

ව්‍යාපෘතිය නිම කළ යුතු කාලය අවසන් වීම නිසා මිල්කෝ ආයතනයට සිදු වී තිබෙන්නේ ප්‍රමාද ගාස්තු ගෙවීමට. මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත් සමාගම සමඟ සාකච්ඡා කරමින්, ඉදිරි කාර්ය සඳහා මූලික එකඟතා නිර්මාණය කරමින් සිටින බවත් දළ වශයෙන් මෙහි වැඩ ආරම්භයට මාස 8ක් 12ක් පමණ ගතවනු ඇති බවත් කර්මාන්ත ශාලාව 2026 වසරේ අවසානය වන විට ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒමට හැකියාව තිබෙන බවත් මිල්කෝ (පුද්) සමාගමේ සභාපතිවරයා පවසනවා.

ඕනෑ ම ව්‍යාපාරයක ලාභය හෝ පාඩුව හෝ තීරණය කරන්නේ අලෙවිය වැඩි කිරීම සහ වියදම අඩු කිරීම යන කාරණා මත. මිල්කෝ (පුද්) සමාගම ද 2024 වසරට සාපේක්ෂ ව 2025 වසරේ මුල් මාස 06 ඇතුළත අලෙවිය 27%කින් වැඩි කරගෙන ඇති අතර වියදම 30%කින් අඩු කරගෙන තිබෙනවා. ඒ සඳහා විශේෂයෙන් බලපාන්නේ සැලසුම් සහගත කළමනාකරණයක්. මේ වන විට බඩල්ගම කර්මාන්ත ශාලාවේ ආරම්භයට යෙදවිය යුතු කාරක ප්‍රාග්ධනය (Working Capital) සපයා ගැනීම සම්බන්ධයෙන් මිල්කෝ (පුද්) සමාගමට ගැටලුවක් නැහැ. ඔවුන් නිෂ්පාදන වඩාත් ලාභදායී ලෙස පාරිභෝගිකයාට සහ ආයතනයට ලාභ ලැබෙන ලෙස ඉතිරි වසර 5ට අදාළ වෙළෙඳ සැලසුම් සකස් කර අවසන්.

රජය මේ ගන්නා වෑයම සාර්ථකත්වයට පත්වෙමින් 2026 වසරේදී බඩල්ගම කිරි කර්මාන්ත ශාලාව ජාතියට කිරි සපයනු ඇතැයි යන සුබවාදී අපේක්ෂාවයි එම නිරීක්ෂණ චාරිකාවේදී අවසන් වශයෙන් සිතට නැගුණේ.

- බඩල්ගම සිදු කළ මාධ්‍ය නිරීක්ෂණ චාරිකාව ඇසුරෙන් -

උතුරට

රංගිකා අබේසේකර

ලෝක පොල් දිනයට සමගාමී ව 'උතුරු පොල් ත්‍රිකෝණය' වැඩසටහන 'කප්තුරු සවිය' නමින් ක්‍රියාත්මක වන්නේ යාපනය (පේදුරුතුඩුව), මුලතිව් (ශිලා වතුර), මන්නාරම (කෝකිලායි) යන ප්‍රදේශ ආවරණය වන පරිදි. 2025, 2026, 2027 වසරවලදී අක්කර 40,000ක් ආවරණය වන පරිදි පොල් වගාව ව්‍යාප්ත කිරීමයි මෙහි අරමුණ. ඒ සඳහා 2025 වසරේදී රුපියල් බිලියන 500ක් සහ 2026 වසර සඳහා රුපියල් බිලියන 600ක් අය වැයෙන් වෙන් කර තිබෙනවා.

යුද්ධය හේතුවෙන් උතුරු ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති සිදු වුණේ ඉතා අවම මට්ටමකින්. කුඩා පරිමාණයේ වගාකරුවන් මෙන් ම මහා පරිමාණයේ වගාකරුවන්ට අවශ්‍ය ආධාර ලබා දී පොල් වගාව ආරම්භ කර ප්‍රවර්ධනය කිරීමයි මේ වැඩසටහනෙන් රජය අපේක්ෂා කරන්නේ. 'කප්තුරු සවිය' විශේෂ වැඩසටහන යටතේ හලාවත වැවිලි සමාගම සහ පොල් පර්යේෂණ ආයතනය සම්බන්ධ වෙමින් උතුරේ පලෛයිහිදී පළමු බීජ ගොවිපොළ ආරම්භ කෙරෙනවා. එහි අරමුණ වන්නේ වාර්ෂික ව පොල් ගෙඩි බීජ මිලියන ලක්ෂයක් නිෂ්පාදනය කිරීම. මීට අමතර ව පුදුකුඩිඉරිප්පු සහ පුනරීන්වල තවත් බීජ උද්‍යාන 2ක් ස්ථාපිත කිරීමටයි නියමිත.

2025 වසරේ මෙරට අනෙකුත් ප්‍රදේශවල අක්කර 20,000ක් වගා කිරීමටත් ඒ යටතේ පොල් පැළයක් රුපියල් 150ක් වැනි සහනාධාර මුදලකට ලබාදෙමින් පරිභෝජනය සඳහා ගෙවතු පොල් වගාව ප්‍රවර්ධනයටත් රජය සූදනම්. ඒ, ගෙවතු පොල් වගාව ප්‍රවර්ධනය සඳහා පවුලකට පොල් පැළ 2ක් සහ තාක්ෂණය ද ලබාදෙමින් පොල් පැළ ලක්ෂ 5ක් බෙදා දීමට පියවර ගැනීමෙන්.

උතුරේ පොල් වගාව ස්ථාපිත කිරීමේදී එහි සාම්ප්‍රදායික ව පොල් වැවෙනවා ද? උතුරු පොල් ත්‍රිකෝණය සාර්ථක ව කළ හැකි ද? යන්න සැකයක් මතුවීමට පුළුවන්. පොල් වගාවේ ඉලක්ක සහ නිෂ්පාදන ඉලක්ක වෙත යාමටනම් උතුරේ සිදු කරන වගා තවදුරටත් විද්‍යාත්මක සහ නවීකරණය කළ යුතු වනවා. උතුරේ පස සහ ජල සම්පාදනය පරීක්ෂා කිරීමේදී එය පොල් වගාවට ඉතා සුදුසු බව පොල් පර්යේෂණ ආයතනයේ සභාපති මහාචාර්ය අජිත් ජයවීර සඳහන් කරන්නක්.

සාමාන්‍යයෙන් මෙරට වාර්ෂික පොල් අවශ්‍යතාව පොල් ගෙඩි මිලියන 3000ක්. එහෙත් පොල් පර්යේෂණ ආයතනයේ සංඛ්‍යා දත්ත අනුව 2024 වසරේ පොල් ඵලදාව වුණේ පොල් ගෙඩි මිලියන 2754ක්. ශ්‍රී ලංකාවේ දැනට පොල් වගා කරන භූමි ප්‍රමාණය අක්කර ලක්ෂ 11ක්. ඒ අනුව පොල් ගස් ලක්ෂ 65ක සංඛ්‍යාවක් ඇති බවත් දැනට පවතින පොල් වගාව පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු වන බවත් වැවිලි සහ ප්‍රජා සහ යටිතල පහසුකම් අමාත්‍යාංශ ලේකම් ප්‍රභාත් චන්ද්‍රකීර්ති සඳහන් කරනවා. 2024 වසර වන විට අවශ්‍ය පොල් ප්‍රමාණය නොතිබීම හේතුවෙන් මෙරට පරිභෝජන අවශ්‍යතාවට සහ කර්මාන්ත සඳහා නිෂ්පාදන අවශ්‍යතාව වෙනුවෙන් පොල් ගෙඩි මිලියන 200කට ආසන්න සංඛ්‍යාවක් ආනයනය කිරීමට සිදුවුණා.

අදහස් දක්වන අමාත්‍යාංශ ලේකම් ප්‍රභාත් චන්ද්‍රකීර්ති; "2030 වසර වන විට පොල් ගෙඩි මිලියන 4,200ක නිෂ්පාදන ඉලක්කයකට යාමට අප බලාපොරොත්තු වෙනවා. උතුරු පොල් ත්‍රිකෝණයේ අක්කර 40,000ක් ආවරණය වන ආකාරයට පොල් වගා කිරීම ආරම්භ කරන්නේ එහි එක් පියවරක් ලෙස. උතුරේ ගෙවතු වගාවට අමතර ව ක්‍රමවත් ව පොල් වගාකරුවන් 1,200ක් පොල් වගා කිරීමේ මණ්ඩලයෙන් තෝරාගෙන තිබෙනවා".

පොල් අපනයනය කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව වර්තමානයේ පසු වන්නේ සිව් වැනි ස්ථානයේ. 2024 වසර සැලකූවිට පොල් නිෂ්පාදන අපනයනයෙන් ඩොලර් මිලියන 855ක ආදායමක් හිමි කරගෙන තිබෙනවා. පොල් යනු රටට අපනයන ආදායම ලබාදෙන ප්‍රධාන භෝගයක් වුවත් පසුගිය කාලයේ මෙරට පරිභෝජනයට ද පොල් හිඟ වූ අවස්ථා දක්නට ලැබුණා. ඒ අනුව පොල් මිල ඉහළ යාමත් සමඟ ජනතාව පත් වුණේ පීඩනයට. ඊට හේතු වූයේ සැලැස්මක් නොමැති ව ක්‍රියාත්මක වීම සහ පොල් වගා ක්ෂේත්‍රයට

නිසි අවධානයක් නොකිරීම. මේ නිසා 2030 වසර වන විට United Nation Industrial Development Organization හා සම්බන්ධ වෙමින් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් පොල් කර්මාන්තය වෙනුවෙන් සැලසුම් කර ඇති බව වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය සමන්ත විද්‍යාරත්න සඳහන් කරන්නේ එමගින් රටේ පොල් අස්වැන්න ඉහළ දැමීමෙන් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම ඉහළ නංවා ගැනීමට අවකාශය ලැබෙනු ඇති බව අවධාරණය කරමින්.

මෙරට පොල් වගාව දෙස අවධානය යොමු කිරීමේදී පොහොර යෙදීම සහ ජල සම්පාදනය නියමාකාර ව සිදු නොවීම ප්‍රධාන ගැටලුවක්. එහෙත් පොල් ගසකට පොහොර යෙදූ පමණින් ම කෙටිකාලීන අස්වැන්නක් ලබා ගැනීමට හැකියාව නැහැ. පොහොර යෙදීමෙන් පසු පොල් ඵලදාව ලැබීමට වසර 1.5ක් පමණ ගතවනවා. ඒ නිසා රජය සැලසුම් කර තිබෙන්නේ අඛණ්ඩ ව පොහොර සහනාධාරය ලබාදීමට.

පොල් පර්යේෂණ ආයතනයේ දත්ත අනුව ශ්‍රී ලංකාවේ එක් පොල් ගසකින් සාමාන්‍ය ඵලදාව වර්ෂයකට පොල් ගෙඩි 45ත් - 50ත් අතර සංඛ්‍යාවක්. එහෙත් ඉන්දුනීසියාවේ වාර්ෂික ඵලදාව එක් ගසකින් 120ක්. ඉන්දියාවේ එය පොල් ගෙඩි 80 ඉක්මවනවා. 2030 වන විට පොහොර යොදා, ජල සැපයුම ක්‍රමවත් කර, රෝග මර්දනය කර වාර්ෂික ව එක් පොල් ගසකින් ගෙඩි 80ක් දක්වා ඉහළ නංවා ගැනීම අපේක්ෂාවක්. ඒ අනුව පොල් ගෙඩි මිලියන 4200ක වාර්ෂික ඉලක්කයක් සහ අපනයන ආදයම ඩොලර් බිලියන 1.5කට යාම රජයේ සැලසුමක්. එම ඉලක්කය වෙත යන ගමනේදී වාර්ෂික ව පොල් ගෙඩි මිලියන 200කට ආසන්න සංඛ්‍යාවක් වඳුරන්, රිලවුන්, දඬුලේනුන් නිසා විනාශයට පත්වන බව අමාත්‍යාංශ ලේකම් ප්‍රභාත් චන්ද්‍රකීර්ති පෙන්වා දෙන කාරණාවක්. මේ නිසා ඊට ද පිළියම් සෙවීම කළ යුත්තක්.

පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති වෛද්‍ය සුනිමල් ජයකොඩි පවසන්නේ මෙරට පොල් වගාකරුවන්ගේ අවශ්‍යතා සොයා බලා ඔවුන්ට දැනුම හා පුහුණුව, පොහොර, පැළ ලබාදී අස්වැන්න වැඩි කිරීමට දැඩි උත්සාහයක නිරත වී සිටින බව. පොහොර ගැටලුව සමඟ කෘමි උවදුර සහ රෝග මර්දනය යන අභියෝග ද තිබෙනවා. පොල් වගා කිරීමේ මණ්ඩලයෙන් අලුතින් පොල් පැළ ලක්ෂ 25ක් සිටුවන වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර එයින් උතුරු පොල් ත්‍රිකෝණය සඳහා නොමිලේ පැළ ලක්ෂ 10ක් සහ රටේ අනෙකුත් ප්‍රදේශවලට පැළ ලක්ෂ 15ක් බෙදාදීමට සැලසුම් කර ඇති බව සභාපතිවරයා සඳහන් කරනවා.

යුද්ධය හේතුවෙන් උතුරු ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති සිදු වුණේ ඉතා අවම මට්ටමකින්. කුඩා පරිමාණයේ වගාකරුවන් මෙන් ම මහා පරිමාණයේ වගාකරුවන්ට අවශ්‍ය ආධාර ලබා දී පොල් වගාව ආරම්භ කර ප්‍රවර්ධනය කිරීමයි මේ වැඩසටහනෙන් රජය අපේක්ෂා කරන්නේ. 'කප්තුරු සවිය' විශේෂ වැඩසටහන යටතේ හලාවත වැවිලි සමාගම සහ පොල් පර්යේෂණ ආයතනය සම්බන්ධ වෙමින් උතුරේ පලෙයිහිදී පළමු බීජ ගොවිපොළ ආරම්භ කෙරෙනවා.

ලැබෙන පොල් අස්වැන්න සහ නාස්තිය අවම කිරීම සම්බන්ධයෙන් ද අවධානය යොමු කිරීම ඉතා වැදගත්. අදහස් දක්වන පොල් සංවර්ධන අධිකාරියේ සභාපති වෛද්‍ය ශාන්ත රණතුංග; " 2024 වසරේ ඩොලර් මිලියන 855ක පොල් අපනයන ආදායමක් ලැබුණා. මේ සඳහා කර්මාන්ත ශාලාවල ධාරිතාවෙන් 60%ක් පමණයි භාවිත වුණේ. මීට හේතුවක් පොල් ඵලදාව අවම මට්ටමක පැවතීම. මෙරට පොල් අස්වැන්නෙන් 60%ක ප්‍රමාණයක් ම ගෘහස්ථ පරිභෝජනයටයි වැය වන්නේ. එය 50%-40% දක්වා ක්‍රමයෙන් අඩු කිරීම අපගේ බලාපොරොත්තුවක්. එයින් ඉතිරි වන ප්‍රමාණය කර්මාන්තශාලා සඳහා යොමු කිරීමෙන් අපනයන ඉලක්කය වැඩි කර ගැනීමට පුළුවන්. ඒ සඳහා 2030 වසර වන විට අවස්ථා පුළුල් කරමින් අපනයන ඉලක්ක වෙත පැමිණීමට අපේක්ෂා කරනවා."

පොල් පර්යේෂණ ආයතනයේ සභාපති මහාචාර්ය අජිත් ජයවීර සඳහන් කරන්නේ අවශ්‍ය බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයට දායක වෙමින් 'කප්තුරු සවිය' උතුරු පොල් ත්‍රිකෝණයේ වැඩසටහනට සිය දයකත්වය ලබා දෙන බව. අදහස් දක්වන ඔහු; "සෑම වසර 7-8කට වරක් ම රෝග හා පලිබෝධ අලුත් වනු දැකගන්නට පුළුවන්. ශ්‍රී ලංකාවට වඩා පොල් නිෂ්පාදනය කරන රටවල් වන ඉන්දුනීසියාව, මැලේසියාව, තායිලන්තය වැනි රටවලින් විවිධ රෝග පැමිණෙනවා. සුදු මැස්සාගේ හානිය එවැන්නක්. මේ රෝග පාලනය ඉතා අසීරු කාර්යයක්. පොල් වගා කිරීමේ මණ්ඩලය සමඟ එක් ව අත්හදා බලා නිර්දේශ ක්‍රියාත්මක කරමින් රෝග සහ පළිබෝධ හානි අවම කිරීමට ක්‍රියා කරනවා. ඉන්දියාව, ඉන්දුනීසියාව වැනි රටවල පොල් අස්වනුවලට සමාන ව මෙරට අස්වනු වැඩි කිරීමට පොහොර සහ තෙතමනය සංරක්ෂණය අතිශය වැදගත්. මේ පිළිබඳ උතුරු ප්‍රදේශයේ සිදු කළ පර්යේෂණවලින් සොයාගත් තොරතුරු අනුව භෝගයකට දිනකට අවශ්‍ය ජල ප්‍රමාණය සහ ජලය ලබාදිය හැකි නිවැරදි ක්‍රමවේදයක් හඳුන්වා දීමටත් නියමිතයි. ඉහළ අස්වනු ලබාදෙන ප්‍රභේද 09ක් තිබෙනවා. ඉන් උතුරු ප්‍රදේශයට වඩාත් ම ගැළපෙන ප්‍රභේදය වන්නේ CRI60 ප්‍රභේදය. එය වියළි දේශගුණයට ඔරොත්තු දෙන අඩු ජල ප්‍රමාණයකින් ඉහළ අස්වනු දෙන ප්‍රභේදයක්".

2030 වසර වන විට ලෝක වෙළෙඳ පොළේ පොල් නිෂ්පාදන සඳහා තිබෙන වෙළෙඳ පොළ අගය රුපියල් බිලියන 19ක් දක්වා ඉහළ යනු ඇති. එලෙස පුළුල් වන ලෝක පොල් වෙළෙඳ පොළත් සමග ම එයින් ශ්‍රී ලංකාව අත්පත් කරගත යුතු අගය කරා යාමට 'කප්තුරු සවිය' සවියක් ම වනු ඇතැයි සිතිය හැකියි.

තීරු බද්දේ ඇතුළු පැත්ත

මහාචාර්ය
අමින්ද මෙත්සිල පෙරේරා
ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය
වයඹ විශ්වවිද්‍යාලය

ඇමරිකාව ලෝකයේ බලවත් ම රාජ්‍යයක්. එය ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 29ක තරම් විශාල ආර්ථිකයක් සහිත රටක්. එසේ වුවත් ඔවුන්ගේ විදේශ ණය ප්‍රමාණය පසුගිය කාලවකවානුවේ ඉතා විශාල ලෙස ඉහළ ගොස් තිබුණා. ආනයන හා අපනයන අතර පරතරය (වෙළෙඳ හිඟය) ඉහළ ගියේ ඩොලර් බිලියන 1200 ඉක්වමින්. මේ නිසා ණය බර හා වෙළෙඳ හිඟය අවම කිරීමට ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ඔවුන්ගේ තීරු බදු ඉහළ දැමීමට තීරණය කළා. මෙයින් ආනයන ප්‍රමාණය අඩු වීමෙන් වෙළෙඳ හිඟය අවම වනු ඇතැයි ඇමරිකාව අපේක්ෂා කළා. මේ ඍජු ආර්ථිකමය සාධකයට අමතර ව ආර්ථිකමය හා දේශපාලනමය වශයෙන් මිශ්‍ර වූ සාධකයක් තීරු බදු ඉහළ දැමීම සඳහා හේතු වන්නට ඇතැයි මා විශ්වාස කරනවා.

ඉතිහාසයේ පටන් ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය අතර පැවතියේ සීතල යුද්ධයක් බව ලෝකයට ම නොරහසක්. සෝවියට් දේශය බිඳී ගොස් රුසියාව පමණක් ඉතිරි වීමෙන් පසුව එය තනි රාජ්‍යයක් හැටියට ක්‍රියාත්මක වුණා. ඔවුන්ට අභියෝග කිරීම සඳහා ලෝකයේ කිසිවකු සිටියේ නැහැ. එහෙත් පසුව චීනය වේගයෙන් සංවර්ධනය වීමත් සමඟ BRICS (Brazil, Russia India, China, South Africa) සංකල්පය බිහි වුණා. මෙහිදී සිදු වුණේ බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව හා දකුණු අප්‍රිකාව චීනයට එකතු වීම. 2024 වර්ෂය වන විට මැදපෙරදිග සම්පත් බහුල ප්‍රබල රටවල් කිහිපයක් ද BRICS සමග එකතු වී තිබෙනවා. මේ රටවල ආර්ථිකයේ වටිනාකම ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 28ක්. මේ නිසා ඇමරිකානු ආර්ථිකයට සමාන ආකාරයේ වටිනාකමක් සහිත ආර්ථිකයක් විදිහට BRICS ආර්ථිකය හඳුන්වන්න පුළුවන්. වාමාංශික දේශපාලනයට නැඹුරු වූ රටවල් කිහිපයක් වූ රුසියාව, චීනය, ඉන්දියාව වැනි රටවල BRICS ඔස්සේ ඇති කරගත් මේ සාමූහිකත්වය සෝවියට දේශයට විකල්පයක්.

BRICS රටවල් අතර ඔවුන්ගේ ම මුදල් ඒකකයක් නිර්මාණය කිරීමට යෝජනා වී තිබෙනවා. මේ නිසා ඩොලරයට පවතින ජාත්‍යන්තර ඉල්ලුම අවම වීමට එය හේතු වන්නට පුළුවන්. එසේ වුවහොත් ඩොලරය විශාල වශයෙන් පිරිහීමේ අවදානමකුයි පවතින්නේ. මේ සියලු කාරණාවල ප්‍රතිඵලවලින් දක්ෂිණාංශික නැඹුරුවක් සහිත රටක් වන ඇමරිකාවට එල්ල වන්නේ දැඩි තර්ජනයක්. ඇමරිකාවේ තීරු බදු ඉහළ දැමීමට මේ තත්ත්වය ද හේතු වන්නට ඇති. BRICS රාජ්‍ය සමඟ ගනුදෙනු කරනවානම් එම රටවල් සඳහා අමතර සියයට 10ක බදු පනවන බව ඇමරිකානු ජනාධිපතිවරයා ප්‍රකාශ කිරීමෙන් එය තවදුරටත් තහවුරු වෙනවා. මේ හේතුවෙන් ඉන්දියාව සඳහා ඇමරිකාව ක්‍රියාත්මක කළේ සියයට 50ක තරම් ඉහළ තීරු බද්දක්.

එවැනි පසුබිමකයි ශ්‍රී ලංකාවට ද පළමුවෙන් ම සියයට 44ක ඉහළ තීරු බද්දක් පැනවීමට ඇමරිකාව ක්‍රියා කළේ. ඉන්පසුව එය සියයට 30 දක්වා අඩු කර, නැවතත් සියයට 20 දක්වා පහළ දැමුණා. ඒ අනුව 2025 අගෝස්තු 07 දින සිට ශ්‍රී ලංකාවෙන් ආනයනය කරන භාණ්ඩ සඳහා ඇමරිකාව ක්‍රියාත්මක කරන්නේ සියයට 20ක තීරු බද්දක්.

ශ්‍රී ලංකාව යහපත් මට්ටමකින් රාජ්‍ය තාන්ත්‍රික ව මැදිහත් වීම, ඇමරිකාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ මැදිහත් වීම ඇතුළු තීරු බදු ප්‍රතිශතය අඩු කරන ලෙස කළ ශ්‍රී ලංකාවේ ඉල්ලීම් තීරු බදු ප්‍රතිශතය පහළ දැමීමට හේතු වූ බව සත්‍යයක්. එහෙත් ඇමරිකාව මෙලෙස තීරු බදු අඩු කරන ලද්දේ ශ්‍රී ලංකාවට පමණක් නොවෙයි. වෙනත් රටවල් සම්බන්ධයෙනුත් මේ ආකාරයේ තීරු බදු අඩු කළා. තීරු බදු ඉහළ දැමීමෙන් ඇමරිකාවට ද බලපෑමක් ඇති වෙනවා. ඉහළ දමන ලද බදු ප්‍රමාණය ගෙවීමට

සිදු වන්නේ ඇමරිකානු ජනතාවට. එය ඔවුන්ගේ ජීවන තත්ත්වයට බලපෑම් කරනවා. ඒ නිසා ඇමරිකානු ජනතාවගෙන් ම විශාල බලපෑමක් එරට රජයට එල්ල වුණා තීරු බදු අඩුකරන ලෙසට. එය පනවා තිබූ තීරු බදු අඩු කිරීමට ප්‍රබල හේතුවක් වුණා. තමන්ට වාසිසහගත ආර්ථික හැසිරීමක් සහිත රාජ්‍යවලට අඩු බදු ප්‍රතිශතයක් අය කිරීමටත් ඇමරිකාව ක්‍රියා කර තිබුණා. මේ නිසා ජපානය වැනි රටවල් ඉතා විශාල ලෙස ඇමරිකාවේ ආයෝජනය පුළුල් කර තිබෙනවා.

ඇමරිකාවේ තීරු බදු ඉහළ දැමීමේ ආර්ථික ප්‍රතිවිපාක සාකච්ඡා කිරීමේදී එහි නිරපේක්ෂ සහ සාපේක්ෂ ප්‍රතිඵල පවතිනවා. නිරපේක්ෂ ප්‍රතිවිපාක යනුවෙන් අදහස් කරන්නේ තීරු බදු පනවන ලද රටට කොතරම් ප්‍රමාණයක් තීරු බදු පනවා ඇති ද යන්න පිළිබඳ සලකා බැලීම. මෙහිදී අනෙකුත් තරගකාරී රටවලට පනවා ඇති තීරු බදු සමඟ සැසඳීමකින් නොවෙයි එය සිදු කරන්නේ. එහිදී නිරපේක්ෂ ව බද්දේ ප්‍රමාණය මත පදනම් ව ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයට කුමනාකාරයකින් බලපෑම් කරනු ඇති ද යන්න පිළිබඳ සාකච්ඡා කෙරෙනවා. ඒ අනුව ශ්‍රී ලංකාවේ අපනයන බිලියනයකින් පමණ අඩු වෙනු ඇතැයි ඇතැමුන් පුරෝකථනය කර තිබුණා. ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපනයන ඉපයුම් ලෙස ඇමරිකානු ඩොලර් බිලියන 16ක පමණ වාර්ෂික ඉලක්කයක් ලබා දී තිබුණා. එහෙත් තවමත් ශ්‍රී ලංකාව අත්පත් කරගෙන ඇත්තේ බිලියන 13ක තරම් ප්‍රමාණයක්. මේ නිසා ඇමරිකානු තීරු බදු ඉහළ දැමීම ශ්‍රී ලංකාවට විශාල අභියෝගයක් බව පැහැදිලි වෙනවා.

තීරු බදු ඉහළ දැමීමේ සාපේක්ෂ බලපෑම් යන්නෙන් අදහස් වන්නේ අනෙකුත් තරගකාරී රටවලට පනවා ඇති තීරු බදු ප්‍රතිශතය හා ශ්‍රී ලංකාවට පනවා ඇති තීරු බද්දේ ප්‍රමාණය සැසඳීමේදී ඇති විය හැකි ආර්ථික ප්‍රතිවිපාක. 2025 අප්‍රේල් මාසයේදී ඇමරිකාව විසින් රටවලට පනවනු

ඇමරිකාවේ තීරු බදු ඉහළ දැමීමේ ආර්ථික ප්‍රතිවිපාක සාකච්ඡා කිරීමේදී එහි නිරපේක්ෂ සහ සාපේක්ෂ ප්‍රතිඵල පවතිනවා. නිරපේක්ෂ ප්‍රතිවිපාක යනුවෙන් අදහස් කරන්නේ තීරු බදු පනවන ලද රටට කොතරම් ප්‍රමාණයක් තීරු බදු පනවා ඇති ද යන්න පිළිබඳ සලකා බැලීම. මෙහිදී අනෙකුත් තරගකාරී රටවලට පනවා ඇති තීරු බදු සමඟ සැසඳීමකින් නොවෙයි එය සිදු කරන්නේ. එහිදී නිරපේක්ෂ ව බද්දේ ප්‍රමාණය මත පදනම් ව ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයට කුමනාකාරයකින් බලපෑම් කරනු ඇති ද යන්න පිළිබඳ සාකච්ඡා කෙරෙනවා. ඒ අනුව ශ්‍රී ලංකාවේ අපනයන බිලියනයකින් පමණ අඩු වෙනු ඇතැයි ඇතැමුන් පුරෝකථනය කර තිබුණා. ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපනයන ඉපයුම් ලෙස ඇමරිකානු ඩොලර් බිලියන 16ක පමණ වාර්ෂික ඉලක්කයක් ලබා දී තිබුණා. එහෙත් තවමත් ශ්‍රී ලංකාව අත්පත් කරගෙන ඇත්තේ බිලියන 13ක තරම් ප්‍රමාණයක්. මේ නිසා ඇමරිකානු තීරු බදු ඉහළ දැමීම ශ්‍රී ලංකාවට විශාල අභියෝගයක් බව පැහැදිලි වෙනවා.

ලැබූ බදු ප්‍රතිශතය සලකා බලන විට බංග්ලාදේශය සඳහා අඩු බදු ප්‍රතිශතයක්, ශ්‍රී ලංකාව සමඟ තරග කරන කාම්බෝජය, වියට්නාමය වැනි රටවලට ශ්‍රී ලංකාවට වඩා වැඩි තීරු බදු ප්‍රතිශතයක් පනවා තිබුණා. 2025 ජූලි මාසය වන විට ශ්‍රී ලංකාවේ බදු ප්‍රතිශතය සංශෝධනයකට ලක් වුණේ සියයට 30ක් ලෙස. එහිදී කලාපයේ අනෙකුත් තරගකාරී රටවලට ඊට වඩා ඉහළ බදු ප්‍රතිශතයකුයි පනවා තිබුණේ. එම නිසා තීරු බදු ඉහළ දැමීමේ සාපේක්ෂ බලපෑමේදී ශ්‍රී ලංකාවට වාසිසහගත තත්ත්වයක් තිබුණා. එහෙත් ශ්‍රී ලංකාවට සියයට 20ක් ලෙසින් බදු සංශෝධනය කරන විට සාපේක්ෂ ව යම් අවාසිසහගත තත්ත්වයක් ඇති වූ බවයි මගේ විශ්වාසය. මන්ද, බංග්ලාදේශයට හා වියට්නාමයට සියයට 20ක තීරු බදු ප්‍රතිශතයක් පනවා තිබූ අතර කාම්බෝජයට ශ්‍රී ලංකාවට වඩා අඩු බදු ප්‍රතිශතයක් (සියයට 19ක්) පනවා තිබෙනවා. මේ නිසා වර්තමානයේ ඇමරිකාව විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කරන ලද තීරු බදු සංශෝධනය නිරපේක්ෂ ව වාසිසහගත වුවත් සාපේක්ෂ වාසියේ යම් අවම වීමක් පෙන්නුම් කරනවා.

මේ වන විට ඇමරිකානු ජනාධිපති ඩිජිටල්කරණ සේවා සඳහා බදු අය කරන රටවලට තීරු බදු ඉහළ දැමීමට ක්‍රියා කරන බවක් පැවසෙනවා. එයට හේතුව බොහෝ රටවල ඩිජිටල් සේවාකරණ සිදු වන්නේ ඇමරිකාව පදනම් කරගනිමින් වීම. BRICS රටවල් සමඟ ගනුදෙනු කරන රටවල් සඳහා ද ඒ ආකාරයට ම තීරු බදු ඉහළ දැමීමට ක්‍රියා කරන බව ඇමරිකානු ජනාධිපතිවරයා පවසා තිබුණා. ඉන්දියාව සාපේක්ෂ වශයෙන් ඇමරිකාව සමඟ ඉහළ ආර්ථික සබඳතාවක් පවත්වාගෙනයි තිබුණේ. ඔවුන් ඇමරිකාවෙන් විශාල භාණ්ඩ ප්‍රමාණයක් ආනයනය කරමින් තිබියදීත් රුසියාවෙන් ඉන්ධන ආනයනය කිරීම නිසා තීරු බදු ප්‍රතිශතය සියයට 50ක් තරම් ඉහළ දැමුවා. ශ්‍රී ලංකාව වැඩිපුර ම ආනයනය කරන්නේ ඉන්දියාවෙන් සහ චීනයෙන්. එයින් පැවසෙන්නේ

ශ්‍රී ලංකාවේ ආනයන වෙළෙඳ පොළ තවමත් පවතින්නේ ආසියාව පදනම් කරගෙන බවක්. ඒ අනුව ශ්‍රී ලංකාව BRICS රටවල් සමඟ ගනුදෙනු කරන රටක් වශයෙන් සලකන්න පුළුවන්.

ශ්‍රී ලංකාවට සැබවින් ම අවදානම් තත්ත්ව දෙකක් ඇති බව පෙනී යනවා. අවශ්‍යනම් ශ්‍රී ලංකාවට ඩිජිටල් සේවාකරණය මත පනවා ඇති බදු ප්‍රමාණයේ යම් සංශෝධනයක් කිරීමේ හැකියාව පවතිනවා. එහෙත් ආනයන වෙළෙඳ පොළ BRICS රටවල සිට ඇමරිකාව දක්වා විතැන් කිරීම ප්‍රායෝගික තත්ත්වයක් වන්නේ නැහැ. එම නිසා ශ්‍රී ලංකාව මේ අවස්ථාවේ සූක්ෂ්ම මට්ටමේ රාජ්‍ය තාන්ත්‍රිකභාවයකින් ක්‍රියා කළ යුතු වෙනවා.

සියයට 20 මට්ටමේ අවසන් බදු සංශෝධනය සිදු කළ අවස්ථාවේ ඇමරිකාව තවදුරටත් මේ බදු ප්‍රතිශත පහළ මට්ටමකට ගෙන ඒම සඳහා සලකා බලන බවක් ද ප්‍රකාශ කර තිබුණා. ඒ අනුව ශ්‍රී ලංකාවට මුලින් පැවති පදනම් බදු ප්‍රතිශතය වූ සියයට 10 මට්ටමට නැවත සංශෝධනය වීමේ හැකියාවක් පවතිනවා. බොහෝ විට එය 2026 වර්ෂය වන විට සිදු විය හැකියි. ඇමරිකාව පාර්ශ්වයෙන් සලකා බලන විට ශ්‍රී ලංකාව ඉතාමත් කුඩා වෙළෙඳ පොළක් විදිහටයි සැලකෙන්නේ. ට්‍රම්ප් තීරු බදු ඉහළ දමමින් වෙනත් රටවලට පැවසුවේ ඇමරිකාවට පැමිණ ආයෝජනය කරන ලෙස. මේ නිසා ජපානය වැනි රටවල් ඇමරිකාවේ ආයෝජනය කළා. එහෙත් ශ්‍රී ලංකාවේ එවැනි මහා පරිමාණයේ ආයෝජකයන් නැහැ. මේ හේතු සියල්ල ම සලකා බලන විට බොහෝ විට නැවතත් මුලින් තිබූ සියයට 10 මට්ටමට තීරුබදු සංශෝධනය වීමට ඉඩක් තිබෙනවා.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය මෑත කාලයේ කඩා වැටෙන විටත් අඛණ්ඩ ව ම පැවතුණේ සේවා ආර්ථිකයක් ලෙස. නිෂ්පාදන ආර්ථිකයක් පැවතුණේ නැහැ. එම නිසා මෙරට කර්මාන්ත පදනම් කරගත් නිෂ්පාදන අපනයන ආර්ථිකයක් නිර්මාණය කළ යුතු වෙනවා. එමගින් පමණයි විදේශ විනිමය ඉපයීම සිදු කළ හැක්කේ. විදේශ විනිමය ඉපයීම සඳහා සංචාරක ව්‍යාපාරය, විදේශ ප්‍රේෂණ, සෘජු විදේශ ආයෝජන සහ අපනයන ක්ෂේත්‍රවල සීඝ්‍ර වර්ධනයක් ඇති කර ගත යුතුයි. සෘජු විදේශ ආයෝජන ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා බරපතළ වෙනසක් කළ යුතු ව තිබෙනවා. විශේෂයෙන් ම ඒ සඳහා පවතින නීතිමය බාධා ඉවත් කර ගැනීම හා විදේශ ආයෝජන ගෙන්වා ගැනීමට හැකි ආකාරයේ නීති සම්පාදනය කිරීම කළ යුත්තක්. විදේශ ප්‍රේෂණවල වැඩි ප්‍රතිශතයක් තවමත් පවතින්නේ මැදපෙරදිග ආශ්‍රිත ඉපයීම් වශයෙන්. එය සෑහිමකට පත්විය හැකි තත්ත්වයක් නොවෙයි. මේ නිසා අපනයන ක්ෂේත්‍රය වර්ධනය කර ගැනීම දෙසට ශ්‍රී ලංකාව යොමු වීම අත්‍යාවශ්‍යයි. තවමත් ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය පදනම් වෙන්නේ තේ, පොල්, රබර් වැනි සාම්ප්‍රදායික අපනයන මත. මෙයට අමතර ව ඇත්තේ ඇඟලුම් කර්මාන්තය පමණයි. එහි ද ශුද්ධ ආදායම පවතින්නේ අවම මට්ටමක. තේ කර්මාන්තය ද මේ වන විට අර්බුදයකට යමින් පවතිනවා. පොල් ආනයනය කරන මට්ටමකට පැමිණ තිබෙනවා. කෘත්‍රිම රබර් නිසා විශාල රබර් වෙළෙඳ පොළක් ද ශ්‍රී ලංකාවට නැහැ. එම නිසා ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය නව්‍යකරණයට හා විවිධාංගිකරණයට ලක් කරමින් ජාත්‍යන්තර වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් නිෂ්පාදන ආර්ථිකයක් බිහිකර ගැනීමට කාලය පැමිණ තිබෙනවා.

සාකච්ඡා කළේ
දීප්ත කුමාර බටගොඩ

නව යුරේසියානු සහයෝගිතාව

සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි

දෙවැනි වර බලයට පැමිණි පසු රටවල් මත පැන වූ ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ තීරුබදුවල අරමුණ වූයේ සිය ප්‍රතිවාදීන් හුදකලා කිරීම වුවත් ඒ වෙනුවට ඔවුන් අතර ඓතිහාසික නැවත පෙළගැස්වීමකට, නව සහයෝගිතාවකට එය තුඩු දුන්නා. මිතුරන් ම නොවූව ද කලාපීය මත ගැටුම් අතර නිහඬ සාමාදානයක සිටි ඉන්දියාව, චීනය සහ රුසියාව නිහඬ ව ම සම්බන්ධීකරණය කරන්නට, නව සන්ධානයකට ගෙන එන්නට ද එය හේතුවක් වී තිබෙනවා.

පෙනී යන්නේ මේ නව සම්බන්ධීකරණය ම එක්සත් ජනපදය වෙතින් එන දැඩි හූ දේශපාලනික, වෙළෙඳ හා ආර්ථික පීඩනය ආපසු හැරවිය හැකි බවත් ගෝලීය ආර්ථික සහ දේශපාලනික සමතුලිත බව නැවත හැඩගස්වා ගත හැකි බවත් ඔප්පුවන ආකාරයක්. ඒ අනුව ට්‍රම්ප්ගේ වෙළෙඳ උපක්‍රම නව යුරේසියානු බල අක්ෂයක ආරම්භය සනිටුහන් කර තිබෙනවා.

මේ අනපේක්ෂිත පෙළගැස්ම සඳහා මුල් ම උත්ප්‍රේරකය පැමිණියේ 2025 වසර මුලදී ට්‍රම්ප් සිය හිතවතා වුවත් ඉන්දියානු භාණ්ඩ සඳහා 25%ක තීරුබදු පැනවීමෙන් ඉන්දියාවට එරෙහි ව ඔහුගේ ආර්ථික යුද්ධය දියත් කළ අවස්ථාවේදී. ඔහුගේ සාධාරණීකරණය වූයේ ඉන්දියාව විසින් රුසියානු තෙල් අඛණ්ඩ ව ආනයනය කරනු ලැබීම වරදක් බව. ඒ අනුව නවදිල්ලිය පුටින්ගේ යුද යන්ත්‍රයේ අනුග්‍රාහකයකු ලෙස සෙසු ලෝකයා හමුවේ වොෂින්ටනය පින්තාරු කළා. මේ තෙල් ගනුදෙනුවෙන් "ඉන්දියාව සතුරාට යුද්ධය සඳහා අරමුදල් සපයයි" යන්න තහවුරු කරන්නට ට්‍රම්ප් නිතර උත්සාහ කළා.

එක්සත් ජනපදයට සිදුකරන අපනයනය මත ම දැඩි ලෙස රඳා පවතින ආර්ථිකයක් ඇති ඉන්දියාවට දුනුණේ මේ තීරු බදු නිසා ඇති වූ වෙළෙඳ කම්පනය දිගුකාලීන මිත්‍රත්වය පාවාදීමක් ලෙස. ඒ හැරත් ට්‍රම්ප් ඇතුළු බටහිර මේ ගනුදෙනුවලදි පෙන් වූ වත හේතුවෙන් ඔවුන් කලකිරීමකට ලක්වුණා.

ඉන්දියාව රුසියානු තෙල් මිල දී ගැනීම හෙළා දකින ට්‍රම්ප් ඇතුළු බටහිර රටවල් නිහඬ ව රුසියානු යුරේනියම්, පැලේඩියම් සහ පොහොර මිල දී ගැනීම අඛණ්ඩ ව කරගෙන ගියා. මේ අනුව වොෂින්ටනයෙන් ලැබුණු පැහැදිලි පණිවිඩය ලෙස ඉන්දියාව කියවා ගත්තේ "නීති රීති ඔබට, නමුත් මට නොවේ" ආකාරයට.

රුසියාවෙන් ෆොසිල ඉන්ධන ආනයනය කරන ලොව දෙවැනි විශාලතම රට ඉන්දියාව. වර්තමානයේ ඉන්දියාව සිය තෙල් අවශ්‍යතාවෙන් සියයට 36ක් (දිනකට බැරල් මිලියන 5.4ක්) රුසියාවෙන් ආනයනය කරනවා. 2025 ජුනි වන විට ඉන්දිය රුපියල් බිලියන 360.76ක් (යුරෝ බිලියන 3.5ක්) වටිනා ෆොසිල ඉන්ධන ආනයනය කර තිබුණා.

මේ ආනයනවලින් 78%ක් ම, එනම් ඉන්දිය රුපියල් බිලියන 278.30ක් වටිනා (යුරෝ බිලියන 2.7ක්) බොරතෙල්. ඉන්දියාව වැඩිපුර ම ලබා ගන්නේ පිරිපහදු නොකළ බොර තෙල්. පසුව ඔවුන් එය සිය රටේදී පිරිපහදු කර කොටසක් සිය ප්‍රයෝජනයට ගන්නා අතර ලාභයක් ඇති ව නැවත විකුණනවා. රුසියානු බොර තෙල් මිලට ගැනීම බටහිර සම්බාධකවලින් තහනමට ලක් කර නැහැ. ඒ අනුව ඉන්දියානු මිලට ගැනීම් ඇමරිකාව ඇතුළු බටහිර නීති රීති උල්ලංඝනය කර නැහැ. 2025 ජූලි මාසයේදී, රුසියානු ෆොසිල ඉන්ධන ආනයනය කරන විශාලතම යුරෝපිය සමාගම් පහ යුරෝ බිලියන 1.1ක් වටිනා රුසියානු ඉන්ධන මිල දී ගෙන තිබුණා. මෙවැනි පසුබිමකයි ට්‍රම්ප්ගේ තීරු බදු පැනවීම සිදු වන්නේ. එම නිසා ඔවුන් තල්ලු කළේ නව කලාපීය හෙවත් යුරේසියානු සහයෝගිතාවක් දෙසට.

ට්‍රම්ප් චීනයට ද රුසියානු තෙල් ආනයනය අඩු කරන ලෙස, 100%ක් තීරුබදුවලට මුහුණදෙන ලෙස පවසා තිබෙනවා. චිනය මෙයට ප්‍රතිචාර ලෙස ඉන්දියාව මිලට නොගන්නා රුසියානු තෙල් කෝටාවක් වේනම් එය ද තමන් මිල දී ගන්නට සූදානම් බව ප්‍රකාශ කළා. මේ ප්‍රකාශයත් සමග ඉන්දියාවෙන් ඇරැඹි නව යුරේසියානු සහයෝගිතාවේ අඩිතාලම තවත් ශක්තිමත් වුණා.

මේ සමග ඉන්දියාව සඳහා වූ බද්ද තවත් සියයට 25කින් වැඩි කිරීමටයි ට්‍රම්ප් පියවර ගත්තේ. හදිසියේ ම විශාලතම ආසියානු දැවැන්තයන් දෙදෙනා, ඔවුන්ගේ දිගුකාලීන දේශ සීමා ගැටලු ඇතුළු අන්‍යෝන්‍ය අවිශ්වාස නොතකා, එක්

කාරණයක් සම්බන්ධයෙන් උරෙන්උර ගැටී සිටිය යුතු බවට තින්දු කළා.

මේ බලපෑම සම්බන්ධීකරණය වුණේ නිහඬ ව. ජාත්‍යන්තර සංසදවලදී ඉන්දියාව සහ චීනය ඇමරිකානු තීරණවලට එරෙහි ව එක් වීමට පටන් ගත්තා. රුසියානු තෙල් ආනයනය කිරීමේ ඔවුන්ගේ අයිතිය ආරක්ෂා කර ගත්තා. බ්‍රික්ස් සමුළුව හෝ G20 රැස්වීම්වලදී හෝ රටවල් දෙක ම තෙල් වෙළෙඳාම, සම්බාධක සහ බහු ධ්‍රැවීයතාව පිළිබඳ ස්ථාවර සම්බන්ධීකරණය කිරීමට පටන් ගත්තා. මේ දිග හැරෙන නව ප්‍රවණතාව ප්‍රීතියෙන් නරඹමින් මොස්කව්, දිගු කලක් නිද්‍රාශීලී ව පැවැති රුසියාව-ඉන්දියා-චීන (RIC) ඒකාබද්ධ කලාපීය සහයෝගිතා ව සඳහා වූ පෙලඹවීමට අතහිත දෙන්නට වුණා.

උපායමාර්ගික කණ්ඩායමක් ලෙස RIC මුලින් ම 1990 දශකය අගභාගයේදී යෙව්ගනි ප්‍රිමකොව්ගේ නායකත්වය යටතේ 'බටහිර සන්ධානයට ප්‍රති තුලනයක්' ලෙස හැඩගැසුණා. 1998 වසර සිට 1999 වසර දක්වා රුසියාවේ අගමැති ධුරය දැරූ රුසියානු දේශපාලනඥයකු සහ රාජ්‍ය තාන්ත්‍රිකයකු වන ප්‍රිමකොව්, RIC සඳහා වූ අදහසට ගෞරවය හිමි කර ගන්නවා. 'ඇමරිකා එක්සත් ජනපදය විසින් මෙහෙයවනු ලබන එහි යටත් විදේශ ප්‍රතිපත්තිය අවසන් කිරීම' සහ 'ඉන්දියාව සමඟ පැරණි සබඳතා අලුත් කිරීම සහ චීනය සමඟ අලුතින් සොයාගත් මිත්‍රත්වය පෝෂණය කිරීම' යන පදනම මත මේ කණ්ඩායම ආරම්භ කළා.

NATO සහ Quad වැනි එක්සත් ජනපද නායකත්වයෙන් යුත් සන්ධානවලට විකල්ප ධ්‍රැවයක් ලෙස RIC ඉදිරිපත් වී තිබෙනවා. එය නව යුරේසියානු බල අක්ෂයක ආරම්භය සනිටුහන් කර අවසන්. නව සහයෝගිතාවේ උද්‍යෝගිමත් මුලපිරීමක් ලෙස චින ජනාධිපතිවරයා කලාපයේ සංචාරයක යෙදුණා.

දශක ගණනාවක් පැරණි දේශසීමා ආරවුල විසඳීම සඳහා ඉන්දීය ජාතික ආරක්ෂක උපදේශක (NSA) අජිත් ඩෝවාල් සමඟ 24 වැනි වටයේ සාකච්ඡා සඳහා චීන විදේශ අමාත්‍ය වැන්ග් යී නවදිල්ලියේ නිරත වුණේ දෙදින සංචාරයක. එය අවසානයේ නවතම ප්‍රකාශයක් නිකුත් කර තිබුණා. ඒ අනුව ඉන්දියාව සහ චීනය 2020 දේශසීමා ගැටුමකින් පළුදු වූ සිය අසල්වැසි සබඳතා නැවත ගොඩනගා ගනිමින්, දෙරට අතර සෘජු ගුවන් ගමන් නැවත ආරම්භ කිරීමට සහ වෙළෙඳාම සහ ආයෝජන ප්‍රවාහ වේගවත් කිරීමට අලුතෙන් එකඟ වුණා.

ඒ අනුව දෙරට අතර ආයෝජන වෙළෙඳාම සහ ඉහළ නංවන සෘජු ගුවන් ගමන් නැවත ආරම්භ කරන අතර නම් කරන ලද ස්ථාන තුනක දේශසීමා වෙළෙඳාම නැවත විවෘත කිරීම සහ වීසා බලපත්‍ර සඳහා පහසුකම් සැලසීම ද සිදු කරනු ඇතැයි ඉන්දීය විදේශ අමාත්‍යාංශය කියා තිබුණා. දෙරට අතර හිමාලයානු දේශසීමාවේ රැස්කරගෙන සිටින හමුදා ආපසු කැඳවා ගැනීම, දේශසීමා සීමා නැවත නිර්ණය කිරීම සහ දේශසීමා සම්බන්ධ ගැටලු සාකච්ඡාවලට ඇතුළත් වූ බව ඉන්දීය අමාත්‍යාංශය පැවැසුවා.

> ට්‍රම්ප් චීනයට ද රුසියානු තෙල් ආනයනය අඩු කරන ලෙස, 100%ක් තීරුබදුවලට මුහුණදෙන ලෙස පවසා තිබෙනවා. චිනය මෙයට ප්‍රතිචාර ලෙස ඉන්දියාව මිලට නොගන්නා රුසියානු තෙල් කෝටාවක් වේනම් එය ද තමන් මිල දී ගන්නට සූදානම් බව ප්‍රකාශ කළා. මේ ප්‍රකාශයත් සමග ඉන්දියාවෙන් ඇරැඹි නව යුරේසියානු සහයෝගිතාවේ අඩිතාලම තවත් ශක්තිමත් වුණා.

ටිබෙටයේ යාර්ලුං සැන්ග්බෝ ගඟ හරහා චීනය ඉදිකරන දැවැන්ත වේල්ල සම්බන්ධයෙන් ඉන්දියාවේ අවධානය විදේශ අමාත්‍ය සුබ්‍රමනියම් ජයශංකර් වැන්ග් සමඟ කළ සාකච්ඡාවලදී අවධාරණය කර තිබුණා. යාර්ලුං සැන්ග්බෝ ගඟ ඉන්දියාවට සහ බංග්ලාදේශයට ගලා යන විට බ්‍රහ්මපුත්‍ර ගංගාව බවට පත් වන අතර එය මිලියන ගණනකගේ ජීවනාලිය බවට පත් වෙනවා. දේශසීමා ගංගා සම්බන්ධයෙන් විශේෂඥ මට්ටමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමටත් ගංවතුර වාර්තා කිරීමේ විධිවිධාන අලුත් කිරීම සඳහා සන්නිවේදනය පවත්වා ගැනීමටත් දෙපාර්ශ්වය ම එකඟ වූ බවයි අමාත්‍යාංශය නිවේදනය කළේ.

ඒ අතර සීමා නිර්ණ සාකච්ඡා ඉදිරියට ගෙන යාම සඳහා දේශසීමා පිළිබඳ ව සාකච්ඡා කිරීමට සහ සම්බන්ධීකරණය කිරීමට ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවීමට දෙරට එකඟ වී ඇති බව චීන විදේශ අමාත්‍යාංශ ප්‍රකාශයකින් පෙන්නුම් කෙරුණා. දේශසීමාවේ නැගෙනහිර සහ මැද කොටස් ආවරණය වන පරිදි සාකච්ඡා යාන්ත්‍රණය දීර්ඝ කරන බව එහි සඳහන් වුණා. මේ අතර බටහිර කොටස පිළිබඳ තවත් සාකච්ඡා වටයක් හැකි ඉක්මනින් පවත්වන බවයි අමාත්‍යාංශය පැවැසුවේ. 2026 වසරේදී චීනයේදී නැවත හමුවීමට දෙරට එකඟ වූ බව බීජිං කියා තිබුණා. ඒ අතර වසර හතකට වැඩි කාලයකට පසු චීනයට සිය පළමු සංචාරයේ යෙදෙමින් මෝදි ෂැංහයි සහයෝගිතා සංවිධානයේ සමුළුවට සහභාගි වීම සඳහා චීනයට ගියා. පුටින් ද මේ අවස්ථාවට එක් වුණා. මේ නිසා මෙය RIC නව සහයෝගිතාවේ උද්‍යෝගිමත් ඉතිහාසගත අවස්ථාවක් ලෙසයි සනිටුහන් වුණේ.

ක්‍රෙම්ලිනයේ ප්‍රධානියා ඉන්දීය අග්‍රාමාත්‍යවරයාට 'ආදරණීය මිතුරා' ලෙස අමතමින් ඔහුගේ සන්නද්ධ ලිමොසින් රථයෙන් මෝදි රැගෙන ගියා. ඉතා දුෂ්කර කාලවලදී පවා ඉන්දියාව සහ රුසියාව එකට සිටි බව ඉන්දියාවේ නරේන්ද්‍ර මෝදි මෙහිදි ව්ලැඩිමීර් පුටින්ට පැවසුවා.

මෝදි මෙහිදි පැවසුවේ "ඉතා දුෂ්කර අවස්ථාවලදී පවා ඉන්දියාව සහ රුසියාව සැමවිට ම උරෙන්උර ගැටී ක්‍රියා කර තිබෙනවා. අපගේ සමීප සහයෝගිතාව දෙරටේ ජනතාවට පමණක් නොව ගෝලීය සාමය, ස්ථාවරත්වය සහ සමෘද්ධිය සඳහා ද වැදගත් වෙනවා. අපගේ විශේෂ සහ වරප්‍රසාදිත උපායමාර්ගික හවුල්කාරිත්වය කලාපීය සහ ගෝලීය ස්ථාවරත්වයේ වැදගත් කුලුනක්" යනුවෙන්.

විචාරකයන්ගේ මතය වන්නේ මේ නව ඒකතුවේදී චීනයේ සරු නිෂ්පාදන ශක්තිය, රුසියාවේ බලශක්ති ආධිපත්‍යය සහ ඉන්දියාවේ ගතික සේවා ආර්ථිකය යන මේ ශක්තිමත් අංග තුන නව ගෝලිය වෙළෙඳ රටාවක ඇරැඹුමට හේතුවනු ඇති බව.

නොබෙල් සාම තෑග්ග ඩොනල්ඩ් ට්‍රම්ප්ට ද?

නිහාල් පීරිස්



2025 වසරේ නොබෙල් සම්මාන දිනා ගන්නා පුද්ගලයන්ගේ නම් ඔක්තෝබර් මාසයේ ප්‍රකාශයට පත් කිරීමට නියමිත ව තිබෙනවා. සෑම වසරක ම මෙලෙස එම නම් ප්‍රසිද්ධියට පත් කරන්නේ ඔක්තෝබර් 10 දින. මෙවර නොබෙල් සාම ත්‍යාගය ගැන විශේෂ කුතුහලයක් ඇති වී තිබෙන ආකාරයක් පෙනෙන්නේ එය දිනා ගැනීමට ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විශාල උනන්දුවක් දක්වමින් සිටීම.

නොබෙල් සාම ත්‍යාගය තමාට හිමි විය යුතු බවට ට්‍රම්ප් කල්පනා කරන ආකාරයක් දැකගත හැකියි. මේ සම්මානය සඳහා ඔහුගේ නම යෝජනා කළ පාර්ශ්ව කිහිපය අතර එක් පාර්ශ්වයක් වන්නේ පාකිස්තාන ආණ්ඩුව. ඔවුන් ට්‍රම්ප්ගේ නම යෝජනා කළේ පසුගිය අප්‍රේල් මාසයේ පාකිස්තානය සහ ඉන්දියාව අතර ඇති වූ අවි ගැටුම සමථයකට පත් කිරීමට ඔහු මැදිහත්වීම පදනම් කර ගනිමින්. පාකිස්තානය සහ ඉන්දියාව අතර මේ ගැටුම ඇති වූයේ ඉන්දියානු කාශ්මීර කලාපයේ පහල්ගම් නැමැති ප්‍රදේශයේදී ඉන්දියානු සංචාරකයන් පිරිසකට එල්ල වූ ප්‍රහාරයක් මුලික කර ගනිමින්. මේ ප්‍රහාරය එල්ල කළේ පාකිස්තානයේ සහය ලබන ත්‍රස්තවාදී කණ්ඩායමක් බවට ඉන්දියාව චෝදනා කළ අතර පාකිස්තානයේ පිහිටි එවැනි කණ්ඩායම්වල කඳවුරු ආදිය ඉලක්ක කර ගුවන් ප්‍රහාර එල්ල කළා. පසුව පාකිස්තානය ද ඉන්දියාව වෙත ප්‍රහාරයක් දියත් කළේ ඊට ප්‍රතිචාර වශයෙන්. මේ ගැටුම දෙරට අතර වඩාත් පැතිරුණු යුද්ධයක් දක්වා දුරදිග යනු ඇත් ද යන ආතතියක් බොහෝ පාර්ශ්වවලට එකල ඇති වුණා. කෙසේ වෙතත් මැයි 10 දින මේ දෙරට අතර අවි ගැටුම් නතර වුණේ සටන් විරාමයක් ඇති වීමෙන්.

> මේ ත්‍යාගය සඳහා ට්‍රම්ප්ගේ නම යෝජනා කළ තවත් කැපී පෙනෙන නායකයකු වූයේ ඊශ්‍රායල අගමැති බෙන්ජමින් නෙතන්යාහු. ඔහු ට්‍රම්ප්ගේ නම යෝජනා කළේ ඊශ්‍රායලය සහ ඇතැම් අරාබි රටවල් අතර නිල වශයෙන් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තහවුරු කිරීමට ට්‍රම්ප් විසින් ඉටු කරන ලද මෙහෙවර පදනම් කර ගනිමින්. මේ රටවල් අතර පැවැති ආතති යම්දුරකට සමනය කිරීමට මෙහිදී ඇති වූ ඒබ්‍රහම් ගිවිසුම්වලට හැකි වුණා.

ට්‍රම්ප් කියා සිටියේ මේ සටන් විරාමය ඇති වූයේ තමාගේ මැදිහත්වීමෙන් බව. එසේ නොවීනම් මේ න්‍යෂ්ටික බලවතුන් දෙදෙනා අතර න්‍යෂ්ටික යුද්ධයක් පවා ඇති වන්නට ඉඩ තිබුණු බව ඔහු පැවසුවා. එසේ ම ගැටුම අවසන් වූයේ ට්‍රම්ප්ගේ මැදිහත්වීමෙන් බව පාකිස්තාන බලධාරින් ද පවසා තිබුණා. එහෙත් ඉන්දියාව එම අදහස සමග එකඟ වූයේ නැහැ. ඔවුන් පැවසූ

ආකාරයට සටන් විරාමය ඇති වී තිබුණේ ඉන්දියානු සහ පාකිස්තාන නිලධාරීන් අතර ඇති වූ සෘජු සාකච්ඡා ඔස්සේ. ගැටුම් අවසන් වී සති කිහිපයකට පසු පාකිස්තානය නොබෙල් සාම ත්‍යාගය සඳහා ඇමරිකානු ජනාධිපතිවරයාගේ නම යෝජනා කළා.

මේ ත්‍යාගය සඳහා ට්‍රම්ප්ගේ නම යෝජනා කළ තවත් කැපී පෙනෙන නායකයකු වූයේ ඊශ්‍රායල අගමැති බෙන්ජමින් නෙතන්යාහු. ඔහු ට්‍රම්ප්ගේ නම යෝජනා කළේ ඊශ්‍රායලය සහ ඇතැම් අරාබි රටවල් අතර නිල වශයෙන් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තහවුරු කිරීමට ට්‍රම්ප් විසින් ඉටු කරන ලද මෙහෙවර පදනම් කර ගනිමින්. මේ රටවල් අතර පැවැති ආතති යම්දුරකට සමනය කිරීමට මෙහිදී ඇති වූ ඒබ්‍රහම් ගිවිසුම්වලට හැකි වුණා. පසුගිය ජූනි මාසයේ ඊශ්‍රායලය සහ ඉරානය අතර ඇති වූ යුද ගැටුම අවසන් කිරීමේදී ද ට්‍රම්ප්ගේ මැදිහත්වීම යම් කාර්යභාරයක් ඉටු කළ බව පිළිගැනෙනවා.

පාකිස්තානයට සහ නෙතන්යාහුට අමතර ව තවත් පාර්ශ්ව කිහිපයක් ද ට්‍රම්ප්ගේ නම යෝජනා කර තිබෙනවා. තමාට නොබෙල් සාම ත්‍යාගය හිමි විය යුතු බව පවසමින් ට්‍රම්ප් සඳහන් කරන්නේ තමා යුද ගැටුම් 7ක් නතර කිරීමට මැදිහත් වී ඇති බව.

යුද ගැටුම් ඇති වූ පාර්ශ්ව (රටවල්)

ඊශ්‍රායලය සහ ඉරානය
ඉන්දියාව සහ පාකිස්තානය
තායිලන්තය සහ කාම්බෝජය
කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය සහ රුවන්ඩාව
ආර්මේනියාව සහ අසර්බයිජානය
ඊජිප්තුව සහ ඉතියෝපියාව
සර්බියාව සහ කොසෝවෝ

රුසියාව සහ යුක්රේනය අතර ඉදිරියට යමින් ඇති යුද ගැටුම අවසන් කිරීම සඳහා ද ට්‍රම්ප් දැඩි උත්සාහයක් ගනිමින් සිටින බව නොරහසක්. යම් පුද්ගලයකු හෝ ආයතනයක් හෝ යම් වර්ෂයක නොබෙල් සාම ත්‍යාගය දිනා ගැනීමටනම් එම වසරේ ජනවාරි 31 දිනට පෙර එම තැනැත්තාගේ හෝ ආයතනයේ හෝ නම එම ත්‍යාගය සඳහා යෝජනා කර තිබිය යුතුයි. ට්‍රම්ප්ගේ නම එම දිනට පෙර යෝජනා වී තිබුණා ද යන්න පැහැදිලි නැහැ.

පාකිස්තානය සහ නෙතන්යාහු ඔහුගේ නම යෝජනා කළේ ජනවාරි 31 දිනට පසුව. එහෙත් ඔහුගේ නම එම දිනයට කලින් ද යෝජනා වී තිබූ බැව් ඇතැම් මාධ්‍ය වාර්තාවල සඳහන් ව තිබුණා. ඒ ගැන නිශ්චිත ව දැන ගැනීමට හැකියාවක් නැත්තේ නිල වශයෙන් යෝජනාවූවන් ගැන නොබෙල් කමිටුව වසර 50ක් යනතුරු හෙළිදරව් නොකරන

> මිය ගිය පුද්ගලයන් හැර ඕනෑ ම පුද්ගලයකු හෝ සංවිධානයක් හෝ මේ ත්‍යාගය සඳහා නිර්දේශ කරන්නට පුළුවන්. එහෙත් එම යෝජනාව ඉදිරිපත් කළ යුතු වන්නේ ඒ සඳහා අවසරය ලැබූ පාර්ශ්වයක්. එලෙස අවසර ලැබූවන් වන්නේ රාජ්‍ය නායකයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ආණ්ඩුවල සාමාජිකයන්, ඇතැම් විෂය පිළිබඳ විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්, පෙර වසරවල සාම ත්‍යාගය හිමි කරගත් පාර්ශ්ව, ජාත්‍යන්තර අධිකරණවල සාමාජිකයන් වැනි අය.

බැවින්. යමෙකුගේ නම යෝජනා වී ඇත් ද යන්න ඊට පෙර දැන ගැනීමට හැකි වන්නේ යෝජනාව කළ පාර්ශ්වය ප්‍රසිද්ධියේ ඒ බව ප්‍රකාශ කළහොත් පමණයි.

මිය ගිය පුද්ගලයන් හැර ඕනෑ ම පුද්ගලයකු හෝ සංවිධානයක් හෝ මේ ත්‍යාගය සඳහා නිර්දේශ කරන්නට පුළුවන්. එහෙත් එම යෝජනාව ඉදිරිපත් කළ යුතු වන්නේ ඒ සඳහා අවසරය ලැබූ පාර්ශ්වයක්. එලෙස අවසර ලැබූවන් වන්නේ රාජ්‍ය නායකයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ආණ්ඩුවල සාමාජිකයන්, ඇතැම් විෂය පිළිබඳ විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්, පෙර වසරවල සාම ත්‍යාගය හිමි කරගත් පාර්ශ්ව, ජාත්‍යන්තර අධිකරණවල සාමාජිකයන් වැනි අය.

නොබෙල් සාම ත්‍යාගය දිනා ගත් ඇමරිකානු ජනාධිපතිවරුන්

තියඩෝර් රූස්වෙල්ට් (1906)
වුඩ්රෝ විල්සන් (1919)
බරැක් ඔබාමා (2009)

ධුරයෙහි රැඳී සිටින අතරතුර නොබෙල් සාම ත්‍යාගය දිනා ගත් ඇමරිකානු ජනාධිපතිවරුන් තිදෙනකු ද වුණා. ඒ අතුරින් රූස්වෙල්ට්ට නොබෙල් සාම ත්‍යාගය පිරිනැමුණේ රුසියාව සහ ජපානය අතර එකල පැවති යුද්ධය අවසන් කිරීමට දැක් වූ දායකත්වය වෙනුවෙන්. ජනාධිපති විල්සන්ට වෙත සාම ත්‍යාගය ප්‍රදානය කෙරුණේ ජාතීන්ගේ ලීගය නැමැති සංවිධානය පිහිටුවීමේදී ඉටු කළ කාර්යභාරය වෙනුවෙන්. පළමු වැනි ලෝක යුද්ධයෙන් පසු 1920 වසරේ පිහිටුවන ලද මේ සංවිධානය ලෝක පරිමාණයෙන් පිහිටුවන ලද පළමු අන්තර් රාජ්‍ය සංවිධානය. ජාත්‍යන්තර සහයෝගිතාව සහ ලෝක සාමය සඳහා ක්‍රියා කිරීමයි එහි අරමුණ වුණේ. 1946 වසරේ එය විසුරුවා හරින ලද අතර එම අරමුණ වෙනුවෙන් ඉන්පසු එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහි වුණා.

බරැක් ඔබාමාට සාම ත්‍යාගය පිරිනමන ලද්දේ ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රිකභාවය ශක්තිමත් කිරීම, න්‍යෂ්ටික අවිවලින් තොර ලෝකයක් ඇති කිරීම උදෙසා ඔහු තුළ වූ දැක්ම වැනි කාරණා පදනම් කර ගනිමින්. එහෙත් ඔබාමාට සාම ත්‍යාගය පිරිනැමීම ඇතැමුන්ගේ විවේචනයට ලක් වුණා. ඔහුට මේ සම්මානය පිරිනැමුණේ ජනාධිපති පදවියට පත් ව මාස කිහිපයක් වැනි කෙටි කාලයකදී. ඔහු ඒ වනවිට මීට අදාළ ව කැපී පෙනෙන ජයග්‍රහණ කිසිවක් හිමි කරගෙන තිබුණේ නැහැ. ඔබාමා ම පවා මේ විවේචනවල සාධාරණත්වයක් ඇති බව පිළිගෙන තිබුණා.

ලෝක සැරිසර

චන්දන මාරසිංහ

ධුරයෙන් ඉවත් කළ අගමැතිවරිය

තායිලන්ත අගමැතිනි Paetongtarn Shinawatra එම තනතුරින් ඉවත් කිරීමට එරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය නියෝග කළා. කාම්බෝජයේ හිටපු නායක Hun Sen සමඟ පැවති දුරකතන සාකච්ඡාවේදී ඔහුට මාමා ලෙස ආමන්ත්‍රණය කර තායිලන්ත හමුදාව විවේචනය කරන ආකාරයේ දුරකතන හඬපටයක් ප්‍රසිද්ධියට පත් වීමත් සමඟ තායිලන්තයේ ඇති වූ නොසන්සුන්කාරී වාතාවරණය හමුවේ අධිකරණය මේ තීන්දුව ලබා දුන්නා. තායිලන්තය හා කාම්බෝජය අතර වරින් වර දේශසීමාවලදී ගැටුම් ඇති වෙනවා. එවැනි තත්ත්වයකදී ආචාරධර්ම උල්ලංඝනය ගැන අගමැතිවරියට චෝදනා එල්ල වුණා. අධිකරණ විනිසුරුවරුන් 09 දෙනාගෙන් 06 දෙනෙකු ම ඇයට විරුද්ධවයි තීන්දුව ප්‍රකාශ කළේ. එම අධිකරණ තීන්දුව පිළිගන්නා බව හිටපු අගමැතිවරිය සඳහන් කළා. නියමිත කාලයට පෙර අගමැති ධුරයෙන් ඉවත් වූ Shinawatra පවුලේ තුන් වැනියා වන අතර මීට පෙර ඇගේ පියාට සහ නැන්දාට ද අගමැති ධුරයෙන් නියමිත කාලයට පෙර ඉවත් වීමටයි සිදු වුණේ.

තහනම් වූ ගුවන් කලාපය

ඊශ්‍රායලය සමග ඇති සියලු ම වාණිජ හා ආර්ථික සම්බන්ධතා සම්පූර්ණයෙන් නවතා දැමීමට තුර්කිය තීරණය කළා. ඊශ්‍රායල ගුවන් යානාවලට තුර්කි ගුවන් කලාපය භාවිත කිරීමේ හැකියාවක් නැහැ. ගාසා තීරයේ යුද්ධය නතර නොකිරීමයි ඊට හේතුව. තුර්කි විදේශ අමාත්‍යාංශය සඳහන් කළේ ඊශ්‍රායලයේ මෙහෙයුම් නතර නොකළහොත් මුළු කලාපයට ම යුද්ධය අත වැනිය හැකි බව. තුර්කි නෞකා ඊශ්‍රායල් වරායට යොමු නොකිරීමට ඔවුන් පියවර ගෙන තිබෙනවා. ඊශ්‍රායලයේ ජන සංහාරයක් සිදු කරන බවයි තුර්කියේ අදහස. ඊශ්‍රායලයට සම්බාධක පැනවීමට මෙතෙක් කිසිදු රටක් නියමිත ක්‍රම අනුගමනය කර නැති බවටත් තුර්කිය චෝදනා කළා.

බලගතු ම රොකට්ටුව

spacex සිය නවතම පරම්පරාවේ රොකට්ටුවේ පරීක්ෂණ පියසැරිය සාර්ථක කරගෙන තිබෙනවා. ලොව විශාලතම සහ බලවත් ම රොකට්ටුව ලෙසයි එය සැලකෙන්නේ. 2027 වසර වන විට මිනිසුන් සඳට යැවීමට starship භාවිත කිරීමට නාසා ආයතනය සැලසුම් කර තිබෙනවා. 2025 වසරේ මේ පිළිබඳ අත්හදා බැලීම් තුන අසාර්ථක වීමෙන් අනතුරුවයි මෙවර උත්සාහය සාර්ථක වී තිබෙන්නේ. පෘථිවියේ සිට කිලෝමීටර් 200ක් පමණ උසකින් රොකට්ටුව ගමන් කර තිබෙනවා. starship රොකට්ටුව නිෂ්පාදනය කර තිබෙන්නේ සඳට හා අඟහරු වෙත මිනිසුන් රැගෙන යා හැකි මෙන් ම සම්පූර්ණයෙන් ම නැවත භාවිත කළ හැකි ප්‍රවාහන පද්ධතියක් ලෙස. ඉදිරි මාස දොළහක කාලයක මිනිසුන් රහිත යානයක් අඟහරු මතට යැවීම Spacex ආයතනයේ සැලසුම වී තිබෙනවා. පරීක්ෂණ ගමනේදී රොකට්ටුවට යම් ආකාරයක හානියක් සිදු වී තිබුණ ද තහවුරු කර තිබෙන්නේ එය ආරක්ෂිත යානයක් බවට.

පන්ති කාමරයේ තහනම

පාසල් පන්ති කාමර තුළදී දුරකතන භාවිතය තහනම් කිරීමට දකුණු කොරියාව තීරණය කර තිබෙනවා. ඊට ජංගම දුරකතන මෙන් ම ස්මාර්ට් උපාංග ද ඇතුළත්. ඒ අනුව යොවුන් වියේ දරුවන් අතර දුරකතන භාවිතය සීමා කරන අලුත් ම රට දකුණු කොරියාව වෙනවා. 2026 මාර්තු මාසයේ සිටයි මේ නව නීතිය ක්‍රියාත්මක වන්නේ. ජංගම දුරකතන භාවිතය හේතුවෙන් ඉගෙනීමට ගත කරන කාලය අඩු වන බව හෙළි වී තිබෙනවා. 2021 වසරේ සිදු කළ සමීක්ෂණයට අනුව දකුණු කොරියාවේ මිලියන 51ක ජනතාවගෙන් 1/4ක් පමණ දරුවන් දුරකතනය සමග වැඩි කාලයක් ගත කරනවා. මෙහි වැඩි පිරිස වයස අවුරුදු 10-19 අතරයි පසු වන්නේ. එරට තරුණයන්ගෙන් වැඩි පිරිසක් සඳහන් කර තිබෙන්නේ ජංගම දුරකතන භාවිතයෙන් ඉවත්වීමට තමන් උත්සාහ දරන බව. කොරියානු පාර්ලිමේන්තුවේ පැමිණි මන්ත්‍රීවරුන් 163 දෙනාගෙන් 115 දෙනෙකු මේ තහනම පිළිබඳ පනතට පක්ෂ ව ඡන්දය දුන්නා. මේ වන විට ෆින්ලන්තය සහ ප්‍රංශය වැනි රටවල් පාසල් දරුවන්ට දුරකතන භාවිතය සීමා කර තිබෙනවා.

කඳුකරයේ උස ම පාලම

ලොව උස ම පාලම ලෙස සැලකෙන චීනයේ Huajiang Grand Canyon පාලම බර පැටවීමේ පරීක්ෂණය සමත් වී තිබෙනවා. ඒ, ට්‍රක්රථ 96ක් (මෙ. ටො 3360ක්) පාලමේ ස්ථානගත කරමින්. ආනතියට ප්‍රතිචාර දක්වන ආකාරය සොයා බැලීමයි එහි අරමුණ. පාලමේ උස මීටර් 625ක් වන අතර දිග මීටර් 2900ක්. එය මහජනතාවට විවෘත කිරීමට පෙරයි මෙලෙස එහි ආරක්ෂිත තත්ත්වය පරීක්ෂා කර තිබෙන්නේ. Guizhou පළාතේ කඳුකර

ප්‍රදේශයක පිහිටා ඇති මේ පාලම පෙර නොවූවිරූ ඉංජිනේරු ජයග්‍රහණයක් බවයි සැලකෙන්නේ. අගෝස්තු 21-25 දක්වා එහි පරීක්ෂණ කටයුතු සිදු කරුණා. ඒ, පාලම මත ස්ථානගත කළ සංවේදක 400ක් මගින් කුලුනු සහ කේබල්වල ශක්තිය මැන බැලීමෙන්. ඒ අනුව මෙහි ආරක්ෂක පද්ධතිය සපුරාලන බවයි ඉංජිනේරුවන් සඳහන් කළේ. විවෘත කිරීමෙන් අනතුරු ව එය ලොව උස ම පාලම සහ කඳුකර කලාපයක දිග ම පාලම ලෙස සංචාරක ආකර්ෂණයට ලක්වනු ඇති.

උතුරු කොරියාවේ මිසයිල ගබඩා

උතුරු කොරියාවේ ප්‍රකාශයට පත්කර නැති බැලන්ස්ටික් මිසයිල කඳවුරු සහ ආයුධ ගබඩා 05-20ත් අතර සංඛ්‍යාවක් පවතින බව හෙළි වී තිබෙනවා. මෙයින් නැගෙනහිර ආසියාවට සහ ඇමරිකාවට පවා එල්ල වන්නේ තර්ජන. නායක Kim Jong-Un යටතේ පසුගිය වසර කිහිපයේ අවි ආයුධ නිෂ්පාදනය වැඩි කර තිබෙන අතර ඔවුන් අන්තර් මහද්වීපික බැලස්ටික් මිසයිල ද අත්හදා බලනවා. උතුරු කොරියාව වර්තමානයේ රුසියාව සමඟ පවත්වන්නේ සමීප සම්බන්ධතා. ඒ අනුව ඔවුන්ගේ ආයුධ නිෂ්පාදනයට රුසියාවේ සහාය ලැබීමට පවතින්නේ වැඩි ඉඩක්. මේ රහස් කඳවුරුවල උතුරු කොරියාවේ න්‍යෂ්ටික ආයුධ නිෂ්පාදනය වනවා. වර්ග කිලෝමීටර් 22ක පමණ විශාලත්වයකින් යුතු මේ කඳවුරු පිහිටා තිබෙන්නේ කඳු නිම්නයක. ඇතැම් කඳවුරු පිහිටා ඇත්තේ චීන දේශ සීමාවට යාබද ප්‍රදේශයක. එය උතුරු කොරියාවේ දේශපාලනික උපක්‍රමයක්. යම් ආකාරයකින් කඳවුරුවලට ප්‍රහාර එල්ල වුවහොත් චීනයට එහි බලපෑම ඇති විය හැකියි. ඒ අනුව ප්‍රහාර එල්ල කිරීමට පෙර හොඳින් සිතා බැලීමට අදාළ පාර්ශ්වවලට සිදු වනවා. චන්ද්‍රිකා ඡායාරූපවලට අනුව මේ කඳවුරේ ඉදි කිරීම් සිදු වන්නේ 2004 වසරේ පමණ සිට.

අලි මරණ ශුන්‍ය කළ කෘත්‍රිම බුද්ධිය

වන අලි දුම්රියේ ගැටීම වැළැක්වීම සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිතයෙන් සැකසූ පද්ධතියක් හඳුන්වා දීමට ඉන්දියාවේ තමිල්නාඩු පාලනය පියවර ගෙන තිබෙනවා. 2023 වසරේ දෙසැම්බර් සිට සිදු කළ ක්‍රියාකාරකම්වල වාර්තාවක් ඔවුන් 2025 අගෝස්තු මාසයේදී නිකුත් කළා. ඉන් හෙළි ව තිබෙන්නේ මේ පද්ධතිය හේතුවෙන් දුම්රිය මාර්ගවල දුම්රියේ ගැටීම හේතුවෙන් සිදුවන අලි මරණ ශුන්‍ය වී ඇති බව. තමිල්නාඩු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ ව්‍යාපෘතිය සිදු කර තිබෙනවා. කෘත්‍රිම බුද්ධිය සහිත පද්ධතිය කුලුනු 12කින් සහ කැමරා 24කින් සමන්විත වන අතර ආරක්ෂක හරස් මාර්ග 2800ක් මෙයින් ආවරණය කර තිබෙනවා. ව්‍යාපෘතියට එක් ව තිබෙන්නේ සංරක්ෂණ කාර්ය මණ්ඩල නිලධාරීන් 25ක්. අලි ඇතුන් රැක බලාගන්නා කණ්ඩායම් වෙනුවෙන් පරිසර හිතකාමී නිවාස ව්‍යාපෘතියක් ද ඔවුන් ඉදිරිපත් කර තිබෙනවා. අලි ඇතුන් සංරක්ෂණය කිරීමේ වැදගත්කම දක්වමින් ඔවුන් වාර්ෂික ව අගෝස්තු 12 දින ලෝක අලි දිනය ද සමරනවා. මේ වාර්තාව නිකුත් කර තිබෙන්නේ ඊට සමගාමී ව.

සිරගත කළ ජනාධිපති ආර්යාව

දකුණු කොරියාවේ සිරගත කර සිටින හිටපු ජනාධිපති **Yoon Suk Yeol**ගේ බිරිඳ වන Kim Keon Hee අත්අඩංගුවට ගෙන තිබෙනවා. අල්ලස් ගැනීම ඇතුළු චෝදනා ඇයට එල්ල වුණා. පැය 04ක අධිකරණ විභාගයේදී ඇය සියලු චෝදනා ප්‍රතික්ෂේප කළත් සාක්ෂි විනාශ කිරීමේ අවදානම මත අධිකරණය රැඳවුම් වරෙන්තුවක් නිකුත් කළා. දකුණු කොරියාවේ හිටපු ජනාධිපතිවරයකු සහ ආර්යාව යන දෙදෙනා ම සිරගත කළ පළමු අවස්ථාවයි මෙය. 2024 වසරේ අසාර්ථක වූ යුද නීති යෝජනාව සම්බන්ධයෙන් හිටපු ජනාධිපතිවරයා නඩු විභාගයට මුහුණ දුන් අතර අවසානයේ ඔහුට ජනපති ධුරය අත්හැරීමට සිදුවුණා. ඔහුගේ බිරිඳ වන Kim Keon Hee දකුණු කොරියාවේ වාහන අලුත් කිරීම සම්බන්ධ ආයතනයක කොටස් සම්බන්ධ මිල වංචා කිරීමේ චෝදනාවකට ලක් ව තිබෙනවා. එහිදී ඇය ඩොලර් 577,940ක් උපයා ඇති බවයි වාර්තා වන්නේ. ඇයගේ සැමියා ජනාධිපතිවරයා ලෙස සිටිය ද බිරිඳට එරෙහි ව විපක්ෂයෙන් ඉදිරිපත් වූ යෝජනා තුනක් ප්‍රතික්ෂේප කර තිබෙනවා. ජනාධිපති ධුරයේ බලතල ඊට යොදා ගැනීම සම්බන්ධයෙන් ද ප්‍රශ්න මතු වුණා.

හවුල්කාර දේශපාලනය

චීන විදේශ ඇමති **Wang Yi** ඉන්දියාවේ සංචාරයක නිරත වුණා. මෙය 2020 වසරෙන් පසුව දෙරට අතර පැවති දෙවැනි හමුව වනවා. ඉන්දීය විදේශ ඇමති **S Jaishankar** සමඟ පැවති සාකච්ඡාවේදී චීන විදේශ ඇමතිවරයා සඳහන් කළේ ඉන්දියාව සහ චීනය සතුරන් නොව හවුල්කරුවන් විය යුතු බව.

හිමාල දේශසීමාවේ ගල්වාන් නිම්නයේ මාරාන්තික ගැටුම් හේතුවෙන් රටවල් දෙක අතර සම්බන්ධතා සම්පූර්ණයෙන් ම බිඳ වැටුණා. දෙරට අතර දේශ සීමාව කිලෝමීටර් 3440ක්. මේ හමුවේදී වෙළෙඳාම, වන්දනා ගමන් සහ ගංගා ජලය බෙදා ගැනීම, ආරක්ෂක අංශ අතර ඇති වන දේශසීමා අරගල සමථයකට පත්කර ගැනීම පිළිබඳ ව අවධානය යොමු වී තිබෙනවා. චීන සංචාරකයන් සඳහා ඉන්දීය වීසා ලබා දීම හා දෙරට අතර සෘජු ගුවන් ගමන් යළි ආරම්භ කිරීම මේ හමුවේදී ගත් වැදගත් තීරණ. චීනයේ පැවැත්වූ ෂැන්හයි සහයෝගිතා සමුළුවට ඉන්දීය අගමැති මෝදිගේ සහභාගිත්වය පිළිබඳව ද සාකච්ඡා කර තිබෙනවා. දෙරට අතර ආතතිය උත්සන්න වන සිදුවීම් කලාපයේ සිදුවනවා. ඒවා නතර කිරීමයි දෙරටේ ම අපේක්ෂාව.

ඇපේ බෙහෙත්

බිනූ දිලාරා ගමගේ

ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයේ වසර 57ක් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරමින් සිටිනවා. ඒ, රජයේ ප්‍රතිපත්ති අනුව දේශීය හා ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ ප්‍රතිපත්ති පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්. ඔවුන්ගේ දැක්ම වන්නේ 'සෞඛ්‍ය සම්පන්න සමාජයක් අරභයා උසස් ප්‍රමිතියෙන් යුතු දේශීය ඖෂධ නිෂ්පාදනයේ පුරෝගාමියා වීම'. ඒ සඳහා 'උසස් ප්‍රමිතියෙන් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ, සේවා සැපයීම හා සංරක්ෂණය ඔස්සේ ජනතා අවශ්‍යතා සපුරාලන අතර ම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභ සාධනය ඉටුකරමින් සෞඛ්‍ය සම්පන්න සමාජයක් අරභයා පුරෝගාමී ව ක්‍රියා කිරීම' යනුවෙන් සුවිශේෂ මෙහෙවරක් ඔවුන් සතු වෙනවා. මෙවර 'දෙසතිය' කවරයේ කතාබහ සිදු වන්නේ ඒ පිළිබඳ විමසුමට ලක් කරමින්.

ආයුර්වේදයේ උපත

පැරණි ඉන්දියාවේ ශ්‍රේෂ්ඨ චිකිත්සා ක්‍රමයක් වන ආයුර්වේදය වනාහි ප්‍රීතිමත් වූත් ශුභදායක වූත් ජීවිතයක් උදා කර ගැනීමේ මාර්ග හා උපක්‍රම පෙන්වා දීම අරමුණුකොට ගත්තක්. දුකට පත් ලෝකයාට සැනසුම ලබා දීම පිණිස ඍෂිවරුන්ගේ පැවති ඉමහත් උද්‍යෝගය ආයුර්වේදයේ අතිවිශිෂ්ට ලක්ෂණයක්.

ආදි කාලයෙහි බ්‍රහ්ම තෙමේ ආයුර්වේදය ස්වයං භූ ඥනයෙන් අවබෝධ කරගෙන සිටි බවත් ඉන් අනතුරු ව මහා බ්‍රහ්මයාගෙන් දක්ෂ ප්‍රජාපතී ද ඔහුගෙන් අශ්විනී කුමාරවරුන් දෙදෙනා ද ඔවුන් දෙදෙනාගෙන් ශක්‍ර දේවේන්ද්‍රයා ද මුළුමහත් ආයුර්වේදය ඉතා හොඳින් හැදෑරූ බව ආයුර්වේදයේ ඉතිහාසය පිළිබඳ අනාවරණය වන පොතපතේ සඳහන්. කාලයාගේ ඇවෑමෙන් මිනිසා නානාවිධ රෝගවලට ගොදුරු වීම නිසා විවිධ පීඩාවලට හා ජීවිත හානිවලට ලක් වීම හේතුවෙන් ඔවුන් එම රෝගවලින් දුකින් මුදා ගැනීමේ අරමුණින් නිසි ක්‍රමවේදයක් සොයා ගිය අංගී රස, භාරද්වජ, අත්‍රය, පුලතිශි, කාශ්‍යප ඇතුළු ඍෂිවරුන් හිමාලය පර්වතයෙහි එක් සුබ පෙදෙසකට රැස් වී සම්මේලනයක් පවත්වා තිබෙනවා. ඒ සඳහා ලංකාවෙන් සහභාගි වී තිබෙන්නේ පුලතිශි ඍෂිවරයා. අර්ථ, ධර්ම,

ආයුර්වේද ඖෂධ සංස්ථාවේ නිෂ්පාදන

> ආයුර්වේද ඖෂධ සංස්ථාවේ නිෂ්පාදන ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ඇති රජයේ රෝහල්, පළාත් සභා, පළාත් පාලන නිදහස් බෙහෙත් ශාලා, ප්‍රාදේශීය සභා, නගර සභා, පුද්ගලික අලෙවි සැල් හා සංස්ථා අලෙවි සැල්වලට බෙදා හැරෙනවා. සංස්ථා ආයුර්වේද නිෂ්පාදන අතරට නව නිෂ්පාදන දහයක් සෑම වසරකදී ම වෙළෙඳපොළ වෙත එළි දැක්වීමේ කර්තව්‍යක් 2015 මැයි මස 29 දින සිට ආරම්භ කෙරුණේ සංස්ථාවේ උන්නතියට නවමු ප්‍රබෝධයක් ඇති කරමින්.

කාම, මෝක්ෂ යන චතුර්විධ සම්පත්තිය පිළිබඳ අසහාය හේතුව ආරෝග්‍යය බව ද රෝග සමූහයා විසින් ඒ ආරෝග්‍ය සම්පත හා ජීවිතය යන දෙක ම පැහැර ගන්නා ලද බව ද මිනිසුන් කෙරෙහි ලෙඩ පහළ වීම මහත් අන්තරායක් බව ද එම ඍෂි සමූහය පිළිගෙන තිබෙනවා. අනතුරු ව ඔවුන් ධ්‍යානයට සම වැදීමෙන් ලද ඍෂිවරුන්ගේ ධ්‍යාන දර්ශනයට අනුව මේ විපතෙහි එක ම පිහිට ශක්‍ර දේවේන්ද්‍ර බව ඔවුන්ට අවබෝධ කර ගැනීමට හැකි වී තිබෙනවා. එයින් ලද මඟපෙන්වීම අනුව යමින් භාරද්වජ ඍෂි තෙම ශක්‍ර භවනට ගොස් ශක්‍ර දේවේන්ද්‍රයා හමු වී සියලු ම ප්‍රාණීන්ට බිය උපදවන රෝග මනුෂ්‍ය ලෝකයේ පහළ ව ඇති බවත් ඒ රෝග සංසිඳුවන උපාය පිළිබඳ ව විධිමත් උපදේශ මට ප්‍රදානය කළ මැනවැ'යි ඉල්ලා සිට තිබෙනවා. එහිදී භගවත් ශක්‍ර දේවේන්ද්‍රයා විසින් භාරද්වජ ඍෂිහුගේ බුද්ධි මහිමය අවබෝධ කර ගැනීමෙන් පසු ව ආයුර්වේදය පිළිබඳ ව සියලු උපදේශ ඒ මහා ඍෂිට ප්‍රදානය කරනු ලැබුවා. ඉන්පසු මනු ලොවට පැමිණි භාරද්වජ ඍෂි තෙමේ එපරිද්දෙන් ම පෙර කී ඍෂි සමූහයාට ද සමස්ත ආයුර්වේදය හැදෑරවීමට සලස්වා තිබෙන්නේ විධිමත් ලෙස. එමඟින් රෝගී වූ සියල්ලන් ම ආයුර්වේදෝක්ත විධි සියල්ල පිළිපැදීම හේතුකොටගෙන රෝගවලින් සම්පූර්ණයෙන් නිවාරණය වීමෙන් උතුම් වූ සැපය හා දීර්ඝ ජීවනය ද ලැබූ බව ආයුර්වේද ඉතිහාසයේ සඳහන්.

ඔසු නිෂ්පාදනයට නවීන යන්ත්‍රසූත්‍ර භාවිතය

ඔසු ඇසුරුම් කිරීමේ අංශය

ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වීම

ක්‍රි.පූ. 13 වැනි ශත වර්ෂයේදී ඍෂි සම්මේලනයෙන් පසු ඇති වූ ආයුර්වේදය විජය රජුගේ ශ්‍රී ලාංකික ආක්‍රමණයත් සමඟ අංග අටකින් යුත් අෂ්ටාංගික ආයුර්වේදය භාරතයේ මෙන් ම ශ්‍රී ලංකාවේ ද ප්‍රචලිත වීම ප්‍රකට කරුණක්. විජය රජුගේ කාලයෙන් පසු පිළිවෙළින් අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, සීතාවක හා මහනුවර යන යුගවලදී ඒ ඒ කාලයේ සිටි රජවරුන් ආයුර්වේදය පිළිබඳ දස්කම් පාමින් එය දියුණු කිරීමේ උත්සාහයක යෙදුණු අවස්ථාවලට ඕනෑතරම් සාක්ෂි පවතිනවා. අනුරාධපුර යුගයේ බුද්ධදාස රජතුමා නාගයකුට ප්‍රතිකාර කිරීම, දුටුගැමුණු රජතුමා බෙහෙත් ඔරු ඉදිකිරීම හා ගිලනුන්ට ඖෂධාගාර පිහිටුවීම, විජිතපුර සටනේදී උණු ලෝදිය පිට මත හැලීමෙන් රෝගී වූ කඩොල් ඇතුට තෙල් ගල්වා සුව කිරීම යන අවස්ථා ආයුර්වේදය ක්‍රමයෙන් පවත්වාගෙන ආ බවට සාධක. මෙරට අවසාන රාජධානිය වන මහනුවර රාජ්‍ය පාලනය අවසන් වීමත් දේශීයත්වය, ස්වාධීනත්වය යනාදී සියල්ල ඉංග්‍රීසින් අතට පත් වෙමින් ජාතියක් වශයෙන් පරාධීන වීමත් මෙරට වෛද්‍ය ක්‍රමයට ද විශාල අගතිගාමී පරිසරයක් නිර්මාණය කෙරුණා.

ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීම

එබැවින් පරිහානියට පත් වෙමින් පැවතුණු මෙරට දේශීය ව පවත්වාගෙන ආ වෛද්‍ය ශාස්ත්‍ර නැවත නගා සිටුවීමේ අරමුණින් එම කාල වකවානුව වන විට ඇතැම් වෛද්‍යවරුන් ඉන්දියාවට ගොස් නැවත ආයුර්වේදය හදාරා ලංකාවට පැමිණ තිබෙනවා. එවැනි පුරෝගාමී පියවරක් අනුග මනය කළ වෛද්‍යවරුන්ගේ පෙළඹවීම අනුවයි පසු ව 1920, 1925 වර්ෂවලදී පිළිවෙළින් ගම්පහ වෛද්‍ය සංගමය, ගාලු මාතර දෙදිසාවේ වෛද්‍ය සංගම් ආරම්භ කිරීමත් සිදු වන්නේ.

1948 වර්ෂයේ ශ්‍රී ලංකාව ඉංග්‍රීසි පාලකයන්ගෙන් නිදහස ලැබීමෙන් පසු 1950 වර්ෂයේදී පමණ පැරණි සිංහල වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කිරීම පිළිබඳ කාරක සභාව ඇති කෙරුණා. එම කාල වකවානුවේ ම ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය පිළිබඳ ගැටලු පැන නැගුණු බැවින් එම ඖෂධ පිළියෙල කර ගන්නා තුරු ඇතැම් හදිසි රෝග සඳහා බටහිර බෙහෙත් වර්ග ආයුර්වේද ආරෝග්‍ය ශාලාවල රෝගීන් සඳහා යෙදීමට අවසර ලැබෙන සේ නීති පැනවුණා. ඒ සඳහා එවකට සිටි සෞඛ්‍ය ඇමැති විසින් දොස්තර ලෙනෝරාගේ සැලැස්මකට අනුව නුගවෙල ධවල පත්‍රිකාවක් නමින් පත්‍රිකාවක් ද සකස් කරනු ලැබුවා. මේ වැඩපිළිවෙළ පිළිබඳ සලකා බැලූ ආයුර්වේද වෛද්‍ය සංගමය මූලධර්මවලට පටහැනි කිසි ම දෙයක් ආයුර්වේදයට එකතු නොකළ යුතු බවට කරුණු දැක්වීමෙන් අනතුරු ව එය නතර කිරීමටයි පියවර ගෙන තිබෙන්නේ. ඉන් අනතුරු ව 1957 වර්ෂයේ ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව ආරම්භ කර, 1961 අංක 31 දරන ආයුර්වේද පනත ද සියලු ම දේශපාලන පක්ෂ සම්මත කිරීමෙන් අනතුරු ව ආයුර්වේද දෙපාර්තමේන්තුව, ආයුර්වේද වෛද්‍ය සභාව, ආයුර්වේද විද්‍යාලය, ආරෝග්‍ය ශාලා හා ආයුර්වේද පර්යේෂණ කාරක සභාව ද පිහිටුවාලීමට පියවර ගත්තා. 1965 මාර්තු 15 දින සුළු කර්මාන්ත මණ්ඩලය යටතේ නිෂ්පාදනාගාරයක් පවා පිහිටුවා පළමුවෙන් ම නිෂ්පාදන එහිදී සිදු කිරීමත් ආරම්භ කෙරුණා.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව පිහිටුවීම

1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1969 මැයි 11 දින අංක 14853/3 දරන ලංකා ආණ්ඩුවේ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව එවකට සිටි කාර්මික හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිවරයා වූ පිලිප් ගුණවර්ධන ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ස්ථාපනය කර තිබෙනවා. ඒ, ලි.ප.අ. 6/2/1/1/1 යටතේ. මෙහි මුල්කාලීන සභාපතිවරු වශයෙන් ඩබ්.ජේ.ප්‍රනාන්දු (1969-1971), නිමල් නවගමුව (1971-1974), නිශ්ශංක විජේරත්න (1974-1984), එම්.බී. රත්නායක (1984-1988) ක්‍රියා කර ඇති අතර එන්.යූ. යසපාල (2000-2003), ඩබ්.පී. වීරවර්ධන (2007-2009), සෝමවීර චන්ද්‍රසිරි (2005-2014) ඇතුළු සභාපතිවරුන් 16 දෙනෙකු යටතේ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව පවත්වාගෙන ගොස් තිබෙනවා. එහි වර්තමාන සභාපතිනිය වන්නේ ගීතාමනී සී. කරුණාරත්න (2024 සිට).

ආයුර්වේද ඖෂධ සංස්ථාවේ නිෂ්පාදන ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ඇති රජයේ රෝහල්, පළාත් සභා, පළාත් පාලන නිදහස් බෙහෙත් ශාලා, ප්‍රාදේශීය සභා, නගර සභා, පුද්ගලික අලෙවි සැල් හා සංස්ථා අලෙවි සැල්වලට බෙදා හැරෙනවා. සංස්ථා ආයුර්වේද නිෂ්පාදන අතරට නව නිෂ්පාදන දහයක් සෑම වසරකදී ම වෙළෙඳපොළ වෙත එළි දැක්වීමේ කර්තව්‍යක් 2015 මැයි මස 29 දින සිට ආරම්භ කෙරුණේ සංස්ථාවේ උන්නතියට නවමු ප්‍රබෝධයක් ඇති කරමින්. ආයුර්වේද නිෂ්පාදනවල ගෞරවයට හානි නොවන අයුරින් මේ නව නිෂ්පාදන රසායානාගාර පර්යේෂණ යටතේ නිසි ප්‍රමිතියෙන් හා ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු ව වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ සිදු කිරීම ද විශේෂත්වයක්. එම නිෂ්පාදන සඳහා නව නිෂ්පාදනාගාරයක් ආරම්භ කිරීමත් සංස්ථා ඉතිහාසයේ තවත් එක් පියවරක්. 2023 නොවැම්බර් මස 01 දින අංක 2356/21 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ද සංස්ථාවේ විෂය පථය තවදුරටත් පුළුල් කෙරුණා.

මෙය වඩාත් තහවුරු කරන්නේ 2024 වසරේ ඔක්තෝබර් 15 දින පැවති කර්මාන්ත අමාත්‍යාංශය හා ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය එක් ව 23 වැනි වරටත් සංවිධානය කරන ලද විශිෂ්ටතම කර්මාන්තකරුවන් ඇගයීම (CNCI Achiever Awards - 2024) වෙනුවෙන් මහා පරිමාණ අංශයේ රජයේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ එක ම කුසලතා සම්මානය ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව දිනා ගැනීම. එසේ ම සංස්ථාව වෙළෙඳ පොළට නිකුත් කරන නිෂ්පාදන සඳහා පවතින ISO 9001 - 2015 තත්ත්ව සහතිකය යාවත්කාලීන කර ගැනීමටත් ISO - 22000 ජාත්‍යන්තර තත්ත්ව සහතිකය ලබා ගැනීමට අදාළ මූලික කාර්ය 2024 වසර වන

විට නිමා කිරීමටත් පියවර ගෙන අවසන්. නිෂ්පාදන ක්‍රියාවලියට දැඩි අභියෝගයක් ව පවතින ඖෂධ සපයා ගැනීමේ සැපයුම්කරුවන් පාලනය යම්කිසි තිරසර මට්ටමක් දක්වා ගෙන ඒමට සංස්ථාව සතු නිකවැරටිය, මැදවච්චිය හා දංගොල්ල ඔසු උයන් සංවර්ධනය කිරීම මෙන් ම ඔසු උයන් ආශ්‍රිත ප්‍රදේශවලින් ඔසු අමුද්‍රව්‍ය රැස් කිරීම ඔවුන් ගෙන ඇති තවත් පියවරක්.

ව්‍යවස්ථාපිත අරමුණු

ආයුර්වේද ඖෂධ වර්ග, භෛසජ්ජක ද්‍රව්‍ය, සකස් කළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමේ, විකිණීමේ හා බෙදාහැරීමේ ව්‍යාපාර කරගෙන යාම; අත්‍යවශ්‍ය ආයුර්වේද සිද්ධ හා යුනානි (අමු හා නිෂ්පාදිත ඖෂධ දෙවර්ගය) ඖෂධ ආනයනය හා එම ඖෂධ වර්ග බෙදාහැරීම; ආයුර්වේද ඖෂධ පිළිබඳ ශාස්ත්‍රීය හා භෛසජ්ජක ද්‍රව්‍ය පර්යේෂණ කිරීම සහ එබඳු ඖෂධ වර්ග ප්‍රමිති කිරීම; ආයුර්වේද ඖෂධාගාර පවත්වාගෙන යාම හා ඖෂධ නිෂ්පාදනය සඳහා ආයුර්වේද ඖෂධවලින් දේශීය ඖෂධ නිපදවීම; දේශීය වශයෙන් නිපදවන අමු ආයුර්වේද ඖෂධ වර්ග මිලට ගැනීම හා එම ඖෂධ වර්ග සකස් කිරීම; ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගැනීම සඳහා කිරිපට්ටි පවත්වාගෙන යාම; ඖෂධ වර්ග පිළියෙල කිරීම සදහා අවශ්‍ය මීපැණි නිපදවීම හා මීමැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම මෙහි ප්‍රමුඛ කාර්යයන්. එසේ ම ආයුර්වේදය ප්‍රකාර ව ප්‍රතිකාර සහ සහන සපයන වෛද්‍ය මධ්‍යස්ථාන, සෞඛ්‍ය ප්‍රවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම මෙන් ම එවැනි මධ්‍යස්ථාන නිසි පරිදි ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා උචිත තැනැත්තන් සහ ආයතන සමග ගිවිසුම්වලට ඇතුළත් වීම; ආයුර්වේදය පිළිබඳ අධ්‍යයන පාඨමාලා සහ ආයුර්වේද වෘත්තියට අදාළ පුහුණු වැඩසටහන් සපයන අධ්‍යයන ආයතන නිසි කාර්ය පටිපාටි අනුග මනය කිරීමෙන් පසුව පිහිටුවීම, එවැනි පාඨමාලා සහ වැඩසටහන් තේරීම සහ සකස් කිරීම සම්බන්ධ තැනැත්තන් හෝ ආයතන සමග ගිවිසුම්වලට ඇතුළත්වීම සහ ඒ හා සම්බන්ධ දේශන පැවැත්වීම, එවැනි පාඨමාලා සහ වැඩසටහන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන තැනැත්තන් සඳහා ඩිප්ලෝමා සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීම; වාණිජ කාර්ය සඳහා භාවිත කළ හැකි වගාවේ එලදාව, අස්වැන්න හෝ අවශේෂ

> ආයුර්වේද ඖෂධ සංස්ථාවට ආරම්භයේදී ඖෂධ නිෂ්පාදනය සඳහා බලය තිබුණත් ඖෂධ බෙදා හැරීමේ බලය තිබුණේ නැහැ. මේ නිසා 1961 අංක 31 දරන පනතේ 10 වැනි වගන්තිය අනුව ආයුර්වේද නිෂ්පාදනාගාරවලට බලපාන නියෝගය යටතේ 1976 සැප්තැම්බර් 06 දින අංක 229-3 දරන විශේෂ ගැසට් නිවේදනයෙන් ඖෂධ බෙදා හැරීමේ බලය පවරා දුන්නා. එහෙත් මෙහිදී බලපා ඇති තවත් ගැටලුවක් වූයේ ඖෂධ නිෂ්පාදනය සඳහා වෛද්‍යවරුන් සිටියත් නීතිමය වශයෙන් භාවිතය සඳහා සම්මත කරගත් ආයුර්වේද ඖෂධ පන්තියක අවශ්‍යතාව.

කොටස් ඇතුළත් වන්නා වූ ද 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 77 වැනි වගන්තියේ නිශ්චිත ව දක්වා ඇති ආයුර්වේද සංග්‍රහයේ නියම කරනු ලැබ ඇති පරිදි ආයුර්වේදයෙහි නියැළීමේදී භාවිත කිරීම සඳහා වූ ද ඖෂධීය ශාක වගා කිරීම සහ එම කටයුතු නගා සිටුවීමෙහිලා උචිත තැනැත්තන් සහ ආයතන සමග ගිවිසුම්වලට ඇතුළත් වීම ශ්‍රී ලංකා ඖෂධ සංස්ථා සතු ව්‍යවස්ථාපිත අරමුණු වනවා.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සාමාන්‍යාධිකාරි ධම්මික පාදුක්ක සඳහන් කරන ආකාරයට සංස්ථාව සමඟ එක් ව ඖෂධ වගා කිරීමට, ඔසු අමුද්‍රව්‍ය සැපයීමට කැමති ආයතන හා පුද්ගලයන්ට 011-2850229 දුරකතන අංකය ඔස්සේ සම්බන්ධ විය හැකි අතර නිෂ්පාදන අලෙවි කිරීමට කැමති අයට 011-2838502 දුරකතනයෙන් ස්ථානීය හා මාර්ගගත නියෝජිත ධුර ලබා ගැනීමේ පහසුකම සලසා තිබෙනවා. පොදුවේ www.sladc.lk සංස්ථා නිල වෙබ් අඩවිය තොරතුරු සඳහා විවෘත ව තිබෙනවා.

නිෂ්පාදන ක්‍රියාවලිය හා එහි කාර්භාරය

ආයුර්වේද ඖෂධ සංස්ථාවට ආරම්භයේදී ඖෂධ නිෂ්පාදනය සඳහා බලය තිබුණත් ඖෂධ බෙදා

හැරීමේ බලය තිබුණේ නැහැ. මේ නිසා 1961 අංක 31 දරන පනතේ 10 වැනි වගන්තිය අනුව ආයුර්වේද නිෂ්පාදනාගාරවලට බලපාන නියෝගය යටතේ 1976 සැප්තැම්බර් 06 දින අංක 229-3 දරන විශේෂ ගැසට් නිවේදනයෙන් ඖෂධ බෙදා හැරීමේ බලය පවරා දුන්නා. එහෙත් මෙහිදී

ප්‍රදර්ශන සඳහා ආයුර්වේද නිෂ්පාදන කුටි පිළියෙල කිරීම

සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ ඇතුළු පිරිස ඔසු උයන්වල ඖෂධ වගා කිරීම සඳහා මූලිකත්වය දෙමින්

ලද්දේ ආයුර්වේදයේ දියුණුව පිළිබඳ සලකා බලමින්. වර්ෂ 1930 - 1932 අතර කාලයේදී එවකට පැවති සමස්ත ලංකායුර්වේද මහා සම්මේලනයේ අධිකාරින් ආයුර්වේද ඖෂධ සංග්‍රහයක (පාමකෝපියා ග්‍රන්ථයක) අවශ්‍යතාව ගැන නොයෙක් වර සාකච්ඡා කර තිබෙනවා. ඒ අනුව 1946 වසරේදී ලංකාවේ ආයුර්වේද අධ්‍යාපනය හා එම චිකිත්සා ක්‍රමය සංවර්ධනය කිරීමට අදාළ ව යෝජනා සම්පාදනයක් සඳහා දාස්ගුප්ත කොමිෂන් සභාව පත් කිරීමටත් පසු ව 1950 වසරේදී බුද්ධදාස කොමිසම පත් කිරීමටත් ක්‍රියා කර තිබෙනවා. එහෙත් ඒ සෑම අවස්ථාවකදී ම විවිධ හේතු මත අපේක්ෂිත මට්ටමේ ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් නිර්මාණය කර ගැනීමට ලංකා රජයට හැකියාවක් ලැබුණේ නැහැ. වෛද්‍යාචාර්ය ඩී.ඇම්. ජයසිංහ නැවතත් මේ පිළිබඳ අදහසක් 1963 සැප්තැම්බර් 13 දින පැවැත්වුණු 1961 අංක 31 දරන ආයුර්වේද ආඥා පනත යටතේ පත් කරන ලද ආයුර්වේද පර්යේෂණ කාරක සභා රැස්වීමකදී මතු කළා. පසු ව එයට මහාචාර්ය කේ. රාජසූරිය, මහාචාර්ය ඇස්. ඩබ්ලිව්. බිබිලේ, ආයුර්වේද චක්‍රවර්තී පණ්ඩිත ජී. ජී. වික්‍රමාරච්චි, පණ්ඩිත කවිචින්තාමණී පී. ඇම්. පී. අභයසිංහ ආදී විද්වතුන්ගේ අනුකූලතාව ද ලැබීමෙන් එම යෝජනාව වැඩිදුරටත් ක්‍රියාරම්භ වීම සිදු වෙනවා. ඒ අනුව 1963 ඔක්තෝබර් 04 දින සපයන ලද අනුකාරක වාර්තාවකට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඖෂධ සංග්‍රහයේ මූලික කාර්ය මාස 18කදී නිම කිරීමේ බලය පවරමින් පත් කරනු ලබන්නේ 'ආයුර්වේද ඖෂධ සංග්‍රහ' කොමිටිය. මේ කොමිටිය මඟින් ආයුර්වේද චක්‍රවර්තී පණ්ඩිත ජී. ජී. වික්‍රමාරච්චි වැනි ගෞරවයට පත් වෛද්‍යවරුන් 6,728කගේ අදහස් ප්‍රශ්න මාලාවක් වෙතට ලබා ගැනීමටත් වට්ටෝරු සංග්‍රහ කිරීමටත් පියවර ගන්නා අතර එහි කාර්ය එතැනින් නතර වීම සිදු වෙනවා. නැවතත් 1968 වසරේදී පත් කරන ලද නව සාමාජිකත්වයක් සහිත 'ආයුර්වේද ඖෂධ සංග්‍රහ' කොමිටියකින් ආයුර්වේද, සිද්ධ, යුනානි යන ඖෂධ ක්‍රමත්‍රය සඳහා සම්පාදක මණ්ඩල තුනක් යටතේ ආයුර්වේද සංග්‍රහයේ පළමු වැනි පියවරෙන් වැඩි කොටසක් 1970 වසර වන විට අවසන් කර ගැනීමට හැකි වී තිබෙන බව ආයුර්වේද ඖෂධ සංග්‍රහයේ සඳහන්.

ග්‍රන්ථය සම්පාදනයට අවශ්‍ය දැනුම එකතු කර ගැනීම සිදු ව තිබෙන්නේ ආයුර්වේද-සංහිතා ග්‍රන්ථ, දේශීය වට්ටෝරු ප්‍රකරණ, භෛෂජ්ජරත්නාවලී, යෝග ශතකය, සාරාර්ථ සංග්‍රහය, සිංහල යෝගරත්නාකරය, රස රක්ත සමුච්චය, පුස්කොළ පොත් (දේශීය වට්ටෝරු), ස්නේහා ශතකය (තෙල් පොත), යෝග දාරණය, සාර සංක්ෂේපය, සරස්වතී නිඝණ්ඩු යනාදී වටිනා ග්‍රන්ථවලින්. ඒ අනුව මෙහි පළමු වැනි ප්‍රකාශනය 1976 වසරේදී ප්‍රකාශයට පත් වීම සිදුවන අතර වර්තමානය දක්වා ශ්‍රී ලංකා ඖෂධ සංස්ථාව ඔසු වට්ටෝරු සකස් කිරීම සඳහා මේ 'ආයුර්වේද ඖෂධ සංග්‍රහයයි උපයෝගී කර ගැනෙන්නේ.

ඖෂධ සංස්කරණය හෙවත් ඖෂධ පිළියෙල කිරීමට අවශ්‍ය ඖෂධීය අමුද්‍රව්‍ය යොදා ගත යුතු වන්නේ ද්‍රව්‍ය ගුණ නිර්දේශ අනුව. රෝග පරීක්ෂාවෙන් අනතුරු ව වෛද්‍යවරයාගේ දෑතින් ම ඖෂධ සංස්කරණය කර රෝගියා පිළියම් යෙදීම ආයුර්වේද

බලපා ඇති තවත් ගැටලුවක් වූයේ ඖෂධ නිෂ්පාදනය සඳහා වෛද්‍යවරුන් සිටියත් නීතිමය වශයෙන් භාවිතය සඳහා සම්මත කරගත් ආයුර්වේද ඖෂධ පන්තියක අවශ්‍යතාව. ඒ අනුව එදා සිට අද දක්වා සංස්ථා නිෂ්පාදකයන්ගේ මූලික උපදේශක ග්‍රන්ථය බවට 'ආයුර්වේද සංග්‍රහය' සකස් කිරීමට පියවර ගැනෙනවා. මේ ග්‍රන්ථයෙන් පරිබාහිර ව යම් ඖෂධයක් කිසියම් හෝ ආයුර්වේද ආයතනයක් විසින් නිපදවනු ලබන්නේනම් ඒ සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය සාධකයක්.

'ආයුර්වේද ඖෂධ සංග්‍රහය' ගම්පහ ආයුර්වේද සිද්ධායුර්වේද විද්‍යාලයේ එවකට සිටි විදුහල්පති වෛද්‍යාචාර්ය ඩී.එම්. ජයසිංහ (ඩී.එස්.ජී.සී. ගෞරව) ප්‍රධාන 'ආයුර්වේද ඖෂධ සංග්‍රහ' කමිටුව විසින් සකස් කරනු ලැබ 1976 ජනවාරි මස 08 දින නිකුත් කරන

ආයුර්වේද ඖෂධ වියළීම

වෛද්‍ය ක්‍රමයේ පවතින විශේෂත්වයක්. එය රෝගය සඳහා නියම වන ඖෂධය මත ද රඳා පවතිනවා. එබැවින් ආයුර්වේද ශාස්ත්‍රයේ වෛද්‍යවරයාට ඖෂධ පිළිබඳවත් ද්‍රව්‍ය ගුණ විඥානය පිළිබඳවත් මනා දැනුමක් පැවතිය යුතු බව විශ්වාස කෙරෙන්නක්. සෑම පැළෑටියක් ම ඖෂධයක් ලෙසින් ආයුර්වේදයේදී සලකනවා පමණක් නොව එවැනි පැළෑටියක් ඒ ඒ රෝග සඳහා ඔසුවක් ලෙසින් හඳුනා ගැනීමේදී ඖෂධ නිර්ණ නියමයන් වන නියමිත ද්‍රව්‍ය හඳුනා ගැනීම, නියමිත කොටස් පමණක් යෙදීම, කාල/දිශාව දක්වා ඒ පිළිබඳ අවබෝධය තිබීම, නියමිත ප්‍රමාණ (මිනුම) යෙදීම, නියමිත පාක අවස්ථාව (සංස්කරණය) අනුගමනය කිරීම සිදු වෙනවා. මෙලෙසින් සංස්කරණය කරන ලද ඖෂධයේ හෙවත් ද්‍රව්‍යයක අඩංගු වන රසයේ ඇති ගුණ, වීර්යය, විපාක, ප්‍රභාවය නිසා රෝගියාගේ කායික හා මානසික රෝග මුළුමනින් සුව කිරීමේ හැකියාව සැලසෙනවා.

ඖෂධ නිෂ්පාදනය සඳහා මැටි භාජන භාවිතය විශේෂ වුවත් දැනට ඉන්ධන ලෙස දැව්තෙල් භාවිතයේ පවතින බැවින් වාෂ්පග්‍රාහී උදුන් මඟිනුයි අරිෂ්ට, තෙල්, ක්වාථ සිරප් නිෂ්පාදනය කරන්නේ. මේ වන විට මැටි භාජන භාවිත කරන්නේ ලෝහ ගුණැ'ති රසෞෂධ නිෂ්පාදන කිරීම සඳහා පමණයි. ආසව හා අරිෂ්ට සංස්කරණයේදී සංධාන කාර්ය සඳහා තේක්ක ලීවලින් නිර්මාණය කරන ලද විශේෂිත සංධාන භාජන භාවිත කෙරෙන අතර මෙහි උෂ්ණත්ව පාලනය කෙරෙන පරිදි සකස් කර තිබීම විශේෂත්වයක්. චූර්ණ සැකසීම හා කල්ක ඇඹරීම සිදු කෙරෙන්නේ යන්ත්‍රානුසාරයෙන්. ඇතැම් රසෞෂධ ආශ්‍රයෙන් සකසන ගුලි-වටිකා ශෝධනයට ලක් කිරීමෙන් අනතුරු ව ඖෂධ බවට පත් කර ගුලි හා පෙති බවට පත් කිරීම සිදු කරන්නේ ද මේ වනවිට යන්ත්‍ර සූත්‍රවලින්. එසේ ම ගුගුල් වර්ගවල අපවිත්‍ර දෑ ඉවත් කිරීමෙන් අනතුරු ව පෙති වශයෙන් වෙළෙඳ පොළට නිකුත් කිරීමත් සිදු වෙනවා. ශාක පැළෑටි ආශ්‍රයෙන් ඖෂධ නිෂ්පාදනය මෙන් ම විවිධ රසදිය ඇතුළු සියලු ඛනිජ, ලෝහවල ගුණැති ඖෂධ, සත්ත්ව හා විශේෂිත උද්භිද වර්ග ආශ්‍රයෙන් ආයුර්වේදයේදී ඔසු සංස්කරණය කිරීමත් දකින්නට පුළුවන්. ඒවා රසෞෂධ යනුවෙන් හඳුනා ගැනෙන අතර ඉතාමත් සුපරීක්ෂාකාරී ව සිදුවන ඖෂධ සංස්කරණ ක්‍රියාවලියක් වෙනවා. එහිදී රසෞෂධ භාවිතයට පෙර එය මිනිස් ශරීරයට හිතකර තත්ත්වයක් දක්වා ශෝධනය කිරීමේ විශේෂ ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් අනතුරු ව ඔසු ලෙස භාවිතයට ගැනීම සිදු වන අතර ශ්‍රී ලංකා ඖෂධ සංස්ථාව ඇතුළු ඉතාමත් සීමිත ස්ථාන කිහිපයක පමණයි මේ රසෞෂධ නිෂ්පාදනය සිදු වන්නේ.

ඖෂධ සංස්ථා නිෂ්පාදකයන්ගේ මූලික අවශ්‍යතාවක් වන්නේ ඖෂධ සපයා ගැනීම. දැනට සංස්ථාව විසින් අමුද්‍රව්‍ය 450කට ආසන්න ව නිෂ්පාදනයට යොදා ගන්නා අතර ඒවා අමු හා වියළි ඖෂධ වශයෙන් ද දියර වශයෙන් ද සපයා ගැනෙනවා. එහිදී ටෙන්ඩර් ක්‍රියා පටිපාටියට අනුව දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ගෙන් ඖෂධ මිලදී ගැනීමයි බහුල ව සිදු කරන ක්‍රමය. හදිසි නිෂ්පාදන අවශ්‍යතාවලදී සිදු වන්නේ පවතින සම්මත මිල ගණන් යටතේ කමිටුවකින් ඖෂධ මිල දී ගැනීම. මේ අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී බිංකොහොඹ, රත්හඳුන් වැනි දුර්ලභ ශාක වර්ග හා මිල අධික කුංකුමප්පු, කංසා, අබිං වැනි ඖෂධ වර්ග ද සපයා ගත යුතුයි. මෙලෙස ඖෂධීය ශාක නෙළා ගැනීමේදී ඖෂධ පැළයට හානියක් නොවන ආකාරයෙන් සිදු කිරීමටත් වග බලා ගැනෙනවා. එසේ ම අමු ඖෂධ වන පොතු, පට්ටා යනාදී කොටස් ගැනීමේදී ගසේ එක් පසෙකින් පමණක් කපා ඉවත් කර ගැනීමෙන් ගස විනාශ වීමට ඉඩ නොතබා ගසේ පොතු වර්ධනය පිළිබඳ සැලකිලිමත් වීමත් ආයුර්වේදයේදී සිදු කරන්නක්. මීට අමතර ව ඖෂධයේ ගුණාත්මකභාවය රැකෙන පරිදි ඔසු නෙළා ගැනීමටත් එලෙසින් එකතු කර ගන්නා ලද ඖෂධ නිසි ක්‍රමවේද යටතේ නියමාකාරයෙන් සංරක්ෂණය කිරීමටත් පියවර ගැනෙනවා. එහිදී ඒ ඒ ඖෂධ යෝග ගුණ හීනත්වය පිළිබඳ ව ද සැලකිලිමත් වැදගත්. නිදසුනක් ලෙස චූර්ණ සංස්කරණය මාස දෙකකින් හීන වීර්යයත්වයට පැමිණීම සාමාන්‍යයෙන් සිදු වන්නක්.

මේ සියල්ල පිළිබඳ සැලකිලිමත් වීම සිදු වන්නේ නිෂ්පාදනාගාර සඳහා වුවමනා අමුද්‍රව්‍ය සැපයීමේදී බර අනුව ලැබෙන ශුද්ධ ප්‍රමාණයේ හිඟකම, ගුණාත්මක බවින් අඩු අමුද්‍රව්‍ය වෙළෙඳ පොළට පිවිසීම, ව්‍යාජ ද්‍රව්‍යවල පවතින සුලබත්වය වැනි ප්‍රායෝගික ප්‍රශ්න කිහිපයකට ම වර්තමානයේදී මුහුණදෙමින්.

ඉල්ලුම හා විශ්වාසය ශක්තිමත්

ගීතාමනී සී. කරුණාරත්න
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

චීනය, ඉන්දියාව වැනි රටවලට අනන්‍ය වූ විවිධ තලයේ දේශීය වෛද්‍ය ක්‍රම ලෝකයේ පවතිනවා. ශ්‍රී ලංකාවේත් ඒ හා සමාන ව ම පවත්වාගෙන යන ආයුර්වේද, සිද්ධ, යුනානි සහ දේශීය වෛද්‍ය ක්‍රමය වශයෙන් වෛද්‍ය ශාස්ත්‍ර කිහිපයක් හඳුනා ගන්න පුළුවන්. බොහෝ රෝගීන් ක්ෂණික ප්‍රතිකාර ලබා ගැනීම් සඳහා බටහිර වෛද්‍ය ක්‍රම වෙතට යොමු වීමේ වැඩි නැඹුරුතාවක් පැවතියත් ආයුර්වේදය ඇතුළු බොහෝ දේශීය වෛද්‍ය ක්‍රම ජනගත වන්නේ යම්කිසි රෝගයක් නිශ්ශ්‍යාවට ම සුව කිරීම සම්බන්ධයෙන්. බෝ නොවන රෝගවලට මෙය වඩාත් විශේෂයි. එම නිසා හදිසි ප්‍රතිකාර සම්බන්ධයෙන් පවතින ඉල්ලුමට වඩා දිගුකාලීන ව දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ව මෙරට රෝගීන්ට ආයුර්වේදය පිළිබඳ පවතින ඉල්ලුම හා විශ්වාසය ඉතාමත් ශක්තිමත්.

ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ප්‍රධාන වශයෙන් පිහිටා තිබෙන ආයුර්වේද රෝහල්, ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා, පළාත් පාලන ආයතනවල ක්‍රියාත්මක නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා සහ පෞද්ගලික අංශ සඳහාත් ආයුර්වේද ක්ෂේත්‍රයේ රාජ්‍ය අංශයේ සියලු ම බෙහෙත් නිෂ්පාදනය සිදු කරන්නේ ආයුර්වේද ඖෂධ සංස්ථාව. රජයේ ආයුර්වේද රෝහල්වල ද ඖෂධ නිෂ්පාදනය කිරීම යම් තරමකින් පැවතුණත් ඒවා රෝහලට අවශ්‍ය ප්‍රමාණවලින් සුළු බෙහෙත් වට්ටෝරු කිහිපයකට පමණක් සීමා වෙනවා. වඩාත් සංකීර්ණ බෙහෙත් වට්ටටෝරු නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියටකට අනුගත ව අරිෂ්ට වර්ග, කල්ක වර්ග, තෙල් වර්ග සහ රස බෙහෙත් නිෂ්පාදනය කිරීම සිදු වන්නේ ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන්.

සංස්ථාව සතු ව දැනට පවතින්නේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා යටතේ අධීක්ෂණය වන නිෂ්පාදනාගාර දෙකක්. ආයුර්වේද වට්ටෝරු අනුව නිෂ්පාදනය වන බෙහෙත් සියල්ල ම නාවින්න පරිශ්‍රයේ පිහිටන ප්‍රධාන නිෂ්පාදනාගාරයෙන් සකස් කෙරෙන අතර අප හඳුන්වා දෙන නව නිෂ්පාදන මූලික වශයෙන් පතිරගොඩ ප්‍රදේශයේ නව නිෂ්පාදනාගාරයේ සිදු වෙනවා. 'ලාවණ්‍ය' නමින් හඳුන්වන සුදුහඳුන්, රත්හඳුන්, පපායා, පිපිඤ්ඤා, කැරට් ෆේස් වොෂ් වර්ග සහ වෙනිවැල්, සමට ඉතාමත් ගුණදායක පංචවල්කල යන බොඩි වෝෂ් වර්ග අපගේ නව නිෂ්පාදන වර්ග ලෙසින් වෙළෙඳ පොළට නිකුත් වෙනවා. පහසුවෙන් පරිහරණය කළ හැකි ලෙස තේ බෑග් ආකාරයෙන් ඇසුරුම් කරන ලද රසම් පානය, ඉරමුසු තේ, කුරුඳු තේ, මස්බැද්ද තේ, නෙල්ලි රසකිඳ පානය, කොතලහිඹුටු තේ, පාවට්ටා පානය වැනි පාන වර්ග කිහිපයක් ද හඳුන්වා දී තිබෙනවා.

ඔසු වැවීම සඳහා නිකවැරටියේ අක්කර 50ක, ඔසු උයනක් මැදවච්චියේ අක්කර 35ක, දංගොල්ල අක්කර 10ක යනාදී වශයෙන් ඔසු උයන් තුනක් දැනට පවත්වාගෙන යන්නේ වඩාත් තිරසර අයුරින්. විවිධ පාරිසරික හේතු පිළිබඳ සලකා බලමින් වඩාත් වැඩි වශයෙන් ඔසු වැවීම සිදු වන්නේ නිකවැරටිය ඔසු උයනේ. එහි පොල් ගස් 60ක් පමණ සිටුවා තිබෙනවා. ඖෂධ සඳහා අවශ්‍ය කරන කහ, නික පත්‍ර, මලිත මල්, දෙහි, සමන්පිච්ච පත්‍ර, කෝමාරිකා, නෙල්ලි, හීන් අරත්ත සපුරා ගැනීමට අවශ්‍ය ශාක වගා කිරීමත් සිදු වෙනවා. 'ජාතික ඔසු වගා වැඩසටහන' යටතේ ඒ ඒ දිස්ත්‍රික්කවල දේශගුණික තත්ත්ව මත වගා කළ හැකි ඔසු පැළෑටි හඳුනාගෙන වගා කිරීමේ වැඩසටහනක් ද ආරම්භ කළා. ඒ අනුව අදාළ දිස්ත්‍රික් කොමසාරිස්වරු දැනුවත් කර තිබෙනවා ඒ ඒ දිස්ත්‍රික්කවල වගා කිරීමට සුදුසු සහ අපට මිලදී ගත හැකි ඔසු වර්ග පිළිබඳ ව. මෙය දීප ව්‍යාප්ත ව ඖෂධ ශාක බහුල කිරීමේ වැඩපිළිවෙළක්. ගෘහණියන්ට, කුඩා පරිමාණයේ ව්‍යාවසායකයන්ට මෙහිදී ඔසු සැපයුම්කරුවකු වශයෙන් සම්බන්ධ වීමේ හැකියාව තිබෙනවා. එමෙන් ම ප්‍රජා සෞඛ්‍ය ආයුර්වේද වෛද්‍ය නිලධාරින් නියැළී සිටිනවා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වෙන ම ඔසු වගා කිරීමේ ව්‍යාපෘතියක. පනත ප්‍රකාර ව පවරා දී තිබෙන බලතල යටතේ මී මැසි වගාව සඳහා මේ වනවිට නියමු ව්‍යාපෘති කිහිපයක් බස්නාහිර පළාතේ ආරම්භ කිරීමටත් අපේක්ෂා කරනවා.

සංස්ථාව බෙහෙත් සකස් කරන්නේ 35%ක් පමණ ඉන්දියාවෙන් ආනයනය කර ලබා ගන්න ඖෂධවලින්. මහා පරිමාණයෙන් ඉන්දියාවේ ඔසු වගා කරන නිසා අඩු මුදලට ඒවා මිලදී ගැනීමේ හැකියාව දැනට තිබෙනවා. එමෙන් ම ඇතැම් ඖෂධ විදේශ වෙළෙඳ පොළේ පැවතුණත් මෙරට නිෂ්පාදනය කරන ඖෂධවලට වුවමනා වන්නේ මෙරටට ආවේණික දේශීය ඔසු පැළෑටි ප්‍රභේදය ම වන අවස්ථා තිබෙනවා. එවිට අප ඒවා සපයා ගන්නේ දේශීය ව. සාමාන්‍යයෙන් මිලියන 50ක පමණ ඖෂධ නිෂ්පාදනයක් වාර්ෂික ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව සිදු කරනවා. එය මිලියන 120ක් පමණ වෙනවා විකුණුම් වටිනාකමින්. මෙවර අය වැයෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුවට හා රජයේ රෝහල්වල ඖෂධ සඳහා මුදල් අමාත්‍යාංශය වැඩි මුදලක් වෙන් කර තිබෙනවා. එම නිසා නිෂ්පාදනය වැඩි කර මිල අඩු කිරීමේ ව්‍යායාමයක

නිරත වෙමින් සිටිනවා දැනට පවතින ආයුර්වේද ඖෂධවල ඉහළ මිල ගණන් අඩු කිරීමට. නිෂ්පාදනය වැඩි කිරීමට සරිලන අයුරින් සැපයුම්කරුවන්ගේ ජාලය පුළුල් කිරීම දැනට පවතින ගැටලුවක්. සැපයුම්කරුවන්ගේ එක් ජාලයකිනුයි දැනට ඔසු නිෂ්පාදනය සඳහා අවශ්‍ය සැපයුම් සම්පාදනය සිදු කරන්නේ. ඒ අතර ප්‍රධාන ආනයනකරුවන් කිහිප දෙනෙකු සහ අමු ඖෂධ සපයා ගැනීම සඳහා දීප ව්‍යාප්ත වූ කුඩා පරිමාණයේ සැපයුම්කරුවන් ජාලයක් ද තිබෙනවා. ඔවුන් වටා ග්‍රාමීය නිවෙස් කේන්ද්‍රීය කරගත් ඖෂධ සපයන කණ්ඩායම් ඒකරාශී වී සිටිනවා.

සැපයුම්කරුවන්ගෙන් ලබා ගන්නා ඖෂධවල ගුණාත්මකභාවය පිළිබඳ සැලකිලිමත් වීමේදී ලබා ගන්නා ඖෂධවල නියැදි පරීක්ෂාව, තොග පරීක්ෂාව සිදු කරන්නා සේ ම නිෂ්පාදන ක්‍රියාවලිය අතරතුර නියැදි පරීක්ෂණ කිහිපයකටත් වෛද්‍ය සහ රසායනික පරීක්ෂණ දෙකකටත් නිෂ්පාදනය භාජනය කෙරෙනවා. එලෙස මහජන පරිභෝජනයට සුදුසු ද යන්න තහවුරු කර ගැනීමෙන් අනතුරුවයි වෙළෙඳ පොළට ඒවා නිකුත් කෙරෙන්නේ. මෙලෙසින් නිකුත් කරන සියලු නිෂ්පාදන ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද නිෂ්පාදන. මීට සමගාමී ව කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයෙන් සමීක්ෂණය කර රසායනික වාර්තා ලබා දෙන ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීමේ ඒකාබද්ධතා ගිවිසුමක් ඖෂධ සංස්ථාව අත්සන් කළා. දේශීය වෛද්‍ය විද්‍යායතනයේ දැනට එවැනි ඖෂධ දෙකක් පරීක්ෂණ මට්ටමේ පවතිනවා. එසේ ම සංස්ථාවේ නව නිෂ්පාදන සම්බන්ධ ඉදිරි කාර්ය මෙහෙයවීම වෙනුවෙන් 'පර්යේෂණ සහ සංවර්ධන කමිටුව' (Research and Development Committee) පිහිටුවා එමඟින් නව නිෂ්පාදන පෙළක් වාර්ෂික ව වෙළෙඳ පොළට නිකුත් කිරීමත් සිදු වන්නක්.

දැනට අප පෞද්ගලික වෙළෙඳ පොළට ප්‍රවේශ වන්නේ දීප ව්‍යාප්ත අලෙවි නිෂ්පාදන සැල් 13ක් හා ක්‍රියාකාරී නියෝජිත ආයතන 40 ඔස්සේ. එහිදී ඕනෑ ම අයෙකුට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ www.sladc.lk නිල වෙබ් අඩවියට පිවිස රු.1000ක මුදලක් බැර කිරීමෙන් පසු ව අපගේ අලෙවි නියෝජිතයෙකු ලෙස ක්‍රියා කිරීමේ පහසුකම් සපුරා දී තිබෙනවා. රාජ්‍ය මාධ්‍ය සම්බන්ධ ප්‍රචාරණ වැඩසටහන්, ප්‍රදර්ශන කුටි පැවැත්වීම, විවිධ වැඩමුළු සංවිධානය කිරීමත් අලෙවි ප්‍රචාරණය සම්බන්ධයෙන් ආයුර්වේද ඖෂධ සංස්ථාව දැනට සිදු කෙරෙන වැඩපිළිවෙළට අයත්.

ආයුර්වේද ඖෂධ නිෂ්පාදන අලෙවි ජාලා වෙත බෙදා හැරීමට සුරක්ෂිත ව අසුරමින්

ආයුර්වේද සංස්ථාව මූල්‍යමය වශයෙන් ශක්තිමත් සහ ස්වයංපෝෂිත ආයතනයක්. 2023 වර්ෂයේ සිට මූල්‍යමය වශයෙන් එය ලාභදායී තත්ත්වයකට පත් ව තිබෙනවා. සංස්ථාව රජයට බදු ගෙවීමෙන් පසු ලාභයෙන් 30%ක කොටසක් භාණ්ඩාගාරයටත් ලබා දෙනවා. 2022 සහ 2023 වර්ෂ සඳහා මේ සියලු පියවීම් අප සිදු කර අවසන්. 2024 වර්ෂයේ ගෙවීම් සිදු කරගෙන යනවා. 2025 වර්ෂයේදී සංස්ථාවේ නඩත්තු කිහිපයක් සිදුකොට නවීන තාක්ෂණික යන්ත්‍රසූත්‍ර කිහිපයක් නිෂ්පාදන ක්‍රියාවලියට හඳුන්වා දීමත් බලාපොරොත්තුවක්. එමඟින් නිෂ්පාදන ධාරිතාව වැඩි කර මිනිස් ශ්‍රමය වෙනත් ඵලදායී කාර්ය සඳහා යොදවා ගැනීමටයි අපේක්ෂාව.

සංස්ථාව තුළ ම පමණක් සිදු කිරීමට අවශ්‍ය නොමැති ඇතැම් සේවා සඳහා පිටතින් මුදල් ගෙවා සපයා ගැනීමෙන් (Outsourcing) ආයතනයෙන් පිටත රැකියා අවස්ථා ජනනය සඳහා වැඩපිළිවෙළක් නිර්මාණය කිරීමත් ඉදිරි සැලසුමක්. පතිරගොඩ ප්‍රදේශයේ රසෞෂධ නිෂ්පාදනාගාරයක් ආරම්භ කිරීම සඳහා දැනට ආයෝජනය කර තිබෙනවා රු. මිලියන 38.5ක්. පෞද්ගලික අංශයේ ප්‍රමුඛ පෙළේ දේශීය ඖෂධ නිෂ්පාදන අලෙවි ආයතන දෙකක් සමඟ ඔවුන්ගේ සන්නාම යටතේ අවශ්‍ය නිෂ්පාදන සිදු කර දීමට අදාළ ඒකාබද්ධ ගිවිසුම් සඳහා සැලසුම් සකස් කරමින් සිටිනවා. ප්‍රමිතිගත කොන්දේසිවලට අනුකූල ව ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා මිල ගණන් කැඳවීමත් ඉදිරි අපේක්ෂාවක්. මීට අමතර ව මූලික ප්‍රතිකාර බොහෝ විට බටහිර වෛද්‍ය ක්‍රමය ඔස්සේත් රෝගයෙන් නිවාරණය කිරීමේ දිගුකාලීන ප්‍රතිකාර දේශීය ආයුර්වේදය ඔස්සේත් ලබා දිය හැකි ඒකාබද්ධ ක්‍රමවේදයක් සකස් කිරීමත් වැදගත්. දැනට අම්පාර රෝහලේ එලෙසින් ප්‍රතිකාර කෙරෙනවා. කොළඹ ජාතික රෝහලේත් බොරැල්ල ජාතික ආයුර්වේද රෝහලේත් එවැනි ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කාර්ය දැනට පවතින්නේ සාකච්ඡා මට්ටමේ.

කීර්තිමත් රාජ්‍ය ව්‍යවසායයක්

ධම්මික පාදුක්ක
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

මෙරට ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයේ මහගෙදර වන ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වසර 55කට අධික ජාතික සුව සේවාවක් ඉටුකරමින් සිටින කීර්තිමත් රාජ්‍ය ව්‍යවසායයක්. රජයට බරක් නොවී ස්වයං මූල්‍ය පදනමක් සහිත ව පවත්වාගෙන යන ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ඖෂධ කාණ්ඩ 150කට අධික ව හා නිෂ්පාදන 500ක් පමණ දීප ව්‍යාප්ත ව ආයුර්වේද රෝහල්, බෙහෙත් ශාලා, වෛද්‍යවරුන් හා ජනතාව වෙත බෙදා හරිනවා. ගෙවුණු වකවානුවේ පැනනැගි අභියෝග රැසක් මැද වුවත් අප පැමිණි ගමන් මග ගැන සාමාන්‍යාධිකාරිවරයා ලෙස මාහට තිබෙන්නේ ඉමහත් සතුටක්.

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් තත්ත්ව සහතික සහිත ව වෛද්‍යවරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ නිසි ප්‍රමිතියෙන් යුතු ව සිදු කරන ඖෂධ නිෂ්පාදනය තවදුරටත් පුළුල් කරමින් 'නව නිෂ්පාදන සංවර්ධන කමිටුව' ආයතන හා ක්ෂේත්‍රයේ විද්වතුන් සමඟ එක් ව ක්‍රියා කරනවා. මෙහිදී 2025 වර්ෂයේ නව නිෂ්පාදන 06ක් හඳුන්වා දීමත් දේශීය වෙළෙඳ පොළෙහි අලෙවිය වැඩි කිරීමත් ඖෂධ අපනයනයෙන් විදේශ විනිමය ඉපයීමත් සිදු වනු ඇති.

ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් සපයා ගන්නේ දේශීය වශයෙන්. අමුද්‍රව්‍ය ආනයනය ද සිදු කරනවා. වර්තමානයේ ක්‍රියාත්මක ජාතික ඔසු වගා වැඩසටහන යටතේ දේශීය වශයෙන් ලබාගත හැකි අමුද්‍රව්‍ය උපරිම ලෙස දේශිය ව වගා කර ගැනීමෙන් වගා හා සැපයුම් ප්‍රජාවගේ ආදායම ඉහළ යෑමට එය බලපානවා. එවිට ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් වන නිසා එය යහපත් තත්ත්වයක්.

මව්බිමේ සාරවත් බවින් උපන් ඔසු ශාක, ආයුර්වේද ඖෂධ නිෂ්පාදන බවට පත් කර ජනතාව සුවසෙතින් ස්වයංපෝෂිත කිරීමේ අභිලාෂයෙන් යුතු ව සේවයට කැපවී සිටින ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ඉදිරි අපේක්ෂාව වන්නේ රාජ්‍ය නිලධාරින්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයන් ලෙස හා නන් අයුරින් සම්බන්ධ වන ඔබ සමග එක් ව තවදුරටත් ජාතික මෙහෙවර ඉටු කිරීම.

වර්තමානයේ ක්‍රියාත්මක ජාතික ඔසු වගා වැඩසටහන යටතේ දේශීය වශයෙන් ලබාගත හැකි අමුද්‍රව්‍ය උපරිම ලෙස දේශිය ව වගා කර ගැනීමෙන් වගා හා සැපයුම් ප්‍රජාවගේ ආදායම ඉහළ යෑමට එය බලපානවා. එවිට ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් වන නිසා එය යහපත් තත්ත්වයක්.

ශරීරයට හානිකර කිසිදු බලපෑමක් නැහැ

නිල්මිණී ගුණසේකර
ප්‍රධාන වෛද්‍ය නිලධාරී
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ආයුෂය යහපත් ව පවත්වා ගන්නේ කෙසේ ද?, ආයුෂය වර්ධනය කර ගන්නේ කෙසේ ද? යනාදී වූ ආයුෂය පිළිබඳ හදාරන විද්‍යාවයි 'ආයුර්වේදය'. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මෙරටට පැමිණ තිබෙන්නේ ඉන්දියාවෙන්. ඒ අනුව සිදු ව තිබෙන්නේ දේශීය වශයෙන් හඳුනා ගැනෙන 'ආයුර්වේදය', සැබවින් ම ඉන්දියානු සම්භවයක් සහිත ව මෙරට දේශීය ආරකින් භාවිතයට ගැනීමක් නිසා දේශීය ආයුර්වේදයේදී ඖෂධ නිෂ්පාදනය සිදු වන්නේ ද ඉන්දියානු ඖෂධ හා දේශීය ඖෂධවල සම්මිශ්‍රණයකින්. එමෙන් ම ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයට අමතර ව සංස්ථාව සිද්ධ, යුනානි ඖෂධ වට්ටෝරු නිෂ්පාදනය කරනවා.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ප්‍රධාන වශයෙන් සිදු කරන්නේ ශාකමය සහ රසදිය ආශ්‍රිත ඛණිජ ලවණ යොදාගෙන සිදු කරන ඖෂධ සංස්කරණය. ශාකමය ඖෂධ වශයෙන් චූර්ණ, කල්ක, අරිෂ්ට ආසව යනාදිය හඳුනා ගැනීමට පුළුවන්. දශාංගලේප චූර්ණය, මණිභද්‍ර චූර්ණය, ධාත්‍රී චූර්ණය, අවිපත්තිසාර චූර්ණය වැනි චූර්ණ වර්ග ආයුර්වේදයේ තිබෙනවා. ඒවා භාවිතයට ගන්නේ පිරිසිදු කරගත් විවිධ වර්ගයේ ඔසු වියළා සියුම් කුඩු බවට පත් කිරීමෙන් පසු ව උණු වතුර හෝ මී පැණි හෝ සමඟින්. කල්ක භාවිතය සඳහා ඔසු ද්‍රව්‍ය පිරිසිදු කර ඒවා වියළා ලබා ගන්නා කුඩු පැණි, දෙහි ඇඹුල් වැනි ද්‍රව්‍යයක් සමඟ අඹරා තෙතමනය මුසු පදමක් ආකාරයෙන් ලබා ගැනෙනවා. එසේ ම ශාකමය ඖෂධ ලෙස සිදු කෙරෙන්නේ රසායන මෝදක නිෂ්පාදනය. කසාය, චූර්ණය, මලිත මල් යනාදී ඔසු එකතු කර මාසයක කාලයක් සන්ධානයේ තැබීමෙන් ඖෂධය තුළ ම ඖෂධය කල් තබා ගැනීමට අවශ්‍ය ඇල්කොහොල් ප්‍රමාණය සැකසෙන්නට තබා අරිෂ්ට

ඖෂධ ප්‍රමිති පවත්වා ගැනීම

ඉතා වැදගත්

ආයුර්වේද ඖෂධ රාජ්‍ය අංශයට නිෂ්පාදනය කිරීමේත් නිමි ඖෂධ සැපයීමේත් ඖෂධ හා අමුද්‍රව්‍ය ආනයනය කිරීමේත් ප්‍රධාන ඒකාධිකාරය පවතින්නේ ආයුර්වේද සංස්ථාවට. එබැවින් අමුද්‍රව්‍ය සපයා ගැනීම, ඖෂධ නිෂ්පාදනය හා බෙදා හැරීමට අදාළ සංස්ථාව සතු සම්පත් කළමනාකරණය, සැපයුම් ජාල ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම වඩාත් වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ මේ වන විට ඖෂධ අමුද්‍රව්‍ය 1500ක පමණ සංඛ්‍යාවකින් ප්‍රභේද 450ක පරාසයක් සහිත ව ඖෂධ වට්ටෝරු 150ක් පමණ වෙළෙඳ පොළට නිකුත් කරනවා. එසේ සිදුවන නිෂ්පාදන සඳහා අප සතු ව පවතිනවා වෙන ම සැපයුම් ජාලයක්. එහෙත් බාහිර සැපයුම් ජාල මත තවදුරටත් යැපීමට සිදු වීම නිසා ඇතැම් අවස්ථාවල ඇතැම් ඖෂධ නිෂ්පාදනය තාවකාලික ව නවතා තැබීම කොතෙකුත් සිදු වෙනවා. නිදසුනක් විදිහට මේ දවස්වල ගුණාත්මක බවින් යුතු 'සුරිඤ්ඤං' අමුද්‍රව්‍ය වෙළෙඳ පොළේ නොමැති නිසා එයින් නිපදවන ඖෂධ නිෂ්පාදනය නවතා දමා තිබෙන්නේ තාවකාලික ව. එසේ වූ විට රාජ්‍ය අංශයට ලබා දීමට තිබෙන සැපයුම් ජාලය ම තාවකාලික ව නැවතෙනවා.

එවැනි අවස්ථාවල පෞද්ගලික අංශයේ සැපයුම්කරුවන්ගෙන් ඖෂධ මිල දී ගැනීමට සිදුවීම කෙටිකාලීන විසඳුමක්. ඉන් අදහස් වන්නේ නැහැ අප පෞද්ගලික සැපයුම් ජාලය අත්පත් කර ගන්නා බවක්. එබැවින් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඖෂධ ප්‍රමිති පවත්වා ගැනීමේ වැදගත්කම

ආසව නිෂ්පාදනය කිරීමත් මේ ශාකමය ඖෂධ ගණයෙහිලා ගැනෙන්නක්. කටුවැල් බටු, එළබටු මුල්, පොල්පලා, හීන්එරිත්ත, තොරනමුල්, ඇත්තෙමට මුල්, අත්නෙටුල්, දියමිත්ත, කැහිබිත්තන්, බැවිල, කොත්තමල්ලි, වියළි ඉඟුරු, කුරුඳු පොතු යනාදී වශයෙන් වූ බොහෝ ඖෂධීය ශාක වර්ග එකතුවකින් අරිෂ්ට වර්ග කිහිපයක් ම සංස්ථාව නිෂ්පාදනය කරනවා. 'දශමූලාරිෂ්ටය', 'බලාරිෂ්ටය', 'අශ්වගන්ධාරිෂ්ටය', 'මුෂ්ඨක්‍යාරිෂ්ටය', 'ද්‍රාක්ෂාරිෂ්ටය', 'නිම්බාරිෂ්ටය' ඒ විදිහට සකසන අරිෂ්ට කිහිපයක්. ශාකමය ඖෂධවල වටිනාකමනම් ඒවා රෝග නිවාරණයට මෙන් ම සාමාන්‍ය ජීවිතයේදී ද සුවයෙන් සිටීම සඳහා භාවිතයට ගැනීමට හැකි වීම සහ ඖෂධ ගැනීමේදී ඒවා ලබා ගත් මාත්‍රාවේ වෙනසක් සිදු වුවත් ඉන් ශරීරයට ඇති කරන බලපෑම හානිකර නොවීම.

ශාකමය නිෂ්පාදනවලට අමතර ව රසදිය හා ඛණිජ ආශ්‍රිත ඖෂධ සැකසීමත් සිදු වෙනවා. එහිදී රසදිය, සාදිලංගම්, රන්හිරියල්, මනෝසීල වැනි ලවණ වර්ග ශරීරයට සුළු වශයෙන් ලබා ගැනීම ඇතැම් රෝග නිවාරණයේදී වැදගත්. එබැවින් ආයුර්වේදයට ම ආවේණික ක්‍රවේදයටකට අනුව ශෝධනය කර ශරීරයට හිතකර වන අයුරින් රසෞෂධ නිපදවීම සිදු කෙරෙනවා. සීතාරාම්බධී, උත්තුංජයරස, බුද්ධරාජ කල්කය එලෙසින් සකසන ඖෂධවලට නිදසුන් කිහිපයක්. ශාකමය ඖෂධ ගැනීමේදී නිසි ප්‍රතිඵල ලැබීමටනම් සාමාන්‍යයෙන් වැඩි මාත්‍රාවකින් ශරීරයට ලබා ගැනීමට සිදුවන නමුත් මෙවැනි රසෞෂධ ඉතාමත් සුළු මාත්‍රාවක් හෙවත් රත්තිකාවක් (ඔලිඳ ඇටයක ප්‍රමාණයෙන්) ගැනීමට අවශ්‍ය වන බැවින් බෙහෙත් ලබා ගැනීමේදී ඇති වන අපහසුතා බොහෝදුරට අවම කර ගැනීමට හැකියාව තිබෙනවා. එසේ ම මේ ඖෂධවල ඵලදායිතාව ඉහළ බැවින් ශරීරයට ඉක්මනින් අවශෝෂණය වීමත් තවත් ලක්ෂණයක්. මෙහිදී ලබා දෙන මාත්‍රාව පිළිබඳ වඩාත් සැලකිලිමත් වීම වැදගත් වන අතර වෛද්‍ය නිර්දේශය මත මෙවැනි ඖෂධ ලබා දීම සාමාන්‍යයෙන් සිදු වන්නනක්.

බෝ වන සහ බෝ නොවන රෝග දෙවර්ගය සඳහා ම ආයුර්වේද සංස්ථාව ඖෂධ නිෂ්පාදනය කරනවා. බෝ නොවන රෝග අතරින් දියවැඩියාව සඳහා 'මධුමේහහරණී ක්වාථය', කොලෙස්ටරෝල් සඳහා 'මේදහරණී ක්වාථය' වැනි ඖෂධත් බෝ වන රෝග සඳහා 'සීතාරාම වටී', 'මෘත්‍යුංජය රස, 'සුවධරණී කැප්සියුලය' වැනි ඖෂධත් නිෂ්පාදනය කරනවා. මීට අමතර ව ස්නායු රෝග, ස්ත්‍රී රෝග, වාත රෝග, මිග්‍රේන් සහ හිසරදය, කොන්ද කැක්කුම්, සන්ධි ආබාධ හා අස්ථි රෝග යනාදී බොහෝ රෝග සඳහා ඖෂධ නිෂ්පාදනය කරනවා. මේ සියලු රෝග සඳහා ඖෂධ වට්ටෝරු සකස් කරන්නේ 'ආයුර්වේද ඖෂධ සංග්‍රහය' නම් ග්‍රන්ථයට අනුකූල ව. එහි සාම්ප්‍රදායික ආයුර්වේද ඖෂධ වට්ටෝරු සකස් කිරීමට අවශ්‍ය විධි හා ශිල්ප ක්‍රම අන්තර්ගත වී තිබෙනවා. එහෙත් ඇතැම් ඖෂධ සංස්කරණ විධි ඒ ආකාරයෙන් ම වර්තමානයේ සිදු කිරීම පහසු නැහැ. ඒ අනුව මේ ඖෂධ වට්ටෝරු පොතෙන් බැහැර ව ඖෂධ කිහිපයක් 'පර්යේෂණ හා සංවර්ධන කමිටුවෙන්' හඳුන්වා දී නිෂ්පාදනය කිරීමට අවශ්‍ය වට්ටෝරු අනුමත කරගෙන තිබෙනවා. බලාකෝරණ්ඩ තෛලය, කුබ්ජප්‍රසාරිණී තෛලය ඒවයින් කිහිපයක්. මීට අමතර ව රූපලාවණ්‍ය ඖෂධ හා අනෙකුත් නිෂ්පාදන සිදු කිරීමේදී ද මේ සංග්‍රහයේ සඳහන් කරුණුවලට අමතර ව නව තාක්ෂණික ක්‍රමෝපාය හා පර්යේෂණාත්මක දත්ත සලකා බැලෙනවා.

ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීම

පිළිබඳ ව වඩාත් සැලකිලිමත් වෙමින් 'ගොවි පොළෙන් කර්මාන්ත ශාලාවට' (Farm to Factory) යන සංකල්පය මත පිහිටුවා අවශ්‍ය පියවර ගැනෙනවා. මෙහිදී අප ආනයන කරන ඖෂධවලින් 50%ක් පමණ දේශීය වශයෙන් නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව පවතිනවා. එක් අතකින් එය විදේශ විනිමය ඉතිරි කර ගැනීමක්. අනෙක් අතට දේශීය ව්‍යවසායකයන් ශක්තිමත් කරමින් ග්‍රාමීය ආර්ථිකයට සිදු කරන්නේ යහපතක්. සංස්ථාවේ අනුදැනුම මත නිෂ්පාදන අමුද්‍රව්‍ය සකස් වන විට ඒවා වෙළෙඳ පොළෙන් ලබා ගැනීමේදී සිදු කළ යුතු තත්ත්ව පරීක්ෂණ සඳහා යන වියදම ඉතිරි කර ගැනීමටත් හැකියාව තිබෙනවා. එසේ ම ගබඩා කිරීමේදී යොදන රසායනික ද්‍රව්‍ය නිසා ඖෂධයට සිදුවන හානිය වළක්වා ගනිමින් වඩාත් නැවුම් ව ඖෂධ සංස්කරණය සඳහා යොදා ගැනීමටත් මේ සංකල්පය අනුගමනයෙන් පුළුවන්. දේශීය ව සපුරා ගැනීමට පුළුවන් ඖෂධ හැකි උපරිමයෙන් සපයා ගනිමින් නිෂ්පාදන සිදු කිරීමටයි අප උත්සාහ කරන්නේ. එසේ කළ නොහැකි තත්ත්ව කිහිපයකුත් තිබෙනවා. ආයුර්වේදය ඉන්දියානු සම්භවයක් සහිත වෛද්‍ය ක්‍රමයක් නිසා එම කලාපයෙන් ම සපයා ගත යුතු ඖෂධ ද පවතිනවා. එවැනි අවස්ථාවලදී අපට සිදු වන්නේ ඒවා ආනයනය කිරීමට. එසේ ම රස ඖෂධ සැකසීමේදී ඒ සඳහා අවශ්‍ය ඛණිජ ලවණ වර්ග අනිවාර්යයෙන් ම ආනයනය කිරීමට සිදු වෙනවා. ඒ සඳහා බොහෝ විට සම්බන්ධ කර ගන්නේ ඉන්දියාව, පාකිස්තානය වැනි වෙළෙඳ පොළ.

පර්යේෂණ හා නව තාක්ෂණය භාවිත කරමින් ආයුර්වේද සංස්ථාව ගුණාත්මක නිෂ්පාදන පර්යේෂණ හා සංවර්ධන කමිටුවකින් විවෘත වෙළෙඳ පොළ ඉලක්ක කරගෙන සකසන රූපලාවණ්‍ය නිෂ්පාදනවලයි වැඩි ම ශාකාසාර ගුණයක් අඩංගු වන්නේ. නිෂ්පාදනවල එම ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා අප විශාල පරිශ්‍රමයක් දරනවා. එම නව නිෂ්පාදන කාණ්ඩය යටතේ වැඩි ශාකසාර ගුණයක් සහිත සබන් වර්ග, ෂැම්පු හා කන්ඩිෂනර් වර්ග, ස්ක්‍රබ්, ඩේ ක්‍රීම් දැනට නිෂ්පාදන වෙළඳ පොළේ පවතින නිෂ්පාදනවලට අමතර ව ඉදිරියේදී හඳුන්වා දීමට පියවර ගන්නවා. මෙහිදී නිෂ්පාදනයක් වෙළඳ පොළට හඳුන්වා දීමට පෙර ප්‍රධාන පර්යේෂණ දෙකකින් නිෂ්පාදනයේ සාර්ථක බව තහවුරු විය යුතුයි. එහිදී ආයුර්වේද වට්ටෝරු අනුව සකසන රූපලාවණ්‍ය නිෂ්පාදන පවා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයෙන් සිදු කරන සායනික පර්යේෂණවලින් තහවුරු කර ගන්නවා. එයින් ඇගයීමට ලක් කරන්නේ නිෂ්පාදනයේ පවතින සුරක්ෂිතභාවය (Safety), කාර්යක්ෂමභාවය (Efficacy) සහ ඵලදායිතාව (Effectiveness). ඉන් පසු එය රසායනාගාර තත්ත්වයේ (Lab Scale) සිට මහා පරිමාණ (Mass Scale) නිෂ්පාදනයක් දක්වා පුළුල් කිරීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කරන්නේ කාර්මික තාක්ෂණික ආයතනය. මීට අමතර ව වෛද්‍යවරුන්ගේ අධීක්ෂණයක් යටතේ ද මේ නිෂ්පාදන පරීක්ෂා කෙරෙනවා.

සෑම විට ම ආයුර්වේදය යන ගුණය ආරක්ෂා කරමින් ඖෂධ හා නව නිෂ්පාදන කාර්ය සිදු කිරීමටයි අප අදහස් කරන්නේ. එහිදී නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව තවත්

වෛද්‍ය එම්. ජේ. මාරසිංහ
කළමනාකර අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව

වැඩි කිරීමට ආයුර්වේදය යන අදහසට හානි නොකර කොතරම්දුරකට නිෂ්පාදන කාර්ය සඳහා තාක්ෂණය ආදේශ කර ගැනීමට හැකියාව පවතින්නේ ද යන්න පිළිබඳවත් අප සැලකිලිමත්. නිදසුනක් විදිහට තාක්ෂණික ක්‍රම පැවතුණත් අරිෂ්ටයක් සකසන විට එය පෙරෙන්න යන කාලය එලෙසින් ම තබනවා. ඊට තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර හෝ රසායනික ද්‍රව්‍ය හෝ අනවශ්‍ය අයුරින් මැදිහත් කර ගන්නේ නැහැ.

ආයුර්වේද සංස්ථාව නිපදවන ඖෂධවලින් 80%ක් පමණ රාජ්‍ය අංශයටත් 15%ක් පමණ පෞද්ගලික අංශයටත් සපයන අතර 5%ක් පමණ ජපානය ඇතුළු ආයතන කිහිපයකට අපනයන කෙරෙනවා. මෙලෙසින් ඖෂධ බෙදා හැරීමේ කාර්යයට අමතර ව විවිධ සේවා සම්පාදනය කිරීමේ සායනික වැඩසටහන් සඳහා සංස්ථාව මඟ පෙන්වනවා. එවැනි වැඩසටහන් කිහිපයක් ස්වාධීන රූපවාහිනී සේවයත් සමඟ සිතුල්පව්වේදීත් ජාතික රූපවාහිනිය සමඟ ශ්‍රී පාදයේදීත් පැවැත්වුණේ ජනතාවගේ සුවය පිණිස සත්කාරයක් ලබා දෙමින් ආයුර්වේද නිෂ්පාදන පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට. ප්‍රදර්ශන කුටි සංවිධානය කරමින් ඒ ඔස්සේ නව නිෂ්පාදන ජනතාව අතරට ගෙන යාමටත් නිල ෆේස්බුක් සහ වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත ව ඇණවුම් කිරීමෙන් අවශ්‍ය ඖෂධ නිවසට ම ගෙන්වා ගැනීමටත් පහසුකම් සපයා දී තිබෙනවා. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ප්‍රධාන අනුග්‍රාහකයකු වශයෙන් ද ක්‍රියා කරනවා සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් රජයෙන් සංවිධානය වන විවිධ වැඩසටහන් හා අධ්‍යයන සම්මන්ත්‍රණවලදී.

ඒ අනුව ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව තල කිහිපයක් ඔස්සේ මෙලෙස සිය කාර්යභාරය ඉටු කරනවා. එය වඩාත් සුවිශේෂ තත්ත්වයක්. මේ සියල්ල කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සිදු වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන්. එලෙසින් ගන්නා ප්‍රතිපත්තිමය තීරණ සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ, සාමාන්‍යාධිකාරී හා වෛද්‍යවරුන් වෙතින් සංස්ථාවේ ඒ ඒ අංශ ඔස්සේ සම්බන්ධීකරණය වෙනවා. මෙහිදී ප්‍රධාන නිෂ්පාදන කාර්ය කොටස සිදු වන්නේ වෛද්‍යවරුන්ගෙන්. එබැවින් නිෂ්පාදන කාර්යයෙහි තීරණාත්මක සාධකය වන්නේ වෛද්‍යවරුන්. නිෂ්පාදනයේ ප්‍රමිතිය තීරණය කිරීමත් නිෂ්පාදන වැඩසටහන තීරණය කිරීමත් නිෂ්පාදනයේ සිදු කරන ධාරිතාව තීරණය කිරීමත් නිෂ්පාදනයේදී වැඩි වශයෙන් අවධානය ලබා දිය යුතු දේ මොනවාද යන්න තීරණය කිරීමත් සිදු වන්නේ ඔවුන් වෙතින්. ඔවුන්ගේ මැදිහත්වීමෙන් නිෂ්පාදන කාර්යය හා සම්පත් කළමනාකරණය නිවැරදි ව සිදු වීම නිසයි මෙතරම් ලාභයක්, කාර්යක්ෂමතාවක්, ගුණාත්මකභාවයක් සහ ඵලදායිතාවක් අත්පත් කර ගැනීමට හැකි වී තිබෙන්නේ. මේ තාක් පාරිභෝගික විශ්වාසය රැක ගනිමින් ඉහළ ගුණාත්මක නිෂ්පාදන කිරීමේ සියලු ක්‍රියාකාරිත්වය පිටුපස තිබෙන්නේ ඔවුන්ගේ එම මැදිහත්වීම. එසේ ම තෙල් පදම් කිරීමේ සිට ඒ ඒ ශ්‍රමිකයා නිෂ්පාදන කාර්යය සඳහා ලබා දෙන සහයෝගය මේ කර්තව්‍යයේ සාර්ථකත්වයට විශාල පිටිවහලක්.

හොලිවුඩ්කරණය සහ ආසියානු සිනමා සාහිත්‍යය

කථිකාචාර්ය **මනීෂ දුක්ගන්නාරාළ**

ගෝලීයකරණය දෙසට තල්ලුවීමත් සමග ආසියාතික චිත්‍රපට සහ ඒවායේ නිෂ්පාදන ක්‍රම, කතාන්දර කීම, චිත්‍රපට ඉදිරිපත් කිරීම ඇතුළු ක්ෂේත්‍ර ගණනාවකට හොලිවුඩය ප්‍රබල බලපෑමක් කර තිබෙනවා. වත්මන් ගෝලීයකරණ සන්දර්භයේ ආසියානු සිනමා කර්මාන්තය භාජනය වී තිබෙන්නේ විප්ලවීය පරිවර්තනයකට. එය ආසියානු සිනමා ප්‍රදේශ නිර්මාණය කළා පමණක් නොව හොලිවුඩය සමග ඇති සම්බන්ධතාවට ද ඇති කළේ සැලකිය යුතු බලපෑමක්. තොරතුරු, මාධ්‍ය සහ සංස්කෘතිය ගෝලීකරණය වීමත් සමඟ ආසියානු චිත්‍රපට කර්මාන්තය ජාත්‍යන්තර වෙළෙඳ පොළේ සෙවණැලිවලින් ක්‍රමයෙන් මතුවෙමින් ගෝලීය චිත්‍රපට කර්මාන්තයේ ප්‍රධාන තරගකරුවෙකු බවට පත් වුණා. මේ වර්ධනය ආසියානු සිනමාව වාණිජකරණය සහ ජාත්‍යන්තරකරණයට හේතු වූවා පමණක් නොව නිර්මාණ නිෂ්පාදනය සහ ඉදිරිපත් කිරීමේ මට්ටමේ වෙනස්කම් මාලාවකට ද බලපා තිබෙනවා. මේ මාරුවීම පෙන්නුම් කරන්නේ ආසියානු චිත්‍රපට කර්මාන්තයට වානිජමය වාසි රැසක් ගෙන දී ඇති බව මෙන් ම සාහිත්‍යාත්මක ව සිනමාවේ ඇති පිබිදීම. සංස්කෘතික දෘෂ්ටිකෝණයකින් බොහෝ විද්වතුන් තර්ක කරන්නේ එය නූතන සංස්කෘතික යටත්විජිතයක් නියෝජනය කරන බව.

හොලිවුඩයේ අන්තර්ජාතික බලපෑම බොහෝ රටවල සංස්කෘතික සමජාතීයකරණයට, ජාතික සංස්කෘතික සහ සාරධර්ම බාදනයට හේතු වී ඇති බවට ඔවුන් තර්ක කරනවා. වර්තමානයේ බොහෝ චිත්‍රපට අනුවර්තනය වී ඇත්තේ ඒ ඒ රටවලට අදාළ දේශීය සංස්කෘතියට. ඒවායේ හරය හොලිවුඩ් සංස්කෘතියේ බලපෑමට ලක් වී ඇති බව පැහැදිලි වන්නක්. නිදසුනක් වශයෙන් ජපන් ජාතික අධ්‍යාපනඥයකු වන යොශිමොටෝට අනුව හොලිවුඩ් ප්‍රමිතියෙන් මිදීම ආසියානු සිනමාවට අභියෝගාත්මක කාර්යයක්.

සංස්කෘතික යටත්විජිතකරණයේ මතුවීමත් සමඟ 1920 ගණන්වල මැද භාගයේ සිට බ්‍රිතාන්‍ය යටත්විජිතවාදීන් කෙන්යාවේ නව විකාශන සහ සන්නිවේදන මාධ්‍ය ගවේෂණය කිරීමට පටන් ගත්තා. එය ඔවුන්ගේ යටත්විජිත ක්‍රියාවලියට බලපෑවා වන්නට පුළුවන්. චිත්‍රපටවල දෘශ්‍ය ප්‍රයෝග සහ නිරූපණ හේතුවෙන් ගුවන්විදුලියට සවන් දීමෙන් ඇති කරන හැඟීම වෙනුවට චිත්‍රපටවල ප්‍රතිවිපාක වැඩිකල් නොගොස් මිනිසුන් මත පෙර නොවූ විරූ හැඟීමක් ඇති කළා. J Russell Orr වරක් තර්ක කළේ සාර්ථක චිත්‍රපටයක් බයිබලය හැර වෙනත් ඕනෑ ම පුවත්පතකට හෝ පොතකට හෝ වඩා පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත ළඟාවන බව.

ගෝලීය සන්නිවේදනය සඳහා බලගතු මෙවලමක් වශයෙන් චිත්‍රපට සෑම වයස් කාණ්ඩයක ම පුද්ගලයන්ට මැනිය නොහැකි තරමේ සදාචාරාත්මක සහ චිත්තවේගීය බලපෑමක් ඇති කළ හැකි බව යටත්විජිතවාදීන් තේරුම් ගෙන සිටියා. 20 වැනි ශත වර්ෂයේ මැද භාගයේදී අප්‍රිකාව, ආසියාව සහ ලතින් ඇමරිකාවේ රටවල් නිදහස ලබා ගත් විට නිදහස, සමානාත්මතාව සහ ස්වාධීනත්වය උදාකර ගැනීම සඳහා ඔවුන්ගේ ම සංස්කෘතික අනන්‍යතා ගවේෂණය කිරීමට පටන් ගත්තා. දිගුකාලීන යටත්විජිත කොලනිකරණය නිසා බොහෝ රටවල් තවමත් යටත්ජීවිතවාදයේ බලපෑමට ලක් ව තිබෙනවා. සාහිත්‍යය, කලාව, චිත්‍රපටය, සංගීතය, විලාසිතා සහ වෙනත් ක්ෂේත්‍ර ඇතුළු සංස්කෘතික ප්‍රකාශන සම්බන්ධයෙන් මෙය විශේෂයෙන් ම සත්‍ය වන අතර ඒවා හැඳින්වෙන්නේ පශ්චාත් යටත්විජිත සංස්කෘතිය ලෙස. ඒ අතරින් චිත්‍රපටයේ සංස්කෘතික යටත්විජිතකරණය පුළුල් ලෙස අවධානයට ලක් ව තිබෙනවා.

පසුගිය දශක කිහිපයේ තාක්ෂණයේ දියුණුව සහ ගෝලීයකරණය හේතුවෙන් සංවර්ධිත රටවල චිත්‍රපට කර්මාන්තයට වැඩි වශයෙන් බලපෑම් ඇති වූ අතර එයින් ඇතැම් සංවර්ධිත රටවල චිත්‍රපටවලට විශාල ප්‍රේක්ෂක සංඛ්‍යාවක් ප්‍රිය කරන ගෝලීය ජනප්‍රියත්වයක් ලැබුණා.

මේ චිත්‍රපට ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීමත් සමඟ සංවර්ධිත රටවල සංස්කෘතික වටිනාකම් සහ ජීවන රටා වෙනත් රටවලට ද හඳුන්වා දුන්නා. මෙය බොහෝවිට මුල් සංස්කෘතියට බලපෑම් කිරීම සහ වෙනස් කිරීම

'සංස්කෘතික සමජාතීයකරණ' සංසිද්ධිය සඳහා තුඩු දෙනවා. මේ සංසිද්ධිය හැඳින්වෙන්නේ 'සංස්කෘතික යටත්විජිතකරණය' ලෙස. එය සංස්කෘතියට යටත්විජිතවාද බලපෑමට හා වෙනස්වීමට සමාන වෙනවා. එඩ්වඩ් සයිඩ් (Edward Said) ඔහුගේ 'සංස්කෘතිය සහ අධිරාජ්‍යවාදය' ග්‍රන්ථයේ 'සංස්කෘතික අධිරාජ්‍යවාදය' යන සංකල්පයේදී සඳහන් කරන්නේ බටහිර ජාතීන්ට ඔවුන්ගේ සංස්කෘතිය ගොඩනැගීම කෙරෙහි අධිරාජ්‍ය ආක්‍රමණයේ බලපෑම සම්බන්ධයෙන් වැරදි මතයක් තිබූ බව. ඔවුන් අන් අයට වඩා ඔවුන්ගේ ම සංස්කෘතිය උසස් බව විශ්වාස කළා. වැඩිදුරටත් ඔහු ගෝලීය චිත්‍රපට කර්මාන්තයෙන් බොහෝදුරට ඇමරිකානු චිත්‍රපට කර්මාන්තය සඳහා බලපෑම් එල්ල වී ඇති බවටත් ඇමරිකානු විදේශ ප්‍රතිපත්තිය බටහිර සංස්කෘතිය පතුරුවන ප්‍රජාතන්ත්‍රවාදයක් බවටත් තර්ක කර තිබෙනවා. ඇතැම් විද්වතුන් පවසන්නේ බටහිර නොවන රටවලට බටහිර මාධ්‍ය නිරාවරණය වීම බොහෝ විට සාම්ප්‍රදායික වටිනාකම් සහ සංස්කෘතික අනන්‍යතාව නැතිවීමේ ආරම්භය බව. නිදසුනක් වශයෙන් නයිජීරියානු විද්වතුන්ගේ අධ්‍යයනයකින් පෙනී යන්නේ එවකට සංස්කෘතික යටත්විජිතකරණය පිළිබඳ සංකල්පය ප්‍රධාන ධාරාවේ ශාස්ත්‍රීය අවධානයට ලක් ව නොතිබුණත් එක්සත් ජනපදයේ සහ වෙනත් විදේශ රටවල චිත්‍රපට නයිජීරියාවේ දේශීය ව නිෂ්පාදනය කරන ලද චිත්‍රපටවලට වඩා ජනප්‍රිය වූ බව. තුන් වැනි ලෝකයේ රටවල යටත්විජිත ඉතිහාසය සංස්කෘතික යටත්විජිතකරණයේ එක් පදනමක් බව ඉන්දියානු බුද්ධිමතකු වන බබ්ලි සිංහ (Babli Sinha) පෙන්වා දෙන්නක්.

ගෝලීය චිත්‍රපට කර්මාන්තය පුරාවට ම එක්සත් ජනපදයේ හොලිවුඩය 20 වැනි සියවසේ මැදභාගයේ සිට අගභාගය දක්වා ගෝලීය පරිමාණයේ වෙළෙඳ පොළේ වැඩි කොටසක් ඒකාධිකාරයට ලක් කර ගෙන තිබෙනවා. ගෝලීය ප්‍රේක්ෂකයන් සඳහා පළමු තේරීම බව පෙනෙන්නේ ඇමරිකානු හොලිවුඩය. මේ චිත්‍රපට බොහෝ විට නිෂ්පාදනය කරන්නේ ඉහළ වෘත්තියභාවයකින් සහ නිෂ්පාදන ගුණාත්මකභාවයකින් මෙන් ම ගෝලීය බලපෑමක් ඇති කළ හැකි ප්‍රමිතියක් සකස් කරමින්. අනෙකුත් රටවල නිෂ්පාදකයන් සහ අධ්‍යක්ෂවරුන් හොලිවුඩයේ නිෂ්පාදන මට්ටම්වලට ළඟා වීමට අරගල කළ අතර ගෝලීය චිත්‍රපට කර්මාන්තයේ ඇති වුණේ ප්‍රමිතිකරණයේ සහ සමජාතීයකරණයේ ප්‍රවණතාවක්.

දෙවැනි ව හොලිවුඩ් චිත්‍රාගාර ගෝලීයකරණය වූ අලෙවිකරණ උපායමාර්ගයක් අනුගමනය කර ඇති අතර ඔවුන්ගේ චිත්‍රපට ලොව පුරා එකවර නිකුත් කරනවා. මේ උපායමාර්ගය චිත්‍රපටයක ජනප්‍රියත්වය වැඩි කරනවා පමණක් නොව චිත්‍රපටයක බොක්ස් ඔෆිස් කාර්ය සාධනයට තීරණාත්මක වන දැවැන්ත ගෝලීය ප්‍රේක්ෂක පිරිසක් ද නිර්මාණය කරනවා. ඊට සමගාමී ව හොලිවුඩ් චිත්‍රපට ලක් වන්නේ පුළුල් පිළිගැනීමකට.

තෙවැනි ව හොලිවුඩ් චිත්‍රපටවලින් ප්‍රේක්ෂක රුචි අරුචිකම් සහ අපේක්ෂා ගොඩ නැගෙන අතර ඇමරිකානු චිත්‍රපට සාමාන්‍යයෙන් දෘශ්‍ය ප්‍රයෝග, ක්‍රියා අනුපිළිවෙළ, තරු (ෆිල්ම් ස්ටාර්ස්) සහ ඉංග්‍රීසි භාෂාව ඔවුන්ගේ ප්‍රධාන විකුණුම් සාධක ලෙස තබා ගන්නවා. මේ අංග ගෝලීය ප්‍රේක්ෂකයන් වෙත ආයාචනා කිරීම නිසා ප්‍රේක්ෂකයන් මේ අංගවලට හුරුවෙමින් සිටින අතර එය වෙනත් වර්ගවල චිත්‍රපට සඳහා ඇති ඉල්ලුම අඩුවීමට හේතුවක්.

පොදුවේ ගත් කල කාව්‍යාත්මක ප්‍රකාශන ආකාරයක් ලෙස චිත්‍රපටයේ වටිනාකම රඳා පවතින්නේ අව්‍යාජත්වය, නිර්මාණශීලීත්වය සහ ප්‍රභවය මත. සමකාලීන සංස්කෘතික හූ දර්ශන තුළ විදේශීය චිත්‍රපට නිතර හොලිවුඩ් චිත්‍රපටවලින් ආභාසය ලබා ගන්නා අතර එහි ප්‍රතිඵලයක් ලෙස අනුවර්තන සහ නැවත අර්ථකථන සිදු වෙනවා. දේශීය සංස්කෘතියට අනුවර්තනය වී ඇතත් මේ චිත්‍රපට බොහෝ විට ඔවුන්ගේ ම සංස්කෘතික සාරය සංග්‍රහ කිරීමට අසමත් වෙනවා. ඒ වෙනුවට පිළිබිඹු කරන්නේ ඇමරිකානු වටිනාකම් තුළ ගැඹුරින් මුල් බැස ඇති හරයන්. ආසියාවේ ඉන්දියානු චිත්‍රපට කර්මාන්තය බොලිවුඩ් ලෙසත් හොංකොං නැගෙනහිර හොලිවුඩය ලෙසත් දකුණු කොරියාවේ හලයුවුඩ් (Hallyuwood) ලෙසත් කැපී පෙනෙන සමාන්තර ලක්ෂණ මතු කරනවා. මෑත වර්ෂවලදී මේ ආසියානු චිත්‍රපට කර්මාන්තය නිෂ්පාදනය, බෙදා හැරීම සහ නරඹන්නා සම්බන්ධයෙන්

හොලිවුඩය විසින් ස්ථාපිත කරන ලද ආයතනික සහ සෞන්දර්යාත්මක රටා අනුගමනය කරනවා.

පළමු ව නැගෙනහිර ආසියානු චිත්‍රපට කර්මාන්තය සහ හොලිවුඩ් අතර ඇති එක් සමානකමක් වන්නේ උසස් තත්ත්වයේ චිත්‍රපට නිෂ්පාදනය සඳහා ඔවුන්ගේ කැපවීම. හොලිවුඩය එහි වෘත්තීය නිෂ්පාදන කණ්ඩායම්, අධි තාක්ෂණික දෘශ්‍ය සහ ශබ්ද ප්‍රයෝග සඳහා ප්‍රසිද්ධයි. බොලිවුඩ් සහ නැගෙනහිර ආසියානු චිත්‍රපට කර්මාන්ත මේ ප්‍රමිතිවලට ගැළපෙන පරිදි විශාල සම්පත් ප්‍රමාණයක් ආයෝජනය කර තිබෙනවා. බොලිවුඩ් චිත්‍රාගාර බොහෝ විට දෘශ්‍ය හා ශ්‍රව්‍යමය වශයෙන් විස්මිත අත්දැකීම් ලබාදීම සඳහා අතිනවීන නිෂ්පාදන පහසුකම් තිබෙනවා. ඉන්දියාවේ බොලිවුඩ් සිනමාව බිහිවීමට බටහිර සංස්කෘතික අධිරාජ්‍යවාදී ආභාසය සමඟින් චිත්‍රපට කර්මාන්තය සිය ස්වදේශික සංස්කෘතික අංග සාර්ථක ව මුසු කළ හැකි කැපී පෙනෙන අවස්ථාවක් බව හසන් සහ නයික් යන විද්වතුන් ප්‍රකාශ කර තිබෙනවා. හොලිවුඩය සමග බෙදාගත් ආඛ්‍යාන තේමා කලාකරුවන් සහ ගෝලීය සැලසුම් තිබියදීත් හොලිවුඩය එහි චිත්‍රපට තුළ ඉන්දියානු පවුල් සංස්කෘතියේ වටිනාකම් ප්‍රතිරාවය කරන දේශීය ගීත සහ නැටුම් වැනි ඉන්දියානු අංග ඇතුළත් කිරීමෙන් කැපී පෙනෙනවා. එලෙස ම කොරියානු, චීන චිත්‍රපට තාක්ෂණය සහ නිෂ්පාදන ගුණාත්මකභාවය අතින් ලබා තිබෙන්නේ විශාල ප්‍රගතියක්. උසස් තත්ත්වයේ නිෂ්පාදනයක් සඳහා වූ මේ කැපවීම ජාත්‍යන්තර ප්‍රේක්ෂකයන් ආකර්ෂණය කර ගත්තා පමණක් නොව බොලිවුඩ් සහ ආසියානු සිනමාව ගෝලීය පිළිගැනීමක් දක්වා උසස් කර තිබෙනවා.

දෙවැනි ව චිත්‍රපට අන්තර්ගතයේ සහ විෂය කරුණුවල සමානකම් ද කැපී පෙනෙන්නක්. බොලිවුඩය, නැගෙනහිර ආසියානු සිනමාව සහ හොලිවුඩය යන සියල්ලන්ට ම ඔවුන්ගේ ම අනන්‍ය සංස්කෘතික අංග තිබෙන අතර ඔවුන් තෝරා ගන්නේ සාමාන්‍ය තේමා සහ කථාන්දර. උදාහරණයක් ලෙස මේ කලාපීය චිත්‍රපටවල ආදරය, ප්‍රේමය, ක්‍රියාදාම-ත්‍රාසජනක සහ හාස්‍ය තේමාව බහුල ව පවතිනවා. මීට අමතර ව ඇතැම් ජාත්‍යන්තර චිත්‍රපට පාරිසරික ආරක්ෂාව, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ සංස්කෘතික විවිධත්වය වැනි ගෝලීය සමාජ ගැටලු ගවේෂණය කරනවා.

තෙවැනි ව සංකල්පීය අලෙවිකරණය, උපායමාර්ගය විමසා බලන විට හොලිවුඩ් සෑම විට ම ජාත්‍යන්තර වෙළෙඳ පොළේ භාවිත කර තිබෙන්නේ සංකල්පීය ප්‍රවර්ධන උපායමාර්ග බව පෙනී යන්නක්. ලොව පුරා එකවර චිත්‍රපට නිකුත් කිරීම් සිදු වන්නේ ජාත්‍යන්තර බෙදා හරින්නන් සමඟ සහයෝගිතා සහ පුළුල් වෙළෙඳ ප්‍රචාරණ ලබා දීමෙන්. ඒ හා සමාන ව බොලිවුඩ් සහ නැගෙනහිර ආසියානු චිත්‍රපට චිත්‍රාගාර ඔවුන්ගේ චිත්‍රපට ජාත්‍යන්තරයේ අලෙවි කිරීමට සහ පුළුල් ප්‍රේක්ෂක පදනමක් ගොඩනැගීමට සමාන උපායමාර්ග භාවිත කර තිබෙනවා. එසේ ම තරු සංස්කෘතිය යනු බොලිවුඩය, නැගෙනහිර ආසියානු සිනමාව සහ හොලිවුඩය අතර පොදු නූලක්. සෑම සිනමා කර්මාන්තයකට ම ප්‍රසිද්ධ තරු කිහිපයක් සිටින අතර ඔවුන් සඳහා ජාත්‍යන්තර තලයේ තිබෙන්නේ පුළුල් පිළිගැනීමක්. හොලිවුඩයේ Tom Cruise, Angelina Jolie, බොලිවුඩයේ Shahrukh Khan, Amir Khan, කොරියානු චිත්‍රපට කර්මාන්තයේ Lee Byung-hun සහ Jun ji-hyun ඊට උදාහරණ.

පොදුවේ ගත් කල කාව්‍යාත්මක ප්‍රකාශන ආකාරයක් ලෙස චිත්‍රපටයේ වටිනාකම රඳා පවතින්නේ අව්‍යාජත්වය, නිර්මාණශීලීත්වය සහ ප්‍රභවය මත. සමකාලීන සංස්කෘතික භූ දර්ශන තුළ විදේශීය චිත්‍රපට නිතර හොලිවුඩ් චිත්‍රපටවලින් ආභාසය ලබා ගන්නා අතර එහි ප්‍රතිඵලයක් ලෙස අනුවර්තන සහ නැවත අර්ථකථන සිදු වෙනවා. දේශීය සංස්කෘතියට අනුවර්තනය වී ඇතත් මේ චිත්‍රපට බොහෝ විට ඔවුන්ගේ ම සංස්කෘතික සාරය සංග්‍රහ කිරීමට අසමත් වෙනවා. ඒ වෙනුවට පිළිබිඹු කරන්නේ ඇමරිකානු වටිනාකම් තුළ ගැඹුරින් මුල් බැස ඇති හරයන්. ආසියාවේ ඉන්දියානු චිත්‍රපට කර්මාන්තය බොලිවුඩ් ලෙසත් හොංකොං නැගෙනහිර හොලිවුඩය ලෙසත් දකුණු කොරියාවේ හලයුවුඩ් (**Hallyuwood**) ලෙසත් කැපී පෙනෙන සමාන්තර ලක්ෂණ මතු කරනවා.

ආසියාව ආර්ථික හා දේශපාලනික වශයෙන් අඛණ්ඩ ව නැගී සිටින හෙයින් සහ බටහිර සිනමාවට ආසියානු සිනමාව ජාත්‍යන්තර සිනමා උලෙළහිදී බලපෑම් කර ඇති හෙයින් හොලිවුඩය ප්‍රතිස්ථාපනය කළ හැකි ඒකාබද්ධ බලවේගයක් ලෙස ආසියානු සිනමාව දැකිය හැකි බවට විද්වතුන් තර්ක කරනවා. හොලිවුඩය සම්භාව්‍ය සිනමාව සහ ප්‍රමිතිය ලෙස සැලකෙන අතර අනෙකුත් සියලු ම චිත්‍රපට හොලිවුඩයෙන් පසු බසින බවත් හොලිවුඩයේ ප්‍රමිති අනුගමනය කරන බවත් ජපන් අධ්‍යාපනඥයෙකු වන මිත්සුහිරෝ යශිමොතෝ (Mitsuhiro Yoshimoto) නිරීක්ෂණය කර ඇති කරුණක්. ඔහු යෝජනා කරන්නේ ආසියානු සිනමාවේ හරය හොලිවුඩය වටා භ්‍රමණය නොවිය යුතු බවත් එහි ව්‍යුත්පන්නයක් නොවිය යුතු බවත්. එහෙත් මේ ප්‍රමිතියෙන් සම්පූර්ණයෙන් මිදී ආසියානු සිනමාව ප්‍රතිසංකල්පනය කිරීම පහසු නොවන බව යොෂී මොටෝ ද පිළිගන්නවා. එයට හේතු වන්නේ හොලිවුඩයේ ආර්ථික ආකෘතියේ පමණක් නොව සිනමාවේ ස්වභාවය. සංස්කෘතික බලවේගයක් ලෙස හොලිවුඩය හැඟීම් ග්‍රහණය කර ගැනීමේ ප්‍රබල හැකියාවක් පෙන්නුම් කර ඇති බැවින් හොලිවුඩය නියෝජනය කරන්නේ හුදෙක් ආර්ථික බලාගාරයක් (Economic Powerhouse) පමණක් නොව සිනමාව විනෝදාස්වාදය සපයන ආකාරයක් ලෙස තිර ව මුල් බැස ඇති බොහෝ රටවල ජාතික සංස්කෘතියේ, ජනප්‍රිය පරිකල්පනයේ සහජ සහ උකහා ගත් අංගයක් ද ලෙස.

තුසිත ජයසුන්දර

සිරිලක කණ්ඩායම් සංගීතයේ නොයෙක් පැති හා තතු විමසමින් සම්මානිත මහාචාර්ය සුනිල් ආරියරත්න රචනා කළ 'ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය' මැයෙන් යුතු විමසුම් ග්‍රන්ථය පසුකාලීන විමසුම් සඳහා ද නන් අයුරින් පාදකකොට ගැනුණු බව නොරහසක්. සිරිලක පොප් සංගීත භාවිතය අළලා වූ විවාදාත්මක හා නවමු කරුණු ගණනාවක් එය නොතකන හා බැහැර කරන සංගීතකාමී පාඨකයන්ගේ අවධානය තහවුරු කරන අයුරින් සනිටුහන් කරන්නට ද මෙහිලා ඔහු අමතක කරන්නේ නැහැ. මෙතැනදී ඔහුගේ වෙසෙස් අවධානයට ලක්වූවකු වන්නේ ක්ලැරන්ස් විජේවර්ධන. ක්ලැරන්ස් විජේවර්ධන හා බැඳුණු සංගීත කණ්ඩායම් සිරිලක සංගීත කලාපයේ සිදු කළ විප්ලවීය වෙනස්කම් ද ඔහුට විෂය වනවා. මේ වටා පැවති තතු ද ඔහුට අමතක වන්නේ නැහැ. වෙසෙසින් ම මෙකරුණට අදාළ ව 1960-1970 දෙදශකයේ සිරිලක කලාවේ ප්‍රවණතා හා පසුබැම් පිළිබඳ අරුත් සරු කියැවීමක් කරා යාමේ ඉඩක් පාදා ගැනීම ඔහුගේ ප්‍රමුඛ අරමුණක්.

සිය විමසුම් ග්‍රන්ථයේදී මහාචාර්ය ආරියරත්න වැඩිදුරටත් සඳහන් කරන්නේ ගීත රචනය, තනු රචනය, සංගීත සංයෝජනය, ගායනය යන සකලවිධ අංශවලින් කණ්ඩායම් සංගීතය උසස් ස්ථරයක් කරා ගෙන ඒමට ක්ලැරන්ස් විජේවර්ධන සමත් වූ බව. කණ්ඩායම් සංගීතකරුවන් අතර සිටි දක්ෂතම ගීත රචකයා ක්ලැරන්ස් බවත් ඔහුගේ රචනාවලට සුන්දර ගීතානුභූති පාදක වූ බවත් ඒවා ගීතෝචිත බසකින් පැවසීමේ හැකියාව ඔහු සතු ව තිබූ බවත් අනතුරු ව මහාචාර්ය ආරියරත්න කියා සිටින්නේ නිසැක නිදසුන් ගණනාවක් ම ගෙනහැර පාමින්.

මහාචාර්ය ආරියරත්න මේ ග්‍රන්ථය නිකුත් කරන්නේ වසර 2002දී. ඒ, ක්ලැරන්ස් වියෝවී අට වසකට පසු එවක එක් කර ගත හැකි වූ පොප් සංගීත කණ්ඩායම් කිහිපයක ම නිදසුන් ගායනා ද සමඟ. සිරිලක පොප් සංගීතයේ බලපෑම පිළිබඳ ප්‍රතිවිමසුමක් සේ මේ ග්‍රන්ථයට හිමි වන වටිනාකම නොතකා හරින්නට බැහැ.

එච්. ආර්. ජෝතිපාල, විජය කුමාරතුංග, මිල්ටන් මල්ලවආරච්චි හා එම්.එස්. ප්‍රනාන්දු සැලකෙන්නේ ද ක්ලැරන්ස්ගේ සමකාලීනයන් ලෙස. එසේ ම ස්වීයත්වයක් සපුරා ගත්තවුන් ලෙසින්. ඔවුන් අරභයා කෙරෙන පසු විමසුම් වඩා සාරවත් කරනු පිණිස මේ ස්වීයත්වය යන්න මනාව ඉවහල් කර ගත් බව පැහැදිලි වන්නක්. ස්වීයත්වය යන්න සාපේක්ෂ ලකුණු සහිත ව පවතින්නේ ය යන්නයි මෙයින් අදහස් කෙරෙන්නේ.

මෙදවස ඉහළ රසික ආකර්ෂණයක් සහිත ව තිරගත කෙරෙන 'රිදම් ඔෆ් ද ගිටාර් - ක්ලැරන්ස්' සිනමාපටය යට කී ආකාරයේ පසු විමසුමක් සේ හඳුනා ගැනීම පහසු නැහැ. එනමුත් සිරිලක ජනාදරප්‍රාප්ත සංගීතකරුවකුගේ දිවි සැරිය කවරාකාරයෙන් හෝ විෂය කර ගත් පුරෝගාමී සිනමාපටයක් සේ 'රිදම් ඔෆ් ද ගිටාර් - ක්ලැරන්ස්' නම් කළ හැකියි. මේ අරුතින් ගත් කල 'රිදම් ඔෆ් ද ගිටාර් - ක්ලැරන්ස්' කිසිසේත් ම නොසලකා නොහැරිය යුතු සිනමාපටයක් බවටයි පත්වන්නේ. සිනමාව කලාත්මක ප්‍රකාශනයක් හා රසික දිවි පොහොසත් කරවන මඟක් විය යුතු යැයි අදහන විමසුම් පිළිවෙත් මෙබඳු සිනමාපට දෙස වපරැසින් බලන්නට දෙවරක් නොසිතන බවත් කිව යුත්තක්.

මෙදවස වෙසෙන්නවුන් සිරිලක සරුසාර ම සමය සේ බොහෝ විට දක්වන්නේ 1960 හා 1970 දශක ද්විත්වය. මෙකල සිරිලක කලාවේ නව මං පෙත් විවර වන්නට වූයේ වරෙක විස්මයක් ද තවත් වරෙක ආස්වාදයක් ද දනවමින්. මෙහි මීළඟ අදියර වූයේ රසික දිවිය නව හා බරසාර අන්දමින් ම පොහොසත් කරලීම. තුලනාත්මක ව බලන විට ද එදවස සිරිලක සිනමාව, වේදිකා නාට්‍ය හා නිර්මාණ සාහිත්‍ය පෙර නොවූ විරූ ප්‍රවණතා ද ගම්‍ය කළ බව පෙනී යනවා. ලෙස්ටර් ජේම්ස් පීරිස්, ධර්මසේන පතිරාජ හා වසන්ත ඔබේසේකර වැන්නන් සිනමාව වෙතින් ද සුගතපාල ද සිල්වා, හෙන්රි ජයසේන, ලූෂන් බුලත්සිංහල හා ධර්මසිරි බණ්ඩාරනායක වැන්නන් වේදිකා නාට්‍ය වෙතින් ද ගුණදාස අමරසේකර, මඩවල එස්.රත්නායක, සිරි ගුනසිංහ, ජී.බී. සේනානායක වැන්නන්

නිර්මාණ සාහිත්‍ය වෙතින් ද මෙසේ සිදු කළේ අපමණ මැදිහත්වීමක්.

ක්ලැරන්ස්ලා එක්වූ පොප් සංගීතය හැම විටෙක ම විස්මය හා ආස්වාදය පරයා නොගිය වගයි සමකාලීන හා පසුකාලීන කලා විචාරය බොහෝ විට පවසන්නේ. මෙය ඔවුන් විසින් ගොඩ නංවන ලද රසාලිප්ත සංස්කෘතිය යටපත් කර දැමීමට ඇවැසි පසුබිමක් ද තනා දෙනවා. එනමුත් සමකාලීන තුරුණු පෙළ කළඹන විලාසිතාවක් බවට ඔවුන් පත් ව සිටි බව සැඟවිය යුතු නැහැ. ජෝන් ලෙනන්, එල්විස් ප්‍රෙස්ලි වැනි බටහිර තුරුණු සංගීතය එකලු කළ පිරිස් සේ ම බීට්ල්ස් වැනි සංගීත කණ්ඩායම් සිරිලක තුරුණු පෙළ වෙත ගෙන ආ සංගීත රසය ලාංකිකකරණය පිණිස පියවර ගත්තේ ක්ලැරන්ස්ලා ම යන්න සැබෑවක්.

මෙතැනට ගායනය, ගේය පද රචනය හා සංගීතය මෙන් ම භාවිත කළ සංගීත උපකරණ හා උපාංග ද එක් කළ යුතු වනවා. මේ අතර බොක්ස් ගිටාරයට හිමි වන්නේ පළමු තැනක්. ක්ලැරන්ස්ගේ සමීපතම වාද්‍ය භාණ්ඩය වනුයේ ද බොක්ස් ගිටාරය. ඔවුන්ගේ ඇඟලුම් ආදිය ද යම් පරමාදර්ශී මුහුණුවරකින් යුතු ව සිරිලක තුරුණු පෙළ කරා පැමිණි බව පෙනී යනවා. එසමයේ සිරිලක සංගීත කලාපය අස්වැද්දූ ගී තැටි, පටිගත කිරීමේ පිළිවෙත්, සංගීත ප්‍රසංග සේ ම පොදු ජනයාගේ දිවි සැරිය පවා මෙසේ පැමිණෙන අතීත කාමය වඩවන බව කිව යුතුයි.

තේජා ඉද්දමල්ගොඩ විසින් අදියුරු බර දරනු ලබන්නට ආ පසුව නිපැයුම් කරු පිහිටෙන් ම නිමවූ 'රිද්ම් ඔෆ් ද ගිටාර් - ක්ලැරන්ස්' එක්තරා ආකාරයකින් 1960 හා 1970 දෙදශකයේ නාගරික තුරුණු බව ක්ලැරන්ස් ඇතුළු සිරිලක පොප් සංගීත කණ්ඩායම් ඔස්සේ පිළිබිඹු කරලන්නට ආ සිනමාපටයක් සේ හඳුන්වා දීම සහේතුක වනවා. නිමැවුම්කරුට හා නිපැයුම්කරුට ඇවැසි වූයේ එදවස සිරිලක පොප් සංගීතයේ රුව ගුණ මතුකරලීමට වඩා ක්ලැරන්ස් විජේවර්ධන යන අද්විතීය චරිතයේ එක් සමයක ගලා යාම හැඟුම්බර විලාසයකින් දැනවීම. මෙහෙයින් ඊට අදාළ චරිත, සිදුවීම් හා ස්ථාන තවදුරටත් එක්විය යුතු යැයි කියා නඟන මැසිවිලි තාර්කික වන්නේ නැහැ. මෙය ක්ලැරන්ස්ගේ තුරුණු සමය පිළිබඳ යථාරූපී කියැවීමක් ද නොවන බව ද සිහි කළ යුත්තක්.

'රිදම් ඔෆ් ද ගිටාර් - ක්ලැරන්ස්' මෙසේ ඉහළ රසික ප්‍රතිචාර ලබන්නේ මන්දැයි යන පැනයට නිසි පිළිතුරු සපයා ගැනීම මේ විමසුමේදී නොවළහා සැලකිලිමත් විය යුත්තක් වනවා. රසික ප්‍රතිචාර බහුතරයක් සුහද ලකුණුමයි පෙන්නුම් කරන්නේ. විද්වත් සිනමා රසික සුළුතරය වුව අනුග මනය කරන්නේ තරමක නිහඬ පිළිවෙතක්. ඔවුන් මෙය නරඹා රසවත් වුව ද ඒ වග සබුද්ධික ව පවසන්නට සූදානම් වන්නේ නැහැ. උචිත පරිදි මෙකරුණ සමකාලීන සිනමා විචාරයට ගළපාලන්නට ද පුළුවන්.

එක් පිළිතුරක් පෙර දැක්වූ කරුණු සමඟ පෙළ ගස්වන්නට හැකියාව තිබෙනවා. එනම් 1960 හා 1970 දෙදශකයේ තුරුණු බව නිරූපණයට දැක්වූ උනන්දුවක් මෙහිලා හඳුනා ගත හැකි නිසා. වෙසෙසින් හුවා දක්වන ක්ලැරන්ස් විජේවර්ධන, ඇනස්ලි මාලේවන හා ඉන්ද්‍රානි පෙරේරා ගැයූ මධුර මනෝහර ගී එලෙසින් ම වාගේ එක්කරලන්නට නිර්මාපකයන් දැක්වූ උනන්දුව තවත් පිළිතුරක්. මෙතැනදී සුරේෂ් මාලියද්දේ පෙන්වූ සමත්කම ආනන්දජනකයි. 'මූන්ස්ටෝන්', 'ත්‍රී සිස්ටර්ස්' හා 'ගෝල්ඩන් චයිම්ස්' යන පොප් සංගීත කණ්ඩායම් තිරය මත සටහන් කෙරෙන වර්ණවත් විලාසය සහ ඊට පාදක වන රුවන් කොස්තාගේ කැමරාකරණය තවත් පිළිතුරක්. ක්ලැරන්ස්ගේ හා ඔහුගේ පෙම්වතියන්ගේ චරිත නිරූපණයට එක්කර ගත් නවක තිදෙනාගේ නොකිළිටි බව ද උක්ත පැනයට පිළිතුරක් සේ ඉදිරිපත් කළ හැකි වනවා.

කපිල එම්. ගමගේ

අනෙකාගේ සපත්තු පැලඳ ඇවිද යාම

සාහිත්‍යය කන්නදැයි ඇසූ රාජ්‍ය පාලකයන් සිටි, සාහිත්‍ය කලාවට අවම වටිනාකමක් හිමි කර දෙමින් එය පාසල් විෂය නිර්දේශයෙන් පවා ඉවත් කරමින්, සිය පැවැත්ම වෙනුවෙන් අසංවේදී මිනිසකු නිර්මාණය කර ගැනීමට උත්සාහ කළ කාල සමයක් පසුකරමිනුයි අප වර්තමානය වෙත පැමිණ තිබෙන්නේ. මිනිසාට සාහිත්‍යය අවශ්‍ය වන්නේ ඇයි?. සෑම පුරවැසියෙකුට ම සිය ජීවිත කාලයේ ජීවන ස්වරූප කිහිපයක් උරුම වෙනවා. එයින් ප්‍රමුඛ වන්නේ දේශපාලන ජීවිතය, සමාජ ජීවිතය, ආර්ථික ජීවිතය හා සංස්කෘතික ජීවිතය. මේ සියලු ජීවන ස්වරූප තමන් විසින් නිවැරදි ව ගොඩ නගා ගත යුතුයි. සංස්කෘතික ජීවිතයක් ගොඩනගා ගැනීම වෙනුවෙන් සිදු කරන ප්‍රායෝගික ක්‍රියාවලියේදී කලාවට ලැබෙන්නේ සුවිශේෂ ස්ථානයක්. එයින් ද සාහිත්‍යය ප්‍රමුඛ වෙනවා. සාහිත්‍යය යනු ලියූ හෝ මුද්‍රිත හෝ පිටුවක ඇති වචන පමණක් නොව ගැඹුරු මිනිස් අවශ්‍යතාවක්. එය අපට අප ව ම, අන් අය ව සහ ලෝකය ම තේරුම් ගැනීමට උපකාරී වන්නක්.

සාහිත්‍යය යනු මානව අත්දැකීම් ප්‍රකාශනයක්. එයින් නිරන්තරයෙන් පිළිබිඹු වන්නේ ජීවිතය. අපගේ ජීවන අරගලයේ ප්‍රීතිය, බිය සහ සිහින දෘශ්‍යමාන වෙනවා. පරම්පරා ගණනාවක් මිනිසුන්ගේ හැඟීම් සහ සිතුවිලි සංරක්ෂණය කර, පරම්පරාවෙන් පරම්පරාවට අතීතයෙන් ඉගෙන ගැනීමට සහ කාලානුරූපී මානව උත්සුක සමඟ සම්බන්ධ වීමට සාහිත්‍යයෙන් ඉඩ සලසා දෙනවා. සාහිත්‍යය අපට උපකාරී කරන්නේ අප කවුද? අප සිටින්නේ ඇයි? සහ ජීවිතයේ අප අගය කරන දේ ගැන යළි සිතීමට. මානව සංවේදන සහ සම්බන්ධතා වර්ධනය කිරීම ද සාහිත්‍යය ඔස්සේ සිදුවන්නේ අපට අන් අයගේ ජීවිතවලට ඇතුළු වීමට කවුළු විවෘත කර දෙමින්.

සාහිත්‍යය ආචාරධර්මීය සහ සදාචාරාත්මක මඟ පෙන්වීමක් සිදු කරනවා. සමාජයට අනුකලනය වීමට අවශ්‍ය ජීවන සංශෝධනය ඇති කරනවා. සාහිත්‍යය ඔස්සේ ගවේෂණය කිරීමෙන් සදාචාරාත්මක දැනුවත්භාවය, විවේචනාත්මක චින්තනය සහ යුක්තිය පිළිබඳ හැඟීමක් වර්ධනය කර ගන්නවා. සාමාන්‍යයෙන් මිනිසා සිය ජන්මයෙන් ම යම් කලාත්මක නිර්මාණශීලී විභවතා සහිත ව උපදින සත්ත්වයෙක් වුවත් බිහිවන සමාජයේ නිර්මිත ආයතන පද්ධතියක් විසින් ඒ සත්ත්වයා තත්ත්වාරෝපණය කරමින් වෙනස් ආකාරයේ සත්ත්වයෙක් බලහත්කාරයෙන් නිර්මාණය කරනු ලබන්නේ ස්වාධීනත්වය අහිමි කරමින්. ඒ ස්වාධීනත්වය යළි ගොඩනගා ගත හැකි මාර්ගයක් සොයා ගත හැක්කේ සාහිත්‍ය කලා නිර්මාණ පරිශීලනයෙන්. මානවයා සතු විශිෂ්ටතම ශක්තිය වන්නේ පරිකල්පනය සහ නිර්මාණශීලීත්වය. සාහිත්‍යය සාමාන්‍යයෙන් අප ව ඔබ්බට ගෙන යාමෙන් නිර්මාණශීලීත්වය අවුස්සනවා. එය ඉඩ සලසන්නේ නව හැකියා, ගැටලු, විසඳුම් සහ ලෝකය වෙනස් ආකාරයෙන් පර්යාවලෝකනය කිරීමට. එය සමාජයක ප්‍රගතිය සහ නවෝත්පාදනය සඳහා අත්‍යවශ්‍ය කාරණයක්.

මානව සංස්කෘතිය සහ ඉතිහාසය සංරක්ෂණයේදී සාහිත්‍යය සිදු කරන්නේ තීරණාත්මක කාර්යභාරයක්. සාහිත්‍යය සෑම විට ම ප්‍රජාවක හෝ ජාතියක හෝ කතාන්දර, වටිනාකම් සහ සම්ප්‍රදාය ජීවමාන කර තබා ගන්නවා. සාහිත්‍ය කලාවක් නොමැතිනම් මානව උරුමය සහ ප්‍රඥාව නැති වී යනු ඇති. චිත්තවේගීය මුදා හැරීම (Catharsis) සඳහා විශාල අවස්ථාවක් සාහිත්‍ය සපයනවා. සාහිත්‍යය කියවීම හෝ ලිවීම හෝ මිනිසුන්ට නිර්මාණය කර දෙන්නේ සිය හැඟීම් ආරක්ෂිත ව මුදා හැරීමට අවශ්‍ය අවකාශයක්. දුක්බර නවකතාවක්, සංවේදී කවියක්, බලවත් නාට්‍යයක් අපට උපකාරී වෙනවා ශෝකය, ප්‍රීතිය හෝ ආදරය ජීවිතය තුළ සකසා ගැනීමට. එනම් සාහිත්‍යය, අපගේ භාෂාව සහ චින්තනය පොහොසත් කරනවා. එය අදහස් ලස්සනට ප්‍රකාශ කරන්නේ කෙසේ ද? විවේචනාත්මක ව සිතන්නේ කෙසේ ද? සහ ඵලදායි ලෙස සන්නිවේදනය කරන්නේ කෙසේ ද? යන්න අපට උගන්වන මාධ්‍යයක්.

සාහිත්‍යය අවශ්‍ය වන්නේ මිනිසුන්ට එය දැනීමට, සිතීමට, පරිකල්පනය කිරීමට, සම්බන්ධ වීමට සහ වර්ධනය වීමට උපකාරී වන බැවින්. සාහිත්‍යය නොමැති ව ජීවිතය නොගැඹුරු වීමට තිබෙන ඉඩ වැඩියි. එවිට සංස්කෘතිය දුර්වල වන අතර සහසංවේදනය මිය යනු ඇති.

සංවේදී පුරවැසියන් ගොඩනැගීමේදී සාහිත්‍යයේ කාර්යභාරය අතිමහත්. සාහිත්‍යය හුදු විනෝදාස්වාදයට වඩා වැඩි යමක්. එය මිනිස් අත්දැකීම්වල කැඩපතක් සහ විවිධ සමාජ වෙනස්කම්වලින් ඉදි කෙරෙන පාලමක්. කතන්දර, කවි, නවකතා සහ නාට්‍ය ඔස්සේ පාඨකයන් අන් අයගේ ජීවිතවලට ඇතුළු වී විවිධ දෘෂ්ටිකෝණවලින් ජීවිතය ගවේෂණය කිරීමට පොලඹවනවා. මේ ක්‍රියාවලිය සහාය වන්නේ මිනිසුන් ගැන අවබෝධ කර ගැනීමටත් ස්ව සංවේදනය පෝෂණය කිරීමටත් සදාචාරාත්මක, දයානුකම්පිත පුරවැසිභාවයේ පදනම ගොඩ නැගීමටත්.

සාහිත්‍යයේ හරය තුළ මිනිස් ජීවිතයේ වාර්තාවක් සම්මුඛ වෙනවා. එය හැඟීම්, අරගල සහ අභිලාෂ ග්‍රහණය කරගන්නේ කරුණු සහ සංඛ්‍යාවලට නොහැකි ආකාරයට. සාහිත්‍යය කියවන විට ඔවුන් අත්දැකීමක් නිරීක්ෂණය කරනවා පමණක් නොව ඔවුන් චරිත සමඟ එහි ජීවත් වෙනවා. මානව සංවේදනය ගොඩනැගෙන්නේ මෙහිදී.

කවියක්, නවකතාවක්, කෙටිකතාවක් තමන්ට වඩා බෙහෙවින් වෙනස් කෙනෙකුගේ සපත්තුවට පිවිසීමට පාඨකයන්ට ඉඩ සලසා දෙනවා. උදාහරණයක් ලෙස නියඟයට මුහුණදෙන ගොවියෙකු, කුසගින්නේ හඬා වැටෙන දරුවෙකු, යුද ගැටුමකින් පලා යන සරණාගතයෙකු ගැන කියවීමෙන් එබඳු ජීවිතයක් ගත කිරීමට සිදුවීමේදී සැබවින් ම හැඟෙන දේ උපකාරී වෙනවා පාඨකයන්ගේ අත්දැකීමට. සාහිත්‍යය යළි සිතන්නට පොළඹවමින් මේ අත්දැකීම්වල පුද්ගලික, චිත්තවේගීය මාන වෙත අප ව ඇද ගන්නවා. ආදරය, බිය, අහිමි වීම, බලාපොරොත්තුව සහ ප්‍රීතිය විශ්වීය හැඟීම්. මේවා ඒ ඒ කලාපවල සමාන ආකාරයෙන් වින්දනය වන්නේ නැහැ. එයට ඒ ඒ සන්දර්භයේ ස්වරූපය බලපානවා. එහෙත් සාහිත්‍යය අපට කියා දෙන්නේ මිනිසුන් සහ සංස්කෘතිය ඔස්සේ වෙනස් ලෙස ඒවා ප්‍රකාශ වන ආකාරය. විවිධ සන්දර්භ තුළ මේ හැඟීම් සමඟ සම්බන්ධ වීමෙන් පාඨකයන් අප සියල්ලන් එක්සත් කරන මනුෂ්‍යත්වයේ පොදු භාවයෙන් බැඳ තබනවා. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ හෝ පුරාණ ග්‍රීසියේ හෝ ලියා ඇති ශෝකය පිළිබඳ කවියක්, කාලය හා ස්ථානය පුරා අනුනාද වන්නේ එය විශ්වීය මිනිස් හැඟීමක් ස්පර්ශ කරන බැවින්.

සාහිත්‍යය ඉතිහාසයෙන් එන හඬ ආරක්ෂා කිරීමක් ද සිදු කරනවා. එසේ ම යුද්ධ, යටත්විජිතකරණය, නිදහස් අරගල, සමාජ ප්‍රතිසංස්කරණ අරගල වැනි ප්‍රධාන සිදුවීම් මිනිසුන් අත්විඳි ආකාරය පිළිබඳ අවබෝධයක් පාඨකයන්ට ලබා දෙනවා. ඒවා ඔවුන් සැබෑ ජීවිතයේදී අත්නොවිඳි දේවල්. එය හුදෙක් වර්තමානයට උපකාරී වන්නේ ඉතිහාසයේ කරුණු පමණක් නොව, ඒවා පිටුපස ඇති හැඟීම් සහ ජීවත් වූ යථාර්ථ තේරුම් ගැනීමටත්. උදාහරණයක් ලෙස යටත්විජිත සමයේ සකස් කරන ලද අරගල ගීත, මතක සටහන්, නවකතා සාමාන්‍ය ජනයාට පීඩනය හෝ බලාපොරොත්තුව හෝ දැනුණු ආකාරය හෙළි කරනවා. සංඛ්‍යාලේඛන 'යුද්ධයෙන් අවතැන් වූ දහස් ගණනක්' යැයි පැවසිය හැකි නමුත් නවකතාවකදී තම පවුලෙන් වෙන් වූ දරුවෙකුගේ හුදෙකලා කතාවක් කියවන්නා තුළ නිර්මාණය කරන්නේ වඩාත් ගැඹුරු මානව ප්‍රතිචාරයක්. සාහිත්‍යයෙන් තමන්ගෙන් වියුක්ත ගැටලු පුද්ගලික අත්දැකීම් බවට පරිවර්තනය කරමින් අනුකම්පාව සහ ඒ ඔස්සේ ක්‍රියාත්මක විමට පාඨකයා දිරිමත් කරනවා.

සාහිත්‍යයේ වඩාත් ම බලගතු කාර්යයක් වන්නේ විවිධ සමාජ බෙදීම් යා කරන පාලමක් ලෙස ක්‍රියාත්මක වීම. සාහිත්‍ය පරිශීලකයාට ඔවුන්ගේ ම සංස්කෘතික, සමාජීය, පෞද්ගලික සීමා ඉක්මවා යාමේ හැකියාව ඉන් ලැබෙනවා. කියවන විට අප වචන පරිහරණය කරනවා පමණක් නොව වෙනත් ලෝකයකට ඇතුළු වෙමින්, වෙනත් පුද්ගලයෙකුගේ දෑස් තුළින් දකිමින්, ඔවුන්ගේ අරගල, ප්‍රීතිය සහ වටිනාකම් විඳිනවා.

පාඨකයන් බොහෝ විට සාහිත්‍ය පරිශීලනයේදී තමන්ට සම්මුඛ වන චරිතවල ආලෝකයෙන් තමන්ගේ ම ජීවිත ගැන යළි මෙනෙහි කරමින් උත්සාහ කරන්නේ ඒ අනුව සිදුවීම් තේරුම් ගන්නට. මේ පරාවර්තනය ස්වයං දැනුවත්භාවය ගොඩනඟන අතර නිහතමානිකම කියා දෙනවා. පුද්ගලයෙකුගේ ජීවිතය බොහෝ සංකීර්ණ මිනිස් කතාවලින් එකක් පමණක් බව වටහා ගැනීමට උදව් කරනවා. තවත් කෙනෙකුගේ දෘෂ්ටිකෝණය ඔස්සේ 'ජීවත් වීමෙන්' පාඨකයන් තේරුම් ගැනීමට පටන් ගන්නේ තමන්ගේ ම ක්ෂණික යථාර්ථයෙන් ඔබ්බට මිනිස් ජීවිතවල සංකීර්ණත්වය.

සාහිත්‍යයේ වඩාත් ම බලගතු කාර්යයක් වන්නේ විවිධ සමාජ බෙදීම් යා කරන පාලමක් ලෙස ක්‍රියාත්මක වීම. සාහිත්‍ය පරිශීලකයාට ඔවුන්ගේ ම සංස්කෘතික, සමාජීය, පෞද්ගලික සීමා ඉක්මවා යාමේ හැකියාව ඉන් ලැබෙනවා. කියවන විට අප වචන පරිහරණය කරනවා පමණක් නොව වෙනත් ලෝකයකට ඇතුළු වෙමින්, වෙනත් පුද්ගලයෙකුගේ දෑස් තුළින් දකිමින්, ඔවුන්ගේ අරගල, ප්‍රීතිය සහ වටිනාකම් විඳිනවා. මේ ක්‍රියාවලිය උපකාරී වන්නේ සැබෑ ජීවිතයේ මිනිසුන් වෙන් කරන බාධක බිඳ දැමීමට. උදාහරණයක් ලෙස අන්‍ය සංස්කෘතියක් තේරුම් ගැනීමේදී සාහිත්‍ය ඔස්සේ එය කියවීමෙන් ඒ අවබෝධය ලබා ගන්නට පුළුවන්.

පාඨකයන්ට සංකීර්ණ චරිත හඳුන්වා දීමත් සාහිත්‍යයෙන් සිදු වන්නක්. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික ලිංගික ප්‍රජාව පිළිබඳ නවකතාවක් ඔවුන්ගේ මනුෂ්‍යත්වය සහ පෞද්ගලිකත්වය අවබෝධ කර දෙනවා. ඔවුන් සමාජයේ ආන්තිකකරණයට ලක්වී ඇති ආකාරය, සමාජය ඔවුන්ට සලකන ආකාරය, පරිභව කරන ආකාරය ගැන අවබෝධයක් ලබා ගන්නට පුළුවන්. නැතිනම් සිදුවන්නේ මාධ්‍ය හෝ සමාජ පක්ෂග්‍රාහිත්වය

හෝ විසින් නිර්මාණය කරන ලද ඒකාකෘතිවලට යට වෙමින් කවුරුන් හෝ අප මත බලෙන් පටවා ඇති ස්වරූපයෙන් මිනිසුන් තේරුම් ගැනීමට අපට සිදු වීම. එවැනි වූ සමාජ සංස්කෘතික ඒකාකෘති බිඳ දැමූ විට වර්ධනය වන්නේ සංවේදනය සහ අවබෝධය. සාහිත්‍යයට එය මනාව සිදු කළ හැකියි. විවිධ සංස්කෘති මත පදනම් වූ සාහිත්‍ය කෘති කියවීම ඔවුන්ට නුහුරු සම්ප්‍රදාය, විශ්වාස සහ ජීවන රටා අගය කිරීමට නව ඇසක් ජනිත කර දෙනවා. මෙය 'අනෙකා' කෙරෙහි ඇති බිය අඩු කරන අතර ගෞරවය ප්‍රවර්ධනය කරනවා.

සාහිත්‍යය බොහෝ විට ප්‍රධාන ධාරාවේ ඉතිහාසයෙන් බැහැර කරන ලද කාන්තාවන්ගේ, වාර්ගික සුළුතරයන්ගේ, කම්කරුවන්ගේ, පීඩිත කණ්ඩායම්වල හඬ අකුරු අතරට එකතු කර එයට හඬක් ඇති කරනවා. එබඳු වූ කථා කියවන විට සමාජය ඔවුන් ව 'පිටස්තරයන්' ලෙස නොව සමාන ගෞරවයක් ඇති සෙසු මිනිසුන් ලෙස සැලකීමටයි පුරුදු වන්නේ. උදාහරණයක් ලෙස මාර්ටින් වික්‍රමසිංහගේ නවකතා ග්‍රාමීය ජීවිතය සහ ජන සංස්කෘතිය නිරූපණය කර, සාමාන්‍ය ජනතාවගේ අත්දැකීම් ජාතික විඥානය දක්වා පුළුල් ව ඔසවා තැබුවා. අනෙක් අතට විවිධ කණ්ඩායම් සාහිත්‍යය කියවා ඒවා ඔස්සේ සාකච්ඡා කරන විට එය අනන්‍යතාව, යුක්තිය සහ අයත් වීම පිළිබඳ සංවාදය සඳහා අවකාශයක් බවට පෙරළෙනවා. මේ සංවාද උපකාර කරන්නේ සමාජවලට බෙදීම් හකුළුවා, සංහිඳියාව කරා ගමන් කිරීමට. ශ්‍රී ලංකාවේ පශ්චාත් ගැටුම් සාහිත්‍යයට (දෙමළ සහ සිංහල) හැකියාව තිබෙනවා ප්‍රජාවට එකිනෙකාගේ වේදනාව සහ ඉදිරි දැක්ම තේරුම් ගැනීමට උපකාර කරන්නටත්.

චිත්තවේගීය බුද්ධිය වර්ධනය කිරීම ද සාහිත්‍යයෙන් සිදු වන්නක්. චිත්තවේගීය බුද්ධිය (EI) යනු අපගේ ම හැඟීම් හඳුනා ගැනීමට, තේරුම් ගැනීමට සහ කළමනාකරණයට ඇති හැකියාව. අන් අයගේ හැඟීම් හඳුනා ගැනීමට, තේරුම් ගැනීමට සහ ඒවාට සුදුසු පරිදි ප්‍රතිචාර දැක්වීමට ද එයින් හැකියාව තිබෙනවා. සාහිත්‍යය යනු මේ හැකියාව පෝෂණය කිරීම සඳහා ප්‍රබල මෙවලමක්. මන්ද එය පාඨකයන් චරිත, ආඛ්‍යාන සහ ගැටුම් ඔස්සේ චිත්තවේගීය තත්ත්වයට පත් කරනවා. පාඨකයන් කතාවක් අනුගමනය කරන විට ඔවුන්ට ප්‍රීතිය, ශෝකය, ඊර්ෂ්‍යාව, බිය, බලාපොරොත්තුව යනාදි පුළුල් පරාසයක හැඟීම් අත්විඳින චරිත හමු වන්නට පුළුවන්. චරිතවල මේ හැඟීම් හඳුනා ගැනීමෙන් පාඨකයන් ව පුරුදු කරනවා තමන් තුළ සහ අන් අය තුළ ඒවා වඩාත් පැහැදිලි ව ලේබල් කිරීමට සහ හඳුනා ගැනීමට.

පාඨකයන් චරිතයක මනසට 'පිවිසෙන' විට ඔවුන් වෙනත් දෘෂ්ටිකෝණයකින් තත්ත්ව දැකීමට ඉගෙන ගන්නවා. චිත්තවේගීය බුද්ධියට කේන්ද්‍රීය වන මේ කුසලතාව පුහුණු කරන්නේ ප්‍රතික්‍රියා කිරීමට පෙර අන් අයගේ හැඟීම් සලකා බැලීමට. සාහිත්‍යය යනු පාඨකයන්ට ඔවුන්ගේ චිත්තවේගීය ප්‍රතිචාර ගවේෂණය කිරීමට, පුහුණු වීමට පිරිපහදු කළ හැකි 'ආරක්ෂිත චිත්තවේගීය රසායනාගාරයක්' වැනියි. කාලයත් සමඟ මෙය සංවේදී සහ සමාජීය වශයෙන් වග කිව යුතු පුරවැසිභාවය සඳහා අවශ්‍ය චිත්තවේගීය බුද්ධිය ගොඩනගා දෙනවා. සාහිත්‍යය තමන්ගේ ම සහ අන් අයගේ හැඟීම් කෙරෙහි සංවේදීතාව තියුණු කරන මෙවලමක්. චරිතයක දුක හෝ ප්‍රීතිය හඳුනා ගැනීම පාඨකයන්ට සැබෑ මිනිසුන්ගේ හැඟීම් පිළිගැනීමට, වලංගු කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට උගන්වනවා. බහුත්වවාදී, ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල පුරවැසියන් සඳහා එවැනි චිත්තවේගීය සාක්ෂරතාව අත්‍යවශ්‍ය කාරණයක්. මන්ද එය එවැනි සමාජය ස්ථාවරභාවයට ඍජු ව ම බලපානවා.

සාහිත්‍යය බොහෝ විට පාඨකයන් ව පත් කරනවා හරි වැරැද්ද, යුක්තිය සහ අයුක්තිය, යුතුකම සහ වගකීම ගැන සිතිය යුතු තත්ත්වයට. මෙහිදී සදාචාරාත්මක උභතෝකෝටික ඉදිරිපත් කිරීම දකින්නට පුළුවන්. බොහෝ සාහිත්‍ය කෘතිවලින් දුෂ්කර සදාචාරාත්මක තේරීම්වලට මුහුණදෙන චරිත හඳුන්වා දෙන විට පාඨකයන්ට තමන්ගෙන් ම අසන්නට ආරාධනා කෙරෙනවා "මෙවැනි තත්ත්වයක් ඇතිවුණේනම් මම කුමක් කරනු ඇත් ද?" යනුවෙන්. මේ ක්‍රියාවලිය විවේචනාත්මක චින්තනය සහ සදාචාරාත්මක දැනුවත්භාවය නිරතුරු ව ශක්තිමත් කරනවා. දරිද්‍රතාව, වෙනස්කොට සැලකීම, සමාජ දේශපාලන පීඩනය වැනි සමාජ අසාධාරණ හෙළිදරව් කර පාඨකයන්ට ඒ කෙරෙහි අනුකම්පා කිරීමට පමණක් නොව සාහිත්‍යය ඔවුන් දිරිමත් කරනවා සැබෑ ජීවිතයේ සාධාරණත්වය සහ එය උදාකර ගැනීම සඳහා සටන් කිරීමට.

සාහිත්‍යය විසින් පෙළපොතක් මෙන් සදාචාරය දේශනා කරනු ලබන්නේ නැහැ. එය මිනිස් කතාන්දර ඔස්සේ සදාචාරාත්මක අරගල පෙන්වා දෙනවා. පාඨකයන්ට ගැඹුරින් සිතීමට, සහනුකම්පාව දැනීමට සහ ඔවුන්ගේ ම ජීවිත තුළ සදාචාරාත්මක පරිවර්තනයක යෙදීමට උපකාරී කරනවා. එය පුරවැසිභාවය සහ මනුෂ්‍යත්වය පිළිබඳ නිහඬ ගුරුවරයෙකු බවට පත්වන්නේ එලෙසින්.

සමාජ හෘදය සාක්ෂිය පිබිදීම ද සාහිත්‍යයෙන් සිදු වන සහකම්පනීය පුරවැසියෙකු බිහිකරගැනීමේ තීරණාත්මක කාර්යයක්. අයුක්තිය පිළිබිඹු කරමින් දරිද්‍රතාව, වර්ගවාදය, දූෂණය, යුද්ධය, ස්ත්‍රී පුරුෂ අසමානතාව යන්න දියුණු සමාජයක් පිටුදැකිය යුතු කාරණා බව පාඨකයන්ට කියා දෙනවා. එය ක්‍රියාවට නැංවීම සඳහා පුරවැසි කැඳවීමක් බවට වර්ධනය වන්නට පුළුවන්. එසේ ම ප්‍රතිසංස්කරණ සඳහා වන ව්‍යාපාරවලට සහභාගි වීමට එය පුරවැසියන් දිරිමත් කරනවා මෙන් ම සක්‍රීය දැනුවත් පුරවැසියෙක් ගොඩනගනවා. එක් පසෙකින් සාහිත්‍යය යනු සදාචාරාත්මක මාලිමාවක්. එය සමාජ අසාධාරණය පිළිබඳ දැනුවත්භාවය අවදි කර, හැඟීම් අවුස්සා, පාඨකයන් නිරීක්ෂකයන් ලෙස පමණක් නොව ක්‍රියාශීලී, වගකිවයුතු පුරවැසියන් ලෙස සිවිල් ජීවිතයේ නිරත වීමට පොලඹවාලනවා.

සාහිත්‍යය ඔස්සේ 'වෙනත් කෙනෙකුගේ සපත්තු පැලඳ ඇවිද යාමට" ඉඩ දීමෙන් වර්ධනය කරන්නේ ඔහුගේ හෝ ඇයගේ හෝ සංවේදනය. එසේ ම සාහිත්‍යය අගය කරන සමාජයක වෙනස්කම්වලින් එකමුතුකමක් ගොඩ නංවන, මානව ගරුත්වය තේරුම් ගත හැකි සහ පොදු ජීවිතයේ කරුණාවෙන් ක්‍රියා කළ හැකි පුරවැසියන් පෝෂණය කරන බව මෙහිදී අවධාරණය කළ යුත්තක්.

රාජ්‍ය සේවා තරග විභාග අත්වැල

කාර්යාල කළමනාකරණය හා ලිපිගොනුකරණය 1

ඉදිරිපත් කිරීම

නාලක දිසානායක

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු), මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය හා අධ්‍යක්ෂ (පාලන) වැ.බ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

රාජ්‍ය සේවයේ ඒ ඒ ආයතන වෙනුවෙන් අනන්‍ය වූ අරමුණු, කාර්ය පවතී. කුමන කාර්යභාරයක් පැවරුණ ද එම කාර්ය මනාව කරගෙන යාමටනම් මනා වූ කාර්යාල කළමනාකරණ ක්‍රමවේද, නිසි ආයතනික කාර්ය පටිපාටි අනුගමනය කිරීම ඉතා වැදගත් වේ. මෙම ලිපියේ අරමුණ ඉතා සංක්ෂිප්ත ව කාර්යාල කළමනාකරණය හා ආයතනික කාර්ය පටිපාටි පිළිබඳ ව සාකච්ඡා කිරීම ය.

පෙනී හැකට් නම් කළමනාකරණවේදියාට අනුව කාර්යාලයක් යනු තොරතුරු රැස් කරන, වාර්තා කරන, ගබඩා කරන හා අවශ්‍ය අවස්ථාවලදී වෙනත් ස්ථාන කරා යවන ස්ථානයකි. පාසලක ද මෙම කාර්ය පවතී.

කාර්යාලයක කාර්ය පහසු කර ගැනීම, නිවැරදි ව එම කාර්ය කරගෙන යාම, ද්විකරණ හා බහුකරණ දෝෂ වැළැක්වීම, ඵලදායිතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, මහජන සබඳතාව මනාව පවත්වාගෙන යාම ආදී බොහෝ කාර්ය පවත්වාගෙන යාම සඳහා විවිධ ක්‍රමවේද අනුගමනය කෙරේ. ඒවා **කාර්යාල ක්‍රම** ලෙස සරල ව හැඳින්විය හැකි ය. ටෙරි ජෝර්ජ් නම් කළමනාකරණවේදියාට අනුව කාර්යාල ක්‍රමයක් යනු, කාර්යාලයක අරමුණක් හෝ අරමුණු කිහිපයක් හෝ කරා ළඟාවීම පිණිස කලින් සැලසුම් කළ, එකිනෙකට බැඳුණු හා එකිනෙක මත යැපෙන කාර්ය අවස්ථා එකකින් හෝ කිහිපයකින් හෝ සමන්විත ක්‍රියා පද්ධතියකි.

ඒ අනුව පොදුවේ කාර්යාල තුළ තැපැල, ලිපිගොනුකරණය, ආකෘති පත්‍ර, මෙහෙයුම් අත්පොත්, ලිපි සංදේශ ක්‍රම, ලේඛන කළමනාකරණය ආදී විවිධ කාර්යාල ක්‍රම ක්‍රියාත්මක වේ. ඒවා මනා ලෙස කළමනාකරණය කරගෙන යාමෙන් ආයතනයේ අරමුණු ඉටුකර ගනිමින් නිවැරදි ව හා ඵලදායී සේවා ලබා දීමට හැකියාව ලැබේ.

<u>ලිපිගොනුකරණය කාර්යාලයකට වැදගත් වන ආකාරය</u>

ඕනෑ ම කාර්යාලයක ලිපි ගනුදෙනු සඳහා යොදා ගන්නා පොදු මාධ්‍යය වන්නේ ලිපියයි. ඒ නිසා ම කාර්යාල කළමනාකරණයේ ඉතා වැදගත් ම ස්ථානයක් ලිපිගොනුකරණය සඳහා වෙන් වී ඇත.

ඔබ ඉතා හොඳින් දන්නා පරිදි ලිපිගොනුවක් යනු යම්කිසි ලියකියවිලි කිහිපයක එකතුවකි. ඒ සම්බන්ධ ව ද විවිධ කළමනාකරණවේදීන් ලබාදුන් නිර්වචන තිබේ. ඒ අතුරින් ලිපිගොනුවක් යනු කිසියම් විෂයයක් හෝ පුද්ගලයෙක් හෝ සංවිධානයක් හෝ සම්බන්ධයෙන් කාල ක්‍රමානුකූල ව ගොනු කරන ලද ලියවිලි සමූහයක් ලෙස ලිපිගොනුව යන්න අර්ථ දැක් වූ ජෙෆ්රි වයට්පොඩ් නමැති කළමනාකරණවේදියාගේ අර්ථ නිරූපණය ලිපිගොනුව යන්න අවබෝධ කර ගැනීම සඳහා යොදා ගත හැකි හොඳ ම අර්ථ නිරූපණයයි. මෙහිදී කාලක්‍රමානුකූල ව යන වචනයෙන් ආයතනයෙන් පිටතට යැවෙන ලිපිවල පිටපත් ගොනු කරන්නේනම් ඒවා අත්සන් කළ දින අනුපිළිවෙළට ගොනු කිරීමත් ආයතනයට පිටතින් ලැබෙන ලිපි ගොනු කරන්නේනම් එම ලිපි ආයතනයට ලද පසු දින මුද්‍රාව යෙදූ දිනය අනුව එම දින අනුපිළිවෙළට ගොනු කිරීමත් අදහස් කෙරේ. මෙහිදී කාර්යාල කළමනාකරණයේ දී ලැබෙන ලිපි ආයතනයට අදාළ බව, ඒ ලිපි ලද දිනය ආදිය තහවුරු කිරීම සඳහා ලැබෙන සෑම ලිපියක ම මුහුණතේ ඉහළ කෙළවරක (දකුණු පසට වීම වඩාත් යෝග්‍ය වේ.) දින මුද්‍රාව යෙදීම පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු ය. දින මුද්‍රාව යෙදීම ද මනා ලෙස කාර්යාල ක්‍රම අනුගමනය කරන කාර්යාලයක ලක්ෂණයකි.

මේ අනුව ලිපිගොනුකරණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ අවශ්‍ය විටදී යම් කරුණකට අදාළ ලියකියවිලි හැකි ඉක්මනින් හා පහසුවෙන් සොයා ගැනීමට හැකිවන පරිදි ගොනුකොට තබා ගැනීමයි.

කාර්යාලයකට ගැළපෙන ලිපිගොනු ක්‍රමවේදයක් තෝරා ගැනීමේදී විශේෂයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. එනම්,

- ගොනු කරන ලිපිවල ස්වභාවය
- ගොනු කරන ලිපිවල වැදගත්කම
- ලිපිගොනු පවත්වාගෙන යන ස්ථානයේ ස්වරූපය

- ලිපිගොනු පවත්වාගෙන යන කාල සීමාව
- ලිපිගොනු පරිහරණය කරන ස්වරූපය

ආදිය ඉන් කිහිපයකි.

එමෙන් ම ලිපිගොනුකරණය පිළිබඳ සාකච්ඡා කිරීමේදී හොඳ ලිපිගොනුවක තිබිය යුතු ගුණාංග දැනගෙන සිටීම ද වැදගත් වේ. ඇතැම් විට රජයේ කාර්යාලවල ලිපිගොනු අනවශ්‍ය පරිදි විශාල වී, භාවිතයට අපහසු වී, කාර්ය පහසු වනවා වෙනුවට විවිධ අපහසුතාවලට ලක්වීමට සිදුවන අයුරු ඔබ ද දැක ඇතිවාට සැක නැත. ඒ නිසා ම,

- සංක්ෂිප්ත බව හෙවත් අවශ්‍ය පමණට පමණක් ලිපිගොනුව විශාල වීම
- ආරක්ෂාව
- සරල බව
- නම්‍යශීලි බව හා
- පහසුවෙන් සොයා ගැනීමට ඇති හැකියාව

ආදී ගුණාංග හොඳ ලිපිගොනුවක තිබිය යුතු ය. එවිට මෙම සංකල්පයේ පරමාර්ථය මනා ලෙස සාක්ෂාත් වනු නියත ය.

නිවැරදි ව ලිපිගොනු පවත්වාගෙන යාමෙන් කාර්යාලයකට ලැබෙන වාසි/ප්‍රයෝජන ද රාශියක් ඇත.

- ලියකියවිලි හොඳින් ආරක්ෂා වීම
- අවශ්‍ය තොරතුරු, අවශ්‍ය වේලාවට, අවශ්‍ය පරිදි ලබා ගැනීමට අවස්ථාව ලැබීම
- ලිපිගොනු ඔබමොබ ගෙනයාම පහසු වීම
- යවන ලිපි, ලැබෙන ලිපි පිළිබඳ හොඳ පාලනයක් පවත්වා ගෙන යාමට උපකාරී වීම
- විෂයය භාර නිලධරයන්ගේ, අධීක්ෂණ නිලධරයන්ගේ මෙන් ම සේවාලාභීන්ගේ ද කාලය ඉතිරිවීම
- වඩාත් ඵලදායී කාර්යක්ෂම සේවාවක් ලබා දීමට උපකාරී වීම

ආදී වාසි ඒ අතුරින් ප්‍රධාන වේ.

කාර්යාල කළමනාකරණයේදී ලිපිගොනු විවෘත කිරීම, අංක කිරීම හා නම් කිරීම, ලිපිගොනුවක ලිපි කොඩි කිරීම ආදී කරුණු කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත් වේ.

ලිපිගොනුවක් විවෘත කිරීම

කාර්යාලයක කාර්යාලයීය කටයුත්තක් වෙනුවෙන් ලිපිගොනුවක් විවෘත කිරීමේදී ප්‍රධාන වශයෙන් පහත ක්‍රියා එහි අන්තර්ගත වේ. එනම්,

ගැළපෙන ගොනු කවරයක් තෝරා ගැනීම

මෙය එම ගොනුව තුළ ගොනු කරන ලිපිවල ස්වරූපය, එය පවත්වාගෙන යන කාල සීමාව (උදා: පෞද්ගලික ලිපිගොනුවක්නම් සාපේක්ෂ ව වැඩි කාලයක් පවත්වාගෙන යා යුතු නිතර පරිහරණය වන ගොනුවකි.) ආදී කරුණු මත පදනම් වේ.

ගොනුව නම් කිරීම හා අංක කිරීම

මනා සේ කාර්යාල ක්‍රමවේද අනුගමනය කරන කාර්යාලයක ඒ ඒ විෂය භාර නිලධරයා භාරයේ, පාසලක් ගතහොත් පාසලේ කාර්යාලය තුළ පවතින සෑම ලිපිගොනුවක් පිළිබඳ ව සටහන් වන ලේඛනයක් පවත්වා ගෙන යා යුතු ය. 'ලිපිගොනු ලේඛනය' ලෙස හඳුන්වන මෙම ලේඛනය සඳහා පොදු 31 නැමැති රජයේ පොදු ලේඛනය ද භාවිත කළ හැකි ය. එහි සඳහන් අංක කිරීමේ ක්‍රමවේදය භාවිත කරමින් ලිපිගොනුව අංක කළ යුතු ය. ලිපිගොනු අංකයෙන් එම ගොනුව කුමන ආයතනයක, කුමන අංශයක, කුමන විෂයයකට අදාළ, කී වැනි ගොනුව ද ආදිය හඳුනාගත හැකිනම් එය ඵලදායී වේ. එමෙන් ම ලිපිගොනුවට නමක් ලබා දීම ද වැදගත් වේ. ලිපිගොනු නම් කිරීම ද ඒ ඒ විෂයයට ගැළපෙන පරිදි සිදු කළ යුතු ය.

ලිපිගොනුවට ලියකියවිලි ඇමිණීම හා ලියවිලි අංක කිරීම

ලිපිගොනුවේ බාහිර ස්වරූපය පෙර කී පරිදි සාදා ගත් පසු ඊළඟ වැදගත් කරුණ, ලද ලියකියවිලි කාලානුරූප ව ඇමිණීමයි. ලිපිගොනුවට ලියවිලි ඇමිණීමේදී ලිපිවල අන්තර්ගතයට හානියක් නොවන පරිදි ඡිද්‍රකයක් (Puncher) භාවිත කර ඇමිණීම සිදු කළ හැකි ය.

ලියවිලි ඇමුණූ පසු සෑම ලිපියක ම ඉහළ කෙළවරේ සාමාන්‍යයෙන් හින්දු අරාබි ඉලක්කම් භාවිත කරමින් ලියවිලි අංක කළ යුතු ය. ගොනුවේ අඛණ්ඩතාවට ද නිවැරදි ව ලියවිලි අංක කිරීම ඉතා වැදගත් වේ.

ලිපිගොනු කාර්යවලදී ගොනුව තුළ ඇති ඇතැම් ලියවිලිවලට ඉක්මන් අවධානය යොමු කිරීම අවශ්‍ය වූ විට එම ලිපි අඩංගු ලිපි කොඩි කිරීම, එනම් කුඩා පටියක්/තීරුවක් ඇලවීම හෝ අල්පෙනෙත්තක් භාවිතයෙන් ඇමිණීම හෝ සිදු කෙරේ. ගොනුවේ පහසු පරිහරණය උදෙසා ලිපි කිහිපයක් කොඩි කරන විටෙක ඒවා වම් පස සිට දකුණු පසට කොඩි කිරීම වඩාත් සුදුසු ක්‍රමවේදය වේ.

ලිපිගොනුවක ලිපිවලට අවධානය යොමු කිරීමේදී ඒ ඒ ලිපි කොඩි කරන ආකාරයට ම ඇතැම් විට ලිපිගොනු කිහිපයක් අතුරින් මාණ්ඩලික නිලධරයකුගේ ඉක්මන් අවධානය යොමු කළ යුතු ගොනුවක් වේනම්, ඒ ගොනුවට සුදුසු කොඩියක් යොදා ඉදිරිපත් කිරීම ද සාමාන්‍ය කරුණකි. 'වහා ම', 'අද ම', 'වැදගත්', 'නොපමාව' ආදී 'ප්‍රමුඛතා කොඩි' ඔබ ද දැක ඇතිවාට සැක නැත. මෙවැනි ප්‍රමුඛතා කොඩියක් යම් ගොනුවකට යෙදීමෙන් බලාපොරොත්තු වන්නේ ඒ අරමුණ වෙනුවෙන් ඒ ගොනුවට ඉක්මන් අවධානය යොමු කිරීම ය. එම අරමුණ වඩාත් ඵලදායී වීමටනම් ලිපිගොනුවකට යොදන ප්‍රමුඛතා කොඩි, ලිපිගොනු කවරයේ පහළින් දකුණු පසට වන සේ යෙදීම වඩාත් පිළිගත් හා ඵලදයී කාර්යාල ක්‍රමවේදය වේ.

ඉතිරි කොටස ලබන කලාපයේ.....................

ක්‍රීඩාව, ජාතික ප්‍රමුඛතා හා ප්‍රතිපත්තිය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
අනෝමා රත්නායක

ප්‍රතිපත්තිය යනු ඕනෑ ම ක්ෂේත්‍රයක ස්ථාවර, සාධාරණ සහ ඵලදායී තීරණ ගැනීමට උපකාරී වන නීති හෝ මාර්ගෝපදේශ මාලාවක්. ප්‍රතිපත්තියක් නොමැති වූ විට සිදු වනු ඇත්තේ ව්‍යාකූලත්වය, වැරදි කළමනාකරණය සහ අසාධාරණ භාවිතාවන්. එය දුර්වල පාලනයකට මෙන් ම ක්ෂේත්‍රයේ බිඳවැටීමට හේතු වන්නක්. ක්‍රීඩාවේදී ප්‍රතිපත්ති සංවර්ධනයෙන් සහභාගිත්වයට, ආරක්ෂාව සහතික කිරීමට, සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීමට සහ සදාචාරාත්මක ප්‍රමිති පවත්වා ගැනීමට හැකි වෙනවා. එය ක්‍රීඩා සංවිධානය කරන ප්‍රතිපත්ති සම්පාදනයට, අරමුදල් සපයන සහ පාලනය කරන ආකාරය හැඩගැස්වීමට උපකාරී වීමත් ඉතා වැදගත්.

ක්‍රීඩා ප්‍රතිපත්තිය පිළිබඳ සංකල්පය අලුත් නැහැ. පුරාණ ශ්‍රී ලංකාවේ පාලකයන් උත්සව අතරතුර මල්ලවපොර, දුනු ශිල්පය සහ අශ්ව රථ ධාවන තරග වැනි විවිධ ක්‍රියාකාරකම්වලින් සංවිධානාත්මක ක්‍රීඩා දිරිමත් කළා. එකමුතුකම, ශාරීරික ශක්තිය සහ සමාජ සමගිය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රීඩාව භාවිත කළා. මේ මුල් ප්‍රතිපත්ති භාවිත ආකාර අවිධිමත් වුවත් ක්‍රීඩාව ප්‍රජාවේ සහ ජාතික අනන්‍යතාවේ කොටසක් ලෙස අගය කළ ආකාරය නායකයන් පෙන්නුම් කළා. කාලයත් සමඟ ක්‍රීඩා ප්‍රතිපත්තිය පරිණාමය වුණේ විධිමත් ව්‍යුහ බවට. විශේෂයෙන් නූතන පාලනය සහ ජාත්‍යන්තර තරගවල නැගීමත් සමඟ අද ක්‍රීඩා ප්‍රතිපත්ති ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සංවර්ධනය හැඩගැස්වීමේදී, බිම් මට්ටමේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමේදී සහ අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රජාව දිරිගැන්වීම සහ සංචාරක ව්‍යාපාරය සමඟ ක්‍රීඩාව ඒකාබද්ධ කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා. එය ජාතියක ප්‍රමුඛතා සහ අභිලාෂ පිළිබිඹු කරන අතර සමාජ ප්‍රගතිය, එකමුතුකම සහ ගෝලීය තරගකාරිත්වය සඳහා අත්‍යවශ්‍ය වී තිබෙන්නක්.

පුරාණයේ ක්‍රීඩා ප්‍රතිපත්ති සකස් කිරීමේ සංකල්පීය රාමු සකස් කර ඇති බවට බොහෝ නිදර්ශන තිබෙනවා. එය ක්‍රීඩාව ගෝලීය වශයෙන් සහ කලාපීය වශයෙන් සංකල්පනය කරන, ක්‍රියාත්මක කරන සහ පාලනය කරන ආකාරය අවබෝධ කර ගැනීමට සපයන්නේ පූර්වාදර්ශ. නූතන ඔලිම්පික් ක්‍රීඩාවේ නිර්මාතෘ පියරේ ද කුබර්ටීන් (Pierre de Coubertin) අධ්‍යාපනය සහ සංස්කෘතික හුවමාරුව සඳහා ක්‍රීඩාව අවධාරණය කළ අතර ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව ඔලිම්පික් ප්‍රඥප්තියෙන් (Olympic Charter) ක්‍රීඩාවේ ජාත්‍යන්තර ක්‍රීඩා ප්‍රතිපත්ති සකස් කිරීමට පසුබිම සකසා තිබෙනවා. Barrie Houlihan, Iain Lindsey, Vassil Girginov, Simon Shibli, Deborah Agnew and Lisa Kidd and Richard Giulianott වැනි ශාස්ත්‍රඥයන් රාජ්‍ය සහභාගිත්වය, පාලනය සහ ප්‍රතිපත්ති ක්‍රියාවලි විශ්ලේෂණය කරමින් ක්‍රීඩා ප්‍රතිපත්ති පදනම් ආකෘති සංවර්ධනය කළා. International Olympic Committee (IOC), United Nations Educational, Scientific and Cultural Organization (UNESCO), World Anti-Doping Agency (WADA) International Paralympic Committee (IPC), Sport Accord and International Federations, Australian Institute of Sport (AIS), Sport England වැනි ජාත්‍යන්තර සංවිධාන දිගුකාලීන සහ කල්පවතින ප්‍රමිති සකස් කරමින් ක්‍රීඩාවේ සහභාගිත්වය, විශිෂ්ටත්වය සහ සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කරමින් පුළුල් ප්‍රතිපත්ති ස්ථාපිත කළා. මේ අනුව ගෝලීය ක්‍රීඩා ප්‍රතිපත්තිවල එකමුතුකම සහ රාජ්‍ය තාන්ත්‍රිකභාවය සඳහා ක්‍රීඩා භාවිත කිරීමේ පුරාණ භාවිතයේ සිට නවීන, ව්‍යුහගත රාමු දක්වා පරිණාමය වී ඇති ආකාරය අවබෝධ කර ගන්නට පුළුවන්.

1948 නිදහස ලැබීමෙන් පසු සෑම රජයක් ම උත්සාහ කර තිබෙන්නේ ක්‍රීඩා ප්‍රතිපත්ති හඳුන්වා දීමට සහ ප්‍රතිසංස්කරණය කිරීමට. එහෙත් වසර 76කට පසුවත් ක්‍රීඩාවේ පසුගාමිත්වය පමණක් පිළිඹිබු කරන ආකාරයක් අවබෝධ වෙනවා. පත් වූ සෑම රජයක් ම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ, සම්මේලනවල සහ ප්‍රජාවගේ පුළුල් අවශ්‍යතා සපුරාලන බැවින් ම ඵලදායී ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට

අපොහොසත් වී තිබෙනවා. මේ වන විට විවිධ රජය යටතේ ශ්‍රී ලාංකේය ක්‍රීඩාවේ බොහෝ කෙටුම්පත් සහ සංශෝධන ඉදිරිපත් කර ඇතත් කිසිවක් තිරසර ක්‍රීඩා සංවර්ධනයක් ගෙන ඒමට සමත් ඒකාබද්ධ හා ක්‍රියාකාරී රාමුවක් බවට පරිවර්තනය වී නැහැ. එහි ප්‍රතිඵලය වී ඇත්තේ අපගේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ පරිපාලකයන් ගෝලීය ප්‍රවණතා සමඟ වේගයෙන් ගමන් කිරීමට අරගල කරන සහ අපගේ ක්‍රීඩා විභවය ඌන ලෙස භාවිත කරන බණ්ඩනය වූ පද්ධතියක ප්‍රවිශ්ට වීම.

මේ සඳහා බලපාන එක් ප්‍රධාන ගැටලුවක් වන්නේ දේශපාලනයේ සහ පෞද්ගලික න්‍යාය පත්‍රවල බලපෑම. ජාතික ප්‍රමුඛතා පිළිබිඹු කරන ප්‍රතිපත්තියක් සකස් කිරීම වෙනුවට තීරණ ගැනීම බොහෝ විට නැඹුරු වන්නේ දේශපාලන චක්‍රවලට හෝ පෞද්ගලික අවශ්‍යතාවලට. මෙය ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කරන නමුත් කිසි විටෙකත් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොවන රටාවක් නිර්මාණය කර තිබෙනවා. ව්‍යුහාත්මක දුර්වලතා ආමන්ත්‍රණය කරන්නේ නැහැ. පවතින ප්‍රතිපත්තිවල දුර්වලතා අධ්‍යයනය කර වාර්තා කරන විට පවා නිර්දේශ අර්ථවත් ප්‍රතිසංස්කරණ බවට පත් වන්නේ කලාතුරකින්. එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියකින් අප අපේක්ෂා කරන දේ සහ ලබා දෙන දේ අතර පරතරය පුළුල් වෙමින් පවතිනවා. අද ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව ප්‍රජාවේ අභිලාෂ, විවිධත්වය හෝ විභවය සම්පූර්ණයෙන් ම නියෝජනය කරන්නේ නැහැ. 1973 ක්‍රීඩා පනත (Sports Act, No. 25 of 1973) මත රඳා පැවතීම මේ තත්ත්වය තව තවත් තහවුරු කරනවා.

ක්‍රීඩාව සංවිධානය සහ නියාමනය සඳහා නීතිමය පදනමක් සපයන දැනට ක්‍රියාත්මක ක්‍රීඩා පනත අතීතයේදී ප්‍රගතිශීලී වුවත් එය තවදුරටත් වේගයෙන් වෙනස් වන ගෝලීය ක්‍රීඩා පරිසරයක ඉල්ලීම් සපුරාලන්නේ නැහැ. ලෝකය ඩිජිටල් තාක්ෂණය, ක්‍රීඩා කළමනාකරණය, ක්‍රීඩා විද්‍යාව ඇතුළත් පාලනය සහ වාණිජකරණය වැලඳගෙන තිබෙනවා. එහෙත් අපගේ ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක වන්නේ තවමත් යල් පැන ගිය මූලධර්ම සමඟ. මෙය තබා ඇත්තේ ශ්‍රී ලංකාව සමකාලීන අවශ්‍යතා සහ අවස්ථා පිළිබිඹු කිරීම සඳහා තම ප්‍රතිපත්ති නවීකරණය කළ රටවලට වඩා බොහෝ පසුපසින්. මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් දත්ත විශ්ලේෂණ, ඩිජිටල් වේදිකා සහ ඉහළ කාර්ය සාධන පද්ධතිවලින් මෙහෙයවන ලෝකයක තරග වදින නමුත් ඔවුන්ට දියුණු වීමට අවශ්‍ය ආධාරක ව්‍යුහ සැපයීමට අපගේ ප්‍රතිපත්ති අසමත් වී තිබෙනවා.

වත්මන් රජය ක්‍රීඩා පනතට සුළු සංශෝධන සිදු කිරීමෙන් යම්තාක්දුරකට ක්‍රීඩා සම්මේලන/සංගම්හි පාලනය යාවත්කාලීන කිරීමට උත්සාහ කර තිබෙනවා. ප්‍රධාන වශයෙන් ජාතික ක්‍රීඩා සම්මේලන නියාමනය සහ පරිපාලනය කෙරෙහි අවධානය යොමු කර තිබීම අවධාරණය කළ යුත්තක්. මේ සංශෝධන ඉදිරි පියවරක් වුවත් ඒවා ප්‍රමාණවත් නැහැ. සම්මේලන පමණක් ඉලක්ක

වත්මන් රජය ක්‍රීඩා පනතට සුළු සංශෝධන සිදු කිරීමෙන් යම්තාක්දුරකට ක්‍රීඩා සම්මේලන/සංගම්හි පාලනය යාවත්කාලීන කිරීමට උත්සාහ කර තිබෙනවා. ප්‍රධාන වශයෙන් ජාතික ක්‍රීඩා සම්මේලන නියාමනය සහ පරිපාලනය කෙරෙහි අවධානය යොමු කර තිබීම අවධාරණය කළ යුත්තක්. මේ සංශෝධන ඉදිරි පියවරක් වුවත් ඒවා ප්‍රමාණවත් නැහැ. සම්මේලන පමණක් ඉලක්ක කරගත් ප්‍රතිපත්තියක් ක්‍රීඩාව වඩා පුළුල් පරිසර පද්ධතියක් බව හඳුනා ගැනීමට අපොහොසත් වෙනවා.

කරගත් ප්‍රතිපත්තියක් ක්‍රීඩාව වඩා පුළුල් පරිසර පද්ධතියක් බව හඳුනා ගැනීමට අපොහොසත් වෙනවා. එයට පාසල්, විශ්ව විද්‍යාල, ප්‍රජාව, පෞද්ගලික කොටස්කරුවන්, අධ්‍යාපන, සෞඛ්‍ය අංශ සහ සංචාරක කර්මාන්තය පවා ඇතුළත් වනු ඇති. ප්‍රතිසංස්කරණවල විෂය පථය සීමා කිරීමෙන්, ශ්‍රී ලංකාව ගෝලීය හොඳම භාවිතයන් සමඟ පෙළගැස්වීමේදී තවත් පසුබෑමකට ලක්වීමේ අවදානමක් තිබෙනවා. අපට අවශ්‍ය වන්නේ මතුපිට මට්ටමේ සංශෝධන තවත් වටයක් පමණක් නොව, ක්‍රීඩාව රටේ සහ ප්‍රජාවට අවශ්‍ය කරන්නේ කුමක්ද? සහ ප්‍රතිපත්තිය මුළු ජාතියට ම සේවය කළ හැක්කේ කෙසේ ද? යන්න පිළිබඳ සම්පූර්ණ නැවත සිතා බැලීමක්.

එවැනි ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීමට කාලය ගතවනු ඇතත් එය නිවැරදි ව ලබා ගැනීමට කාලය ගැනීම, ඉටු කිරීමට අපොහොසත් වන තවත් ලේඛනයක් නිෂ්පාදනය කිරීමට ඉක්මන් වීමට වඩා බෙහෙවින් ඥානාන්විත කරුණක්. මේ ක්‍රියාවලිය ආරම්භ කළ යුත්තේ ශ්‍රී ලංකාවට සැබවින් ම අවශ්‍ය දේ, ප්‍රජාවට නොමැති දේ, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය දේ සහ ජාතික සංවර්ධනය සමඟ ක්‍රීඩාව ඒකාබද්ධ කිරීම සඳහා පවතින අවස්ථා මොනවා ද? යන්න පිළිබඳ ගැඹුරු අවබෝධයකින්. එවිට මේ අවබෝධය ක්‍රීඩා ලෝකයේ ගෝලීය දියුණුව සමඟ සමපාත වන ප්‍රතිපත්තියක් සඳහා පදනම සකසනු ඇති.

මේ නිසා නූතන ලෝකයේ ක්‍රීඩාව තරගකාරිත්වය ගැන පමණක් නොව එය සෞඛ්‍යය, අධ්‍යාපනය, තාක්ෂණය සහ ආර්ථික වර්ධනය වැනි බහුවිධ ක්ෂේත්‍ර පිළිබඳ ව අවධානය යොමු කළ යුතුයි. ඕස්ට්‍රේලියාව සහ එක්සත් රාජධානිය වැනි මේ සංකල්ප වැලඳගත් රටවල් ප්‍රභූ කාර්ය සාධනය සහ බිම් මට්ටමේ සහභාගිත්වය යන දෙක ම මෙහෙයවීම සඳහා ක්‍රීඩා ප්‍රතිපත්තිය භාවිතා කර තිබෙනවා. ශ්‍රී ලංකාව තමන්ගේ ම සංස්කෘතික හා සමාජ යථාර්ථ තුළ පදනම් වී සිටියදී මේ උදාහරණවලින් ඉගෙන ගත යුතුයි. සැබවින් ම නවීන ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සමස්ත ප්‍රජාව නියෝජනය කිරීම, ඇතුළත් කිරීම, පෝෂණය කිරීම මෙන් ම ඩිජිටල් පරිවර්තනය වැලඳ ගැනීම සහ තිරසර සංවර්ධනය සඳහා මාවතක් ගොඩනැගීම අරමුණු කළ යුතුයි.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ප්‍රතිපත්තියට සමාජය නඟා සිටුවීමේ හැකියාව තිබෙනවා. ඒ, එය පුද්ගලික අවශ්‍යතා හෝ දේශපාලන න්‍යාය පත්‍රවලට හෝ වඩා ජාතික අවශ්‍යතා සමඟ පෙළගැසෙන්නේ නම් පමණයි. පැහැදිලි සහ නිවැරදි පදනමක් සහිත වූ ප්‍රතිපත්තියකට ක්‍රීඩාවේ සාර්ථකත්වය සඳහා මාර්ග සිතියමක් සහ සමාජ සංවර්ධනය සඳහා මෙවලමක් ලෙස සේවය කළ හැකි වුවත් එසේ නොමැතිකම හෝ දුර්වලතාව හෝ විභවය සහ යථාර්ථය අතර පරතරය තවදුරටත් ශ්‍රී ලාංකේය ක්‍රීඩාවේ දියුණුව පසුබෑමට ලක් කරනු ඇති.

නවය නන්දා වීම

නුවන් කුමාර කටුගම්පල

දශක හයකට අධික කාලයක් මෙරට සංගීතය සහ ගුවන්විදුලිය වෙනුවෙන් ආචාර්ය නන්දා මාලනිය විසින් ඉටු කරන ලද මෙහෙවරට උත්තමාචාර පුද කිරීම, එතුමියට උපහාර ලෙස ගුවන්විදුලිය සංස්ථාවේ නව වැනි මැදිරිය 'නන්දා මාලිනී මැදිරිය' ලෙස නම්කොට ඇයගේ ඡායාරූපයක් නිරාවරණය කිරීම නොබෝද (අගෝස්තු 22) සිදුවුණා.

ප්‍රේමය, විරහව, මර්දනය, භීෂණය, සමාජ අසාධාරණය පිළිබඳ ගීත සුගායනයෙන් ජන හද මන අමතා හඬ අවදි කළ සංගීතවේදී ආචාර්ය නන්දා මාලනිය නමින් ශ්‍රී ලංකා ගුවන්විදුලිය සංස්ථාවේ නව වැනි මැදිරිය නම් කළේ අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරියගේ ප්‍රධානත්වයෙන් සහ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල්සෙනෙවි, නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය හංසක විජේමුණි, ශ්‍රී ලංකා ගුවන්විදුලිය සංස්ථාවේ සභාපති මහාචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර හා අධ්‍යක්ෂ ජනරාල් සුදත් රත්නවීර ඇතුළු නිලධාරීන් සහ කලා ක්ෂේත්‍රයට සම්බන්ධ ගිහි පැවිදි ප්‍රවීණයන් රැසක් එක් ව. අනගි ගී සුගැයුණු ආචාර්ය නන්දා මාලනියගේ හඬ මෙරටට සුවිශේෂ අස්පර්ශනීය සංස්කෘතික උරුමයක් (Intangible Cultural Heritage) බව අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය පැවසුවා.

තම සංගීත දිවියේ තිඹිරිගෙය ගුවන්විදුලිය බවත් ගුවන්විදුලිය තමා අමතක නොකළ බවත් තමාගේ 82 වැනි උපන්දිනය වෙනුවෙන් මෙබඳු ආචාර ප්‍රණාමයක් ලැබීම සතුටක් බවත් එහිදී ආචාර්ය නන්දා මාලනිය ප්‍රකාශ කළා. එහි 'ළමාපිටිය' වැඩසටහනේ ළමා ගායිකාවක ලෙස ඇය ඇරඹූ ගමන ශ්‍රී ලාංකේය ගායන ක්ෂේත්‍රයේ පරම්පරා කිහිපයක් ප්‍රබෝධනය කළ සුවිශේෂ මංසන්ධි ගණනාවක් පසු කර තිබෙනවා.

ඇය ගුවන්විදුලි සරල ගීතය, කැසට්පට ගීතය, විරෝධාකල්ප ගීතය, සිනමා ගීතය, ටෙලිනාට්‍ය ගීතය, පර්යේෂණාත්මක ගීතය ආදී විවිධ ගී ශානර යටතේ සිය නිර්මාණ ඉදිරිපත් කර ජනසම්මානයට සහ රාජ්‍ය සම්මානයට පාත්‍ර වූ ශිල්පිණියක්.

දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

Rs. 100/-